# වාර්ෂික වාර්තාව
# 2024



ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# වාර්ෂික වාර්තාව

# 2024

**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**

# පටුන


| | |
|---|---|
| දැක්ම හා මෙහෙවර | 03 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය | 04 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 07 |
| වැදගත් තොරතුරු | 09 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යභාරය | 10 |
| මෙහෙයුම් හා මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය | 12 |
| කර්මාන්ත පැතිකඩ | 44 |
| තිරසාර සංවර්ධන ඉලක්ක වෙත යොමු වීම | 60 |
| පෙර වසර 10 තුළ වැදගත් මූල්‍ය තොරතුරු | 62 |
| විගණිත මූල්‍ය ප්‍රකාශනය | 64 |
| විගණකාධිපති වාර්තාව | 111 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල | 114 |



තැපැල් ලිපිනය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය, 574, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
දුරකථනය : +94-11-2587814 | 2582121 | 2583687
විද්‍යුත් ලිපිනය : teaboard@pureceylontea.com
වෙබ් : www.srilankateaboard.lk
www.pureceylontea.com

# දැක්ම

ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකීය තේ
වඩාත් ආකර්ෂණීය පානය
බවට පත් කිරීම

# මෙහෙවර

කර්මාන්තයේ තිරසාර සංවර්ධනය මගින් රටට
ලැබෙන විදේශ විනිමය ඉපැයීම් වැඩි කර ගැනීම
සහ එමගින් වැවිලි කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ
ආර්ථික සංවර්ධනය සුරක්ෂිත කිරීම

# අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය

## i. අධ්‍යක්ෂ මණ්ඩලය

### සභාපති

**නිරාජ් ද මෙල් මයා,**
*සභාපති*
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ලේකම්

**ඊ.ජ්.ජේ.කේ. එදිරිසිංහ මයා**
*අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) (2024 ජන - පෙබ)*
**ආචාර්ය එම්.එස්. අනුරුද්ධ මයා**
*අධ්‍යක්ෂ ජනරාල් (2024 මාර් - දෙසැ)*
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### සාමාජිකයන්

**ඩබ්.එම්.ඩී.ටී. වික්‍රමසිංහ මිය**
*අතිරේක ලේකම් (තේ සංවර්ධන සහ වතු ප්‍රතිපත්ති)*
වැවිලි කර්මාන්ත හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යංශය

**ජේ.පී.පී. ලියනගේ මිය**
*අධ්‍යක්ෂ*
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව,මුදල් අමාත්‍යංශය

**ඩී.ජීවනාදන් මයා**
*අතිරේක ලේකම් (2024 ජන - ජුනි)*
**ඉනෝකා ද සිල්වා මිය**
*අධ්‍යක්ෂ ( 2024 අගෝ - දෙසැ)*
වෙළඳ අමාත්‍යංශය

**ඩී.පී. මහීපාල මයා**
*සභාපති*
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**සේනක අලවත්තේගම**
*සභාපති*
ලංකා වැවිලිකරුවන්ගේ සංගමය

**අනිල් කුක් මයා** *(2024 ජන - මැයි)*
**නරෙන් දඹවින්න මයා** *(2024 ජන - දෙසැ)*
*සභාපති*
කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය

**සංජය හේරත් මයා**
*සභාපති*
කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය

**ලයනල් හේරත් මයා**
*සභාපති*
ශ්‍රී ලංකා තේ කම්හල් හිමියන්ගේ සංගමය

**ජේ.එස්. පතිරණ මයා**
*සභාපති*
ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය

**ගනේෂ් දේවනායගම් මයා**
*සභාපති*
තේ අපනයනකරුවන්ගේ සංගමය

**ඩබ්ලිව්.එච්.එස්. සමරසේන මයා**
අමාත්‍ය නියෝජිත

### නිරීක්ෂක

**අනිල් අල්විස් මයා**
*අධ්‍යක්ෂ ජනරාල්*
පෝතටුව තේ කම්හල (පුද්ගලික) සමාගම

## ii. විගණන කමිටුව

### සභාපති

**ජේ.පී.පී. ලියනගේ මිය**
*අධ්‍යක්ෂ*
මුදල් අමාත්‍යංශය

### සාමාජිකයන්

**ඩබ්.එම්.ඩී.ටී. වික්‍රමසිංහ මිය**
*අතිරේක ලේකම් (තේ සංවර්ධන සහ වතු ප්‍රතිපත්ති)*
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යංශය

**ඩී. ජීවනාදන් මයා**
*අතිරේක ලේකම් (2024 ජන සිට අගෝ දක්වා)*
**ඉනෝකා ද අල්විස් මිය**
*අතිරේක ලේකම් (2024 අගෝ සිට දෙසැ දක්වා)*
වෙළඳ අමාත්‍යංශය

**ගනේෂ් දේවනායගම් මයා**
*සභාපති*
තේ අපනයනකරුවන්ගේ සංගමය

**සංජය හේරත් මයා**
*සභාපති*
ලංකා තේ වෙළඳුන්ගේ සංගමය

### නිරීක්ෂකයන්

**වී.ඩී. සීතා මිය**
*ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති*
ජාතික විගණන කාර්යාලය

**කේ. ඒ. සී. සමන්ත**
*ප්‍රධාන අභ්‍යන්තර විගණක*
වැවිලි අමාත්‍යංශය

### කැඳවුම්කරු

**කේ.පී. රණසිංහ මයා**
*අභ්‍යන්තර විගණක*
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## iii.ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව

**ඊ.ඒ.ජේ.කේ. එදිරිසිංහ මයා,** *අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ), (ජනවාරි 30 දක්වා)*

**ආචාර්ය එම්.එස්. අනුරුද්ධ මයා,** *අධ්‍යක්ෂ ජනරාල්, ( පෙබරවාරි 20 සිට දෙසැම්බර් 31 දක්වා)*

**ඊ.ඒ.ජේ.කේ. එදිරිසිංහ මයා,** *තේ කොමසාරිස්, (ජනවාරි 30 දක්වා)*

**කේ.ඒ.එම්.කේ. ජයවර්ධන මයා,** *තේ කොමසාරිස් (වැ.බ), (ජනවාරි 31 සිට ජූලි 1 දක්වා)*

**කේ.ඒ.එම්.කේ. ජයවර්ධන මයා,** *තේ කොමසාරිස් (ජූලි 2 සිට දෙසැම්බර් 31 දක්වා)*

**එච්.එල්. පවිත්‍රි පීරිස් මෙනවිය,** *අධ්‍යක්ෂ ප්‍රවර්ධන, (ජූලි 08 දක්වා)*

**එන්.එස්.පී. කරුණාරත්න මයා,** *අධ්‍යක්ෂ ප්‍රවර්ධන (ආවරණ රාජකාරී), (ජූලි 09 සිට සැප්තැම්බර් 10 දක්වා)*

**ඩබ්ලිව්.ජේ.එන්.යූ. ප්‍රියන්ත විමලසිරි මයා,** *අධ්‍යක්ෂ ප්‍රවර්ධන (ආවරණ රාජකාරී), (සැප්තැම්බර් 11 සිට දෙසැම්බර් 31 දක්වා)*

**තුෂාරා ගුරුගේ මිය,** *අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා)*

**පී.ඒ.හිරෝෂ් ජයංග මයා,** *අධ්‍යක්ෂ (මූල්‍ය), (සැප්තැම්බර් 20 දක්වා)*

# iv. ප්‍රවර්ධන හා අලෙවි කමිටුව

සිලෝන් තේ අලෙවිය දිරිගැන්වීමේ අරමුණින් පෞද්ගලික අංශය හා ප්‍රධාන විදේශීය ආනයනකරුවන් සමග සම්පව කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 3 දෙනෙකු සහ ලේකම් කාර්යාලයේ නිලධාරීන් 3 දෙනෙකුගෙන් සමන්විත ''ප්‍රවර්ධන සහ අලෙවිකරණ කමිටුව'' (PMC) 1986 අප්‍රේල් 21 වන දින පැවති 124 වන මණ්ඩල රැස්වීමේ දී පිහිටු වන ලද අතර, කමිටුව 2010 වසර දක්වා පැවතුන අතර අනතුරුව වරින් වර එහි සංයුතිය වෙනස් කර ඇත.

ගෝලීය වශයෙන් සිලෝන් තේ ප්‍රවර්ධනය සඳහා වාර්ෂිකව අය කරනු ලබන ප්‍රවර්ධන සහ අලෙවි බද්ද මත පදනම්ව, පස් අවුරුදු කාලයක් සඳහා (2012-2016) උපායමාර්ගික අලෙවිකරණ සැලැස්මක් සකස් කිරීමේ අරමුණින් වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ නියෝග අනුව ''ප්‍රවර්ධන සහ අලෙවි කමිටුව'' ප්‍රතිසංවිධානය කරන ලදී.

## සභාපති

**නිරාජ් ද මෙල් මයා,** *සභාපති*
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## සාමාජිකයන්

**ඩබ්ලිව්.එම්.ඩී.ටී. වික්‍රමසිංහ මිය,**
*අතිරේක ලේකම් (තේ සංවර්ධන සහ වතු ප්‍රතිපත්ති)*
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

**ආචාර්ය එස්.එම්. අනුරුද්ධ මයා,** *අධ්‍යක්ෂ ජනරාල්*
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**පවිත්‍රි පීරිස් මෙනවිය ,** *අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)*

**සංජය හේරත් මහතා,** *සභාපති*
කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය

**ටයිබ් අක්බරලි මයා,** *කළමනාකාර අධ්‍යක්ෂ*
අක්බාර් සමූහය

**අචි ද සිල්වා මයා,** *උපදේශක*
එක්ටෙරා පුද්ගලික සමාගම

**රොමේෂ් මොරායස් මයා,** *උපදේශක*
තේ අලෙවිකරණ විශේෂඥ, ෆින්ලේස් පී.එල්.සී

**ගනේෂ් දේවනායගම්,** *සභාපති*
තේ අපනයනකරුවන්ගේ සංගමය

**මුෆඩෙල් ජැෆර්ජි මයා,** *සාමාජික*
තේ අපනයනකරුවන්ගේ සංගමය

**චමින්ද ජයවර්ධන මයා,** *කළමනාකාර අධ්‍යක්ෂ*
ලුම්බිණි තේ කම්හල

**ජයන්ත කරුණාරත්න මයා,** *සාමාජික*
කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය

**දිල්හාන් සී. ප්‍රනාන්දු මයා,** *අධ්‍යක්ෂ*
එම්.ජේ.එෆ් සමූහය

**අනිල් කුක් මයා,** *ප්‍රධාන විධායක නිලධාරී*
ඒෂියා සියාකා කොමොඩිටීස් පී.එල්.සී

**විෂ් ගෝවින්දසාමි මයා,** *කළමනාකාර අධ්‍යක්ෂ*
සන්ෂයින් හෝල්ඩින් පී.එල්.සී

## නිරීක්ෂකයන්

**අජිත ද අල්විස් මයා,** *මහලේකම්*
ශ්‍රී ලංකා තේ කම්හල් හිමියන්ගේ සංගමය

2024 වර්ෂයේ අගෝස්තු මස තේ අලෙවි හා ප්‍රවර්ධන කමිටුව (TMPC) නමින් මෙම කමිටුව නැවත පිහිටුවන ලද අතර එහි සංයුතිය පහත පරිදි වේ.

*සභාපති,* ශ්‍රී ලංකා තේ මණ්ඩලය
*අධ්‍යක්ෂ ජනරාල්,* ශ්‍රී ලංකා තේ මණ්ඩලය
*අධ්‍යක්ෂ (ප්‍රවර්ධන),* ශ්‍රී ලංකා තේ මණ්ඩලය (කමිටු කැඳවුම්කරු)
*අතිරේක ලේකම්,* වැවිලි හා ප්‍රජා යටිතල පහාසුකම් අමාත්‍යංශය
*අධ්‍යක්ෂ ජනරාල්,* වාණිජ දෙපාර්තමේන්තුව
*සභාපති,* තේ පර්යේෂණ ආයතනය
*නියෝජිත,* සිලෝන් තේ වෙළෙඳුන්ගේ සංගමය
*නියෝජිත,* තේ අපනයනකරුවන්ගේ සංගමය
*නියෝජිත,* කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
*නියෝජිත,* ලංකා වැවිලිකරුවන්ගේ සංගමය
*නියෝජිත,* ලංකා තැරව්කරුවන්ගේ සංගමය

# සභාපතිතුමාගේ පණිවිඩය



අපනයන ආදායම් ඉහල නැංවීමට හා විශාල ජනතාවකට ජීවනෝපාය සැපයීමට දායක වෙමින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ජාතික ආර්ථිකය තුළ ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරන ලදී. 2024 වසර වන විට, තේ කර්මාන්තය අභියෝග මෙන්ම හිතකර අවස්ථාවන් ද සනිටුහන් කරමින් සංකීර්ණ වාතාවරණයක් පසුකරමින් සිටියේය. ජාත්‍යන්තර වෙළඳපොල තුළ උසස් වර්ගයේ නිෂ්පාදනයක් වශයෙන් සිලෝන් තේ ස්ථාපිත කිරීමට මෙන්ම සහනාධාර වැඩසටහන් වැනි රජයේ මැදිහත්වීම් තේ කර්මාන්තයට සහය දක්වමින් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරන ලදී.

## සාධනීය වෙනසක් පිළිබඳ පොරොන්දුවක්

පසුගිය වසරේ වූ සෘණාත්මක තත්වයන්, ධනාත්මක වර්ධනයක් සහිත සාර්ථක පරිවර්තනයක් කරමින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය තුළ කැපී පෙනෙන හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කිරීමට 2024 වසර තුල දී හැකිවිය. 2024 වසරේ වාර්ෂික තේ නිෂ්පාදනය කිලෝ මිලියන 262ක් වූ අතර එය 2023 වසර තුළ වාර්තා වූ කිලෝ මිලියන 256 ක ප්‍රමාණයට සාපේක්ෂව 2.37% ක වර්ධනයකි. පසුගිය වසරට සාපේක්ෂ වූ මෙම වර්ධනය තේ කර්මාන්තය තුළ වූ ප්‍රතිසාධනය හා අභියෝගවලට අනුගත වීමේ හැකියාව පෙන්නුම් කරයි. තේ නිෂ්පාදනයේ ප්‍රධාන සංරචකය ලෙස කාලාන්තරයක් තිස්සේ ප්‍රධානත්වය දරන්නේ 'සාම්ප්‍රදායික තේ' ය. 2024 වර්ෂයේ දී සමස්ත නිෂ්පාදනයෙන් 90% ක් වූ අතර CTC තේ නිෂ්පාදන කොටස 9% ක් විය. සාම්ප්‍රදායික තේ කෙරෙහි ඉලක්ක ගත වීම, සිලෝන් තේ අනර්ඝත ම නිෂ්පාදනයක් ලෙස ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ස්ථාන ගත කිරීමේ ශ්‍රී ලංකාවේ උපාය මාර්ගය සමග ඒකාබද්ධ වේ.

2024 වසරේ ධනාත්මක අපනයන කාර්ය සාධනයක් පැවති අතර අපනයන ඉපයීම් ලෙස රුපියල් බිලියන 433ක ප්‍රමාණයක් එනම් 2023 වසරේ රුපියල් බිලියන 428ක් වූ ප්‍රමාණය ඉක්මවමින් වාර්තා විය. ඇමරිකානු ඩොලර් සම්බන්ධයෙන් ගත් කල, 2023 වසරේ දී ඇමරිකානු ඩොලර් 1.31ක් වූ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් 1.44ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඩොලර් අගය පිළිබඳ සැලකී-මේ දී මෙම වර්ධනය අප දිරිගන්වන තත්වයක් විය. එනම්, තේ කර්මාන්තයට ඉහළ මිලක් නියම වීම මෙන්ම ගෝලීය වෙළෙඳපොළ තුළ තරගකාරීත්වය පවත්වා ගැනීමට ඇති හැකියාව එමගින් පිළිබිඹු කරයි. පරිමාව අනුව සැලකීමේ දී, ශ්‍රී ලංකාව 2024 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 245.79ක ප්‍රමාණයක් අපනයනය කළ අතර එය 2023 දී අපනයනය කළ කිලෝග්‍රෑම් මිලියන 241.91ට වඩා සුළු වර්ධනයකි. සුළු ප්‍රමාණයකින් සිදු වුවද මෙම ඉහල යාම තේ කර්මාන්තයේ ප්‍රතිසාධනය හා ස්ථාවරත්වය පිළිබඳ ධනාත්මක ලක්ෂණයක් විය. FOB තේ කිලෝවක මිලෙහි ද ඉහල යාමක් දක්නට ලැබුණි. එය 2023 දී ඇමරිකානු ඩොලර් 5.41ක් වූ අතර 2024 දී එය ඇමරිකානු ඩොලර් 5.84ක් දක්වා වර්ධනය විය. සිලෝන් තේ සඳහා වැඩි වන ඉල්ලුම මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොල තුළ ඉහල මට්ටමේ මිලක් ලබා ගැනීමට ඇති හැකියාව FOB මිලෙහි මෙම ඉහල යාම තුළින් පෙන්නුම් කරයි.

## සහනාධාර වැඩසටහන

තේ කර්මාන්තය නංවාලීම උදෙසා තේ වගාකරුවන්ට සහාය වීමේ අරමුණෙන් සහනාධාර වැඩසටහන් කිහිපයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලදී. ඉහළ යන නිෂ්පාදන පිරිවැය, ශ්‍රම හිඟය සහ තාක්ෂණික නවීකරණයේ අවශ්‍යතාවය වැනි ප්‍රමුඛ අභියෝගයන්ට මුහුණ දීම සඳහා මෙම වැඩසටහන් සැලසුම් කරන ලදී. යාන්ත්‍රිකව දළු නෙලීම හා සැකසුම් උපකරණ භාවිත කිරීම, ඒ සඳහා හුරුවීම, ශ්‍රමය මත යැපීම අවම කිරීම හා කාර්යක්ෂමතාව ඉහල නැංවීම සඳහා සහනාධාර වැඩසටහන් හඳුන්වා දී ඇත. පුනර්ජනනීය බලශක්ති වැඩසටහනක් ලෙස, 2021 වසරේ දී හඳුන්වා දුන් සූර්ය බලශක්ති සහනාධාර වැඩසටහන සමාලෝචිත වර්ෂය පුරාම අඛණ්ඩව ක්‍රියාත්මක වුණි.

පසෙහි සාරවත් බව පවත්වා ගැනීම හා ඉහළ අස්වැන්නක් සහතික කිරීම උදෙසා පොහොරවල භාවිතයේ වැදගත්කම හඳුනා ගනිමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2024 වර්ෂය තුළ පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන මගින් සියලුම තේ වගාකරුවන්ට මහගු සෙතක් සැලසුනි. කිලෝග්‍රෑම් 50ක තේ බෑගයකට රු. 2000.00ක සහනාධාරයක් ලබා දෙමින් මේ සඳහා රු. බිලියන 1.2ක මුදලක් මූලික වශයෙන් වෙන් කරන ලදී. පසුව මුළු වටිනාකම රු. බිලියන 2.2 දක්වා වැඩි කරමින් බෑගයකට රු. 4000 දක්වා සහනාධාරය වැඩි කරන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ තේ කර්මාන්තශාලා හරහා මෙන්ම කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (TSHDA) හරහා පොහොර බෙදා හැරීම සිදු කරන ලදී.

## ජාත්‍යන්තර වෙළඳපොළ තුළ සිලෝන් තේ

සුවිශේෂී ගුණය හා උසස් සම්ප්‍රදාය හේතුවෙන් කීර්තියට පත් සිලෝන් තේ ගෝලීය වශයෙන් පිළිගත් සන්නාමයක් වශයෙන් පවතී. තරගකාරී සහ වර්ධනය වෙමින් පවතින ජාත්‍යන්තර වෙළඳපොළක් තුළ 2024 වසරේ දී ශ්‍රී ලංකාවේ තේ අපනයන සාර්ථකව සිදු විය. යුරෝපය, උතුරු ඇමරිකාව සහ මැදපෙරදිග යන රටවල ඉහළ පෙළේ වෙළඳපොළ අවශ්‍යතා සපුරාලන සිලෝන් තේ ප්‍රමුඛතම නිෂ්පාදනයක් වශයෙන් තම කීර්ති නාමය පවත්වාගෙන යනු ලබයි. ශ්‍රී ලංකාවේ තේ වල අද්විතීය රසය හා ගුණාත්මකබව හේතුවෙන් එහි තරගකරුවන්ට සාපේක්ෂව ඉහළ මිලක් රඳවා ගැනීමට හැකිවී තිබේ. සිලොන් තේ රුසියාව, මැදපෙරදිග සහ යුරෝපය වැනි සාම්ප්‍රදායික වෙළඳපොළවල්හි

ඉදිරියෙන් සිටින අතර, ඉහල තේ පරිභෝජනයක් පවතින ආසියාවේ අනෙකුත් රටවල විශේෂයෙන් චීනය සහ ජපානය වැනි නව වෙළඳපොළවල් ශ්‍රී ලංකාව විසින් ගවේෂණය කරමින් සිටී. උපායමාර්ගික අලෙවිකරණ ප්‍රයත්නයන් සහ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන-වලට සහභාගී වීම තුළින් සිලෝන් තේ නාමය ගෝලීය වශයෙන් ව්‍යාප්ත කිරීමට උපකාරී වී තිබේ.

තනි සම්භවයක් සහිත තේ, අතින් සකසන ලද තේ, කාබනික සහ විශේෂිත තේ සඳහා පවතින ඉල්ලුම ඉහල යමින් පවතී. අතින් සකසන ලද තේ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මූල්‍ය, තාක්ෂණික සහ ප්‍රවර්ධන සහාය ලබා දීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පහසුකම් සැලසීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

## GI ව්‍යාපෘතිය

සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශකයක් (GI) ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදු කරන ලද ප්‍රධාන කටයුත්තකි. භූගෝලීය දර්ශක සහ ජාත්‍යන්තර තත්ත්ව සහතික සකස් කිරීම තුළින් සිලෝන් තේවල වටිනාකම ඉහල නැංවීම එහි ඉලක්කය වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා එක් ව ව්‍යාපෘති හවුල්කරුවන් විසින් "සිලෝන් තේ (GI) අයදුම්පත" 2024 සැප්තැම්බර් මාසයේ දී යුරෝපා කොමිසමට සාර්ථක ව ඉදිරිපත් කර ඇත.

## තෙල් සඳහා තේ හුවමාරු යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකාව හා ඉරානය අතර තෙල් සඳහා තේ හුවමාරු වැඩසටහන යටතේ තේ සැපයීම සමාලෝචිත වර්ෂය පුරාවට සාර්ථකව සිදු විය.

## ඉදිරි ගමන් මග

2024 වර්ෂයේ දී තේ කර්මාන්තයේ කාර්යසාධනය තරමක් ප්‍රශංසනීය වුවත්, යම් යම් අභියෝග තවමත් පවතී. දේශගුණික විපර්යාස, වැඩිවන නිෂ්පාදන පිරිවැය සහ ශ්‍රම හිඟය තේ කර්මාන්තයේ වර්ධනය සඳහා පවතින අභියෝග වේ. කෙසේ වෙතත්, නිෂ්පාදනයේ ධනාත්මක ප්‍රවණතා, අපනයන ඉපැයීම් සහ FOB මිල ගණන් ඉදිරි ප්‍රගමනය සඳහා ශක්තිමත් පදනමක් සපයයි. නවෝත්පාදනය, තිරසාරභාවය සහ වෙළඳපල විවිධාංගීකරණය කෙරෙහි අවධානය යොමු කිරීමෙන්, ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට මෙම ශක්‍යතාවයෙන් ඵල නෙලා ගත හැකි අතර ගෝලීයව ඉහල පෙළේ තේ පිළිබඳ ප්‍රමුඛයා වශයෙන් තම ස්ථානය රඳවාගෙන සිටිය හැකිය.

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ අනර්ඝ උරුමයෙන් ප්‍රයෝජන ගනිමින්, තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් හා නව වෙළඳපල ගවේෂණය කිරීමෙන්, ඉදිරි වසරවලදී මනා දියුණුව අත් කර ගැනීමට ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට හැකිය. ශ්‍රී ලංකා තේ මණ්ඩලය එහි කොටස්කරුවන් සමග එක්ව 2025 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ඒකාබද්ධ ප්‍රයත්නයන් හා සාර්ථක මුලපිරීම් තුළින් විශිෂ්ටත්වයේ සංකේතයක් ලෙස පවතිමින් ජාතික ආර්ථිකයට මහගු දායකත්වයක් ලබා දීමට සිලෝන් තේ වලට හැකිවනු ඇතැයි මම විශ්වාස කරමි.

## තුති පිදුම

මෙම ජයග්‍රහණය කරා තේ කර්මාන්තය මෙහෙයවීම සඳහා නොසැලෙන කැපවීමෙන් සහ නොපසුබට උත්සාහයෙන් කටයුතු කළ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට මෙන්ම තේ අගයදාමයේ කොටස්කරුවන්ට මගේ හෘදයාංගම කෘතඥතාව මෙයින් පළ කරමි. ඔබ විසින් දරන ලද සියලු ප්‍රයත්නයන් හා කරන ලද වැඩ කටයුතු, විශේෂඥතා ඥානය සහ ඒ සඳහා දැක්වූ ලැදියාව කර්මාන්තයේ වර්ධනයට සහ එහි ගෝලීය කීර්ති නාමය පවත්වා ගැනීමට මහෝපකාරී වී ඇත. අපගේ ආර්ථිකයේ සුවිශේෂී අංශයක් වන ශ්‍රී ලංකා තේ කර්මාන්තයට ලබා දුන් ඔබගේ අමිල දායකත්වය බෙහෙවින් අගය කරමි.

රාජ් ඔබේසේකර
සභාපති

# මූලික සංසන්දනාත්මක දර්ශක

| වර්ගය | ඒකකය | 2022 | 2023 | 2024 | 2023 සාපේක්ෂව 2024 වෙනස (%) |
|---|---|---|---|---|---|
| **තේ නිෂ්පාදනය** | | | | | |
| **සමස්ථ තේ නිෂ්පාදනය** | **මිලි.කි.ග්‍රෑම්** | **251.84** | **256.09** | **262.16** | **2.37** |
| ඉහළ | මිලි.කි.ග්‍රෑම් | 56.95 | 58.64 | 55.72 | (4.98) |
| මධ්‍යම | මිලි.කි.ග්‍රෑම් | 39.72 | 42.34 | 47.62 | 12.48 |
| පහළ | මිලි.කි.ග්‍රෑම් | 155.16 | 155.11 | 158.82 | 2.39 |
| සැකසුම් ක්‍රමය අනුව වර්ගීකරණය | | | | | |
| සාම්ප්‍රදායික (ජෛව තේ ඇතුළුව) | මිලි.කි.ග්‍රෑම් | 227.44 | 231.19 | 236.22 | 2.18 |
| සී.ටී.සී. තේ | මිලි.කි.ග්‍රෑම් | 22.59 | 22.62 | 23.68 | 4.70 |
| හරිත තේ | මිලි.කි.ග්‍රෑම් | 1.81 | 2.28 | 2.26 | (0.97) |
| | | | | | |
| **ක්ෂණික තේ නිෂ්පාදනය** | **මිලි.කි.ග්‍රෑම්** | **4.47** | **3.20** | **2.89** | **(9.97)** |
| **තේ අලෙවිය (පොදු ,සෘජු, පෞද්ගලික විකුණුම් ඇතුළු ව)** | | | | | |
| **සමස්ත විකුණුම් ප්‍රමාණය** | **මිලි.කි.ග්‍රෑම්** | **248.64** | **249.65** | **260.65** | **4.41** |
| ඉහළ | මිලි.කි.ග්‍රෑම් | 53.72 | 56.47 | 56.47 | 0.00 |
| මධ්‍යම | මිලි.කි.ග්‍රෑම් | 42.08 | 41.87 | 47.64 | 13.78 |
| පහළ | මිලි.කි.ග්‍රෑම් | 152.84 | 151.31 | 156.53 | 3.45 |
| **සමස්ත විකුණුම් මිල** | **රු./කි.ග්‍රෑම්** | **1,234.24** | **1,171.29** | **1,225.17** | **4.60** |
| ඉහළ | රු./කි.ග්‍රෑම් | 1,093.10 | 1,072.48 | 1,141.63 | 6.45 |
| මධ්‍යම | රු./කි.ග්‍රෑම් | 1,030.82 | 1,012.35 | 1,064.48 | 5.15 |
| පහළ | රු./කි.ග්‍රෑම් | 1,339.86 | 1,252.15 | 1,304.38 | 4.17 |
| **තේ අපනයන** | | | | | |
| **තේ අපනයන ප්‍රමාණය (ප්‍රති අපනයන හැර)** | **මිලි.කි.ග්‍රෑම්** | **241.65** | **231.46** | **230.42** | **(0.45)** |
| කළු තේ | මිලි.කි.ග්‍රෑම් | 236.77 | 226.75 | 227.47 | 0.32 |
| හරිත තේ | මිලි.කි.ග්‍රෑම් | 1.85 | 1.99 | 2.04 | 2.58 |
| ක්ෂණික තේ | මිලි.කි.ග්‍රෑම් | 3.02 | 2.72 | 0.91 | (66.48) |
| **තේ අපනයනය - වටිනාකම (ප්‍රති අපනයන හැර)** | **රු.බිලි** | **389.50** | **401.84** | **397.29** | **(1.12)** |
| කළු තේ | රු.බිලි | 374.22 | 384.56 | 387.08 | 0.66 |
| හරිත තේ | රු.බිලි | 7.25 | 8.02 | 7.63 | (4.90) |
| ක්ෂණික තේ | රු.බිලි | 8.04 | 9.26 | 2.63 | (71.63) |
| **සමස්ත තේ අපනයන ප්‍රමාණය (ප්‍රති අපනයන සමග)** | **මිලි.කි.ග්‍රෑම්** | **250.17** | **241.91** | **245.79** | **1.60** |
| **සමස්ත තේ අපනයන වටිනාකම (ප්‍රති අපනයන සමග)** | **රු.බිලි** | **411.05** | **428.29** | **433.47** | **1.21** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ශ්‍රී ලංකා රේගුව

# 1. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්ය භාරය

## 1.1. ආයතනයේ පසුබිම

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ තේ පාලන දෙපාර්තමේන්තුව - 1957 අංක 51 දරණ තේ පාලන පනත, තේ අපනයන කොමසාරිස් දෙපාර්තමේන්තුව 1959 අංක 16 දරණ තේ (බදු සහ අපනයන පාලන) පනත, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය - 1925 තේ පර්යේෂණ ආඥා පනත සහ ශ්‍රී ලංකා තේ ප්‍රචාරණ මණ්ඩලය ඒකාබද්ධ කරමින් 1976 ජනවාරි පළමු වන දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටු වන ලදි. 1993 දී, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, 1993 අංක 52 දරණ තේ පර්යේෂණ පනතේ කළමනාකරණය යටතට පත් විය. ගෝලීය අවශ්‍යතා සපුරාලීම සඳහා වර්තමාන නීති හා රෙගුලාසි හැඩගස්වා ගැනීමේ අවශ්‍යතාවයන් මත පදනම් ව ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය 1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29, 2006 අංක 44 සහ 2018 අංක 13 දරණ පනත් මගින් සංශෝධනයන්ට ලක් වූ අතර තේ පාලන පනතේ හි සංශෝධනයන් සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටු වීමට පෙර, ගෝලීය සන්දර්භය තුළ පුද්ගලික අංශය විසින් සිදු කරන ලද ශ්‍රී ලංකා තේ (සිලෝන් තේ) ප්‍රවර්ධනය කිරීමේ කාර්යය තේ ප්‍රචාරණ මණ්ඩලය විසින් මෙහෙය වන ලදී. 1976 දී තේ ප්‍රචාරණ මණ්ඩලය පාර්ලිමේන්තුව මගින් අහෝසි කරන ලද අතර තේ ප්‍රචාරණ මණ්ඩලය තේ කර්මාන්තයට ඇති බලතල සහිත ව ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතට පත් කරන ලදී.

නියාමන ආයතනය ලෙස තේ කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීමේ වගකීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වේ. එනම්, නිෂ්පාදනය, වගා කිරීම වැඩි දියුණු කිරීම, නැවත සිටු වීම, පැරණි වතු පුනරුත්ථාපනය කිරීම, කර්මාන්තශාලා පිහිටු වීම සහ ඒවායේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම ආදිය යි. එයට අමතරව, තේ වතු කළමනාකරණයෙහි සහ දේශීය හා විදේශීය තේ නිෂ්පාදනයෙහි හා අලෙවිකරණයේ හි නියැලී සිටින සියලු ම ආයතන සහ සංවිධාන පාලනය කිරීම මෙන් ම මෙහෙය වීම මෙමගින් සිදු කෙරේ. සිලෝන් තේ වල ගුණාත්මකභාවය, පවත්වා ගැනීම සඳහා කර්මාන්තශාලාවේ සිට බෙදා හැරීමේ අවස්ථාව දක්වා වූ සමස්ත ක්‍රියාවලිය ම අධීක්ෂණය කර ඇගයීමට ලක් කර ඇති අතර විකුණුම්, පූර්ව බෙදා හැරීම, තැරැව්කරුවන්ගේ ගබඩාවන්, මිශ්‍ර කරන්නන්, අපනයනකරුවන් සහ මිශ්‍රණය සහ ගබඩා කිරීම සනීපාරක්ෂාව පිළිබඳ උපදේශන සේවා සැපයීම යන අවස්ථාවන් හි තේවල ගුණාත්මක ප්‍රමිතීන් අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියා මාර්ග රාශියක් ආරම්භ කර තිබේ.

සංවර්ධන කාර්යයන් යටතේ, වගාකරුවාගේ සිට අපනයනකරුවන් දක්වා අගය දාමයේ සියලු ම ස්ථාන ආවරණය වන පරිදි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහනාධාර ලබා දීම, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ උපදේශන වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම සිදුකෙරේ. තේ ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීමට, අමු තේ සහ තේවල ගුණාත්මක බව ඉහළ නැංවීමට සහ තේ කෝප්පයකට නැතහොත් තේ කිලෝවකට වඩාත් හොඳ මිලක් ලබා ගැනීම සඳහා සංවර්ධන වැඩසටහන් රැසක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කෙරේ.

සංවේදී හා රසායනික නියැදි විශ්ලේෂණ මගින් වෙන්දේසිට පෙර සහ පසු තේ සාම්පල ඇගයීමට ලක් කිරීම තේ රස බැලීමේ ඒකකය මගින් සිදු කෙරේ. නියාමන සහ සංවර්ධන කාර්යයන් හරහා මෙන්ම, කර්මාන්තයේ පාර්ශවකරුවන් හරහා ලැබෙන තේ සාම්පල සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරය විසින් සිදු කරනු ලබයි.

ගෝලීය වශයෙන් උපාය මාර්ගික ප්‍රවේශයන් ඔස්සේ සිලෝන් තේ සම්බන්ධ අලෙවිකරණ හා ප්‍රවර්ධනය කටයුතු ප්‍රචාරණ අංශය මගින් සිදු කරනු ලබයි. ලොව පුරා පවතින අස්ථාවර ආර්ථික තත්ත්වය සහ පාරිභෝගිකයින්ගේ පරිභෝජන රටාවන් සහ මිල දී ගැනීමේ හැකියාවන් වෙනස් කරමින්, තේ කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ විදේශ විනිමය ඉපැයීම් සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා සිලෝන් තේවල ස්ථාවරබව ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රයත්න දරනු ලබයි.

කර්මාන්තයේ ප්‍රමුඛත ම ආයතනය ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ නිෂ්පාදනය, අලෙවිකරණය, අපනයන, තේ සම්බන්ධ ගෝලීය තත්ත්වයන් සහ ඉදිරි වසර සඳහා ඉලක්ක සම්බන්ධ සංඛ්‍යාලේඛන සපය යි. තේ ප්‍රතිපත්තිමය තීරණ අනුමත කිරීම, පාර්ශවකරුවන් සහ රේඛීය අමාත්‍යංශය හා මුදල් අමාත්‍යංශය ඇතුළු බලධාරීන් නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කෙරේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යංශයේ විෂය පථයට අයත් වන අතර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය අධීක්ෂණය සිදු කරනු ලබයි.

## 1.2. ව්‍යුහය සහ සිදු කළ ක්‍රියාකාරකම්



# 2. මූල්‍ය හා මෙහෙයුම් කාර්ය සාධන විශ්ලේෂණය

## 2.1. තේ කොමසාරිස් අංශය

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ විධිවිධාන යටතේ පත් කරනු ලබන, ''තේ කොමසාරිස්වරයා''ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන තේ කොමසාරිස් අංශය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන අංශ අතුරින් එකකි. 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සහ 1957 අංක 51 දරණ තේ පාලන පනත මගින් පාලනය වන නියාමන සහ අධීක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් වන සියලු කටයුතු මෙම අංශය විසින් පාලනය කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය නියාමනය හා සංවර්ධනය කිරීමේ වගකීම තේ කොමසාරිස් විසින් දරනු ලැබේ. නියාමන, සංවර්ධන හා අපනයන යන ප්‍රධාන අංශ තුනකට තේ කොමසාරිස් අංශයේ කටයුතු බෙදා ඇත. ගම්පොළ, බණ්ඩාරවෙල, රත්නපුර, මාතර, බදුරලිය, ගාල්ල සහ නුවරඑළිය යන ප්‍රදේශවල පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාල 07 ක් වෙතට තේ කොමසාරිස් අංශයේ කාර්යයන් විමධ්‍යගත කර ඇත.

### 2.1.1. නියාමන කාර්යයේ ප්‍රධාන ජයග්‍රහණ

#### i).තේ නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම

1957 අංක 51 දරණ තේ පාලන පනත අනුව නිමි තේ නිෂ්පාදකයන්ගේ නාම ලේඛනය හා තේ කම්හල් සම්බන්ධ අදාළ විස්තර තේ කොමසාරිස් විසින් පවත්වා ගත යුතුව ඇත. තේ නිෂ්පාදකයින් තේ නිෂ්පාදනය කිරීමට, ප්‍රසිද්ධ වෙන්දේසි, පුද්ගලික අළෙවි කිරීම්, සෘජු අළෙවි කිරීම් හා කොන්ත්‍රාත් වැනි අනුමත ක්‍රම ඔස්සේ තේ අලෙවි කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු ය.

මනා තත්වයේ නිමි තේ නිෂ්පාදනයක් සිදු කිරීම සඳහා, සියලුම තේ කර්මාන්තශාලා ගොඩනැගිලි, උපකරණ හා කර්මාන්තශාලා වල මෙහෙයුම් සිදු කරන ආකාරය අවම තත්ත්ව ප්‍රමිතීන් අනුව පවත්වා ගත යුතුවේ.

වගුව 2.1.1: මෙහෙයුම් අනුව තේ කර්මාන්තශාලා වර්ගීකරණය

| තත්ත්වය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි තේ කර්මාන්තශාලා ගණන | 206 | 248 | 579 | 1033 |
| 2024 වසරේ මෙහෙයුම් කටයුතු සිදුකරන ලද තේ කර්මාන්තශාලා ගණන (සම්ප්‍රදායික / CTC / හරිත ) | 129 | 111 | 359 | 599 |
| ලියාපදිංචි අතින් සාදන තේ නිශ්පාදන කර්මාන්තශාලා සංඛ්‍යාව | 6 | 9 | 38 | 53 |
| ලියාපදිංචි කසල තේ ප්‍රතිසැකසුම් කර්මාන්තශාලා සංඛ්‍යාව | 2 | 93 | 14 | 109 |
| 2024 වසරේ දී මෙහෙයුම් සිදු නොකරන ලද තේ කම්හල් සංඛ්‍යාව | 69 | 35 | 168 | 272 |

අතින් සාදන තේ සඳහා ගෝලීය වෙළඳපොළේ ඉහළ ඉල්ලුමක් හා ඉහළ මිලක් පැවතීම හේතුවෙන් එම කර්මාන්තයේ නියැළෙන කුඩා පරිමාණ නිෂ්පාදකයින්ට සහාය වීම මූලික වශයෙන් අරමුණු කර ගනිමින් අතින් සාදන තේ නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීමේ යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. අතින් සාදනු ලබන තේ නිෂ්පාදකයින් 53 දෙනෙකු මෙම විශේෂිත බාණ්ඩය යටතේ ලියාපදිංචි වී ඇත.

#### ii).තේ දළු වෙළෙඳුන් හා කසල තේ සැකසුම් මධ්‍යස්ථාන ලියාපදිංචිය හා අලුත් කිරීම

**අ) තේ දළු වෙළෙඳුන් හට බලපත්‍ර ලබා දීම**

1957 අංක 51 දරණ තේ පාලන පනතට අනුව, තේ දළු වෙළෙඳුන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු අතර තම බලපත්‍රය වාර්ෂිකව අලුත් කර ගත යුතු ය. එකතු කිරීමේ මධ්‍යස්ථානවල හා තේ දළු ප්‍රවාහනය සඳහා භාවිත කරනු ලබන වාහනවල ප්‍රමිතිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වඩා සුපරීක්ෂාකාරී ලෙස නියාමනය කරනු ලැබේ.

වගුව 2.1.2: 2024 වසර තුළ දී තේ දළු වෙළඳාම සඳහා ලබා දී ඇති බල පත්‍ර සංඛ්‍යාව

| ස.තේ.කො ප්‍රදේශය | **2024.01.01** දිනට බල පත්‍ර ලබා දුන් වෙළෙඳුන් | බල පත්‍ර අලුත් කිරීම | නිකුත් කරන ලද නව බල පත්‍ර | **2024.12.31** දිනට තේ දළු වෙළඳාම සඳහා ලබා දුන් බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 187 | 182 | 10 | 192 |
| ගම්පොළ | 177 | 178 | 10 | 188 |
| මාතර | 250 | 237 | 3 | 240 |
| ගාල්ල | 244 | 238 | 4 | 242 |
| රත්නපුර | 496 | 468 | 37 | 505 |
| බදුරලිය | 227 | 217 | 8 | 225 |
| නුවරඑළිය | 105 | 99 | 2 | 101 |
| එකතුව | **1686** | **1619** | **74** | **1693** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**ආ) කසල තේ පිරිසැකසුම් වෙළෙඳුන් සඳහා බල පත්‍ර ලබා දීම සහ කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථානවල මනා නිෂ්පාදන පිළිවෙත් (GMP) ස්ථාපිත කිරීම**

කසල තේ පිරිසැකසීම යනු කසල තේ වලින් භාවිත කළ හැකි තේ වෙන් කර ගැනීම යි. කසල තේ අලෙවි කරන සියලු ම වෙළෙඳුන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු ය. කසල තේ ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන ප්‍රවාහන බල පත්‍ර අනිවාර්යෙන් අවශ්‍ය වේ.

වගුව 2.1.3: කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන ගණන සහ 2024 වසර සඳහා නිකුත් කළ බලපත්‍ර ගණන හා කසල තේ ප්‍රමාණය

| ස.තේ.කො ප්‍රදේශය | **2024.01.01** දිනට ලියාපදිංචි සැකසුම්කරුවන් | වසර තුළ අලුත් කිරීම් | වසර තුළ අලුතින් නිකුත් කිරීම් | **2024.12.31** දිනට පිරිසැකසුම් මධ්‍යස්ථාන ගණන | **2024.12.31** දිනට නිකුත් කළ බලපත්‍ර ගණන | බලපත්‍ර මගින් වෙළෙඳුන් විසින් ගෙනෙන ලද කසල තේ ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) |
|---|---|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 3 | 2 | 0 | 2 | 912 | 4,443,653 |
| ගම්පොළ | 106 | 91 | - | 91 | 911 | 4,093,629 |
| මාතර | 4 | 4 | - | 4 | 779 | 2,449,229 |
| ගාල්ල | 2 | 2 | - | 2 | 688 | 1,965,764 |
| රත්නපුර | 8 | 7 | 1 | 8 | 1,488 | 6,515,569 |
| බදුරලිය | 9 | 2 | - | 2 | 908 | 4,740,607 |
| නුවරඑළිය | 3 | 2 | - | 2 | 1,949 | 12,522,727 |
| එකතුව | **135** | **110** | **1** | **111** | **7,635** | **36,731,178** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථානවල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. මෙම ක්ෂේත්‍රය තව දුරටත් නියාමනය කිරීම සඳහා විශේෂයෙන් ගුණාත්මක ප්‍රමිතීන් සපුරාලන (අවම වශයෙන් GMP ප්‍රමිතීන් 80%) කසල තේ සැකසුම්කරුවන්ට වෙන්දේසි අයිතිය සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රමයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සකස් කර ඇත. 2024 වර්ෂය වන විට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් GMP ගුණාත්මක ප්‍රමිතීන් සපුරාලන අනුමත කසල තේ සැකසුම් මධ්‍යස්ථාන 109 ක් සඳහා වෙන්දේසි අයිතිය ලබා දී ඇත.

### iii).මිල දී ගන්නා තේ දළු සඳහා ගෙවිය යුතු සාධාරණ මිල

තේ පාලන පනතේ විධිවිධාන යටතේ මිල දී ගත් දළු සකස් කරනු ලබන කර්මාන්තශාලා විසින් සාධාරණ මිල සූත්‍රයට අනුව මිල දී ගත් දළු සඳහා ගෙවීම් කළ යුතු ය. මෙම කර්මාන්තශාලාවලින් ගෙවීම් කරනු ලබන බව තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය තේ පරීක්ෂකවරුන් විසින් මාසික ව පරීක්ෂණ පවත්වනු ලබන අතර සෑම ප්‍රදේශයක ම සහකාර තේ කොමසාරිස්වරු විසින් මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කරනු ලබයි. ගෙවීම් පැහැර හැරීම් හෝ ප්‍රමාද වූ ගෙවීම් පිළිබඳ ඕනෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් කටයුතු කරයි. එවැනි පැමිණිලි විමර්ශනය කිරීමෙන් පසු වෙන්දේසියෙන් ලැබෙන මුදලින් නියමිත මුදල් අය කර ගෙන ඒවා දළු සැපයුම්කරුවන් වෙත ලබා දීම සිදු කරනු ලබයි.

### iv).තේ කර්මාන්තශාලා මට්ටමින් තේ වල ගුණාත්මය ඉහළ නැංවීමේ ක්‍රියාකාරකම්

කර්මාන්තශාලාවේ ගොඩනැගිලි, උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර ආදියේ නිසි නඩත්තුව උසස් තත්ත්වයේ තේ නිෂ්පාදනය සඳහා අත්‍යවශ්‍ය වේ. තව ද, කර්මාන්තශාලාවේ මෙහෙයුම් ක්‍රියාපටිපාටිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන සම්මත මාර්ගෝපදේශ සහ නියෝගවලට අනුකූල විය යුතු ය. තේ කොමසාරිස් විසින් නිර්ණය කරනු ලබන අවශ්‍යතා හෝ ප්‍රමිති සපුරාලීමට අපොහොසත් වීම කර්මාන්තශාලාවේ ලියාපදිංචිය අත්හිටු වීමට හෝ අහෝසි වීමට හේතු වේ.

ප්‍රාදේශීය සහකාර තේ කොමසාරිස්වරුන් විසින් මෙම අවශ්‍යතා නියාමනය කිරීම සඳහා පරීක්ෂණ පවත්වනු ලබන අතර ඔවුන්ගේ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මත පදනම් ව නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. තව ද, ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් විසින් උක්ත අවශ්‍යතා පවත්වා ගැනීම සඳහා උපදේශන සේවා සපයනු ලබයි.

ඒ අනුව, තේ කර්මාන්තශාලාවල හා එහි නිෂ්පාදනවල ගුණාත්මය ඉහළ නැංවීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

#### අ) තේ කර්මාන්තශාලාවල යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) ස්ථාපිත කිරීම

තේ කර්මාන්තශාලා වල නිෂ්පාදන ක්‍රියාවලියේ ගුණාත්මක ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උපදෙස් සැපයීමට මෙම වැඩසටහන සකස් කර ඇත. මෙම වැඩසටහන යටතේ ඇගයීම් 578 ක් සිදු කළ අතර ඒ අනුව තේ නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමිති වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

වගුව 2.1.4: ප්‍රාදේශීය වශයෙන් තේ කර්මාන්තශාලා වල යහපත් නිෂ්පාදන පිළිවෙත් අගයීම්

| ස.තේ.කො ප්‍රදේශය | GMP ඇගයීම් සිදු කළ කර්මාන්තශාලා ගණන | ශ්‍රේණි ගත කර්මාන්තශාලා ගණන | | | |
|---|---|---|---|---|---|
| | | විශිෂ්ට | හොඳ | සාමාන්‍ය | දුර්වල |
| බණ්ඩාරවෙල | 64 | 31 | 31 | 2 | - |
| ගම්පොළ | 130 | 46 | 39 | 4 | - |
| රත්නපුර | 103 | 55 | 45 | 3 | - |
| මාතර | 39 | 17 | 22 | 0 | - |
| ගාල්ල | 88 | 50 | 25 | 12 | 1 |
| බදුරලිය | 51 | 27 | 21 | 3 | - |
| නුවරඑළිය | 103 | 69 | 32 | 2 | - |
| **එකතුව** | **578** | **295** | **215** | **26** | **1** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

#### ආ) හදිසි වැටලීම් (කාර්ය කණ්ඩායම් මෙහෙයුම)

තේ කර්මාන්තයේ අවභාවිතාවන් පාලනය කිරීම සඳහා කාර්ය කණ්ඩායම් මෙහෙයුම් සිදු කරනු ලබයි. සහකාර තේ කොමසාරිස් ප්‍රධාන කොටගත් ක්ෂේත්‍ර නිලධාරීන් කණ්ඩායමක් මගින් මෙහෙයුම් සිදු කරනු ලබන අතර 2024 වසරේ දී තේ කර්මාන්තශාලා වල හදිසි වැටලීම් 91 ක් සිදු කරන ලදී.

වගුව 2.1.5: කාර්ය කණ්ඩායම් මෙහෙයුම්

| ස.තේ.කො ප්‍රදේශය | සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| බණ්ඩාරවෙල | 4 |
| ගම්පොළ | 7 |
| රත්නපුර | 25 |
| මාතර | 4 |
| ගාල්ල | 4 |
| බදුරලිය | 22 |
| නුවරඑළිය | 25 |
| **එකතුව** | **91** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

#### ඇ) උත්සව සමයේ දී බෝග කළමනාකරණය කිරීමේ වැඩසටහන

උත්සව සමයේ දී දීර්ඝ කාලයක් තේ කර්මාන්තශාලා වසා තැබීම හේතුවෙන් සිදු වන අස්වනු හානිය අවම කර ගැනීම සඳහා කර්මාන්තශාලා වසා තබන කාල සීමාවන් අවම කිරීම හා උත්සව සමයට පෙර අස්වනු නෙලීම සඳහා උපදේශනය ලබා දීම වැනි ක්‍රමෝපායන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියා මාර්ග තුළින් බොහෝ වශයෙන් ඵලදායිතාවය ඉහළ නැංවීමට හා උත්සව සමයේ බෝග හානි අවම කිරීමට හැකි විය.

### v).තේ දළුවල තත්ත්ව ආරක්ෂා කිරීම

#### අ) තේ දළුවල ප්‍රමිතිය වැඩි දියුණු කිරීම සඳහා 'බී දළු 60' (B leaf 60) වැඩසටහන

තේ දළුවල ප්‍රමිතිය යනු ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර තේ පාරිභෝගිකයන් සඳහා සපයන තේවල ගුණාත්මකබව තීරණය කරන වැදගත් සාධකය කි. 'බී දළු 60' (B leaf 60) වැඩසටහන මගින් පසු අස්වනු හානිය අවම කිරීමට, දළු නෙලීමේ ප්‍රමිති ඉහළ නැංවීමටත් ඒ හේතුවෙන් තේ දළු බර මත පදනම් ව හොඳම ශ්‍රේණියේ තේ දළු ප්‍රමිතිය 60% කට වඩා ඉහළ නැංවීමටත් ප්‍රයත්න දරනු ලැබේ. උපාය මාර්ගික ප්‍රවේශයක් සහිතව 2024 වර්ෂයේ දී ව්‍යාපෘතිය ප්‍රතිනිර්මානය කළ අතර 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. වර්ෂය තුළ විවිධ මට්ටම්වල දී දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සහ කලින් කලට ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කරන ලදී. වතු හා කර්මාන්තශාලා තුළ පවත්වා ගෙන යනු ලබන දළු නෙලීම, දළු ප්‍රවාහනය හා හැසිරවීමේ ප්‍රමිති ආදී කටයුතුවලට වඩා ප්‍රමිතියෙන් අඩු තේ දළු (දුර්වල දළු) ප්‍රතිශතය හා හානි වූ දළු (හොඳම තත්ත්වයට පහළ) අඩු කිරීමට හා හොඳම තත්වයේ දළු (B%) බවට වැඩි දියුණු කිරීමට කටයුතු කරන ලදී.

වගුව 2.1.6: ප්‍රාදේශීය වෙළෙඳුන්ගේ තේ දළු ප්‍රමිතීන්

| ස.තේ.කො ප්‍රදේශය | වඩාත්ම හොඳ % | වඩාත්ම හොඳ මට්ටමට පහළ % | දුර්වල % |
|---|---|---|---|
| ගම්පොළ | 38 | 18 | 44 |
| ගාල්ල | 43 | 15 | 42 |
| බදුරලිය | 34 | 20 | 46 |
| මාතර | 40 | 17 | 43 |
| රත්නපුර | 34 | 20 | 46 |
| නුවරඑළිය | 37 | 24 | 39 |
| බණ්ඩාරවෙල | 29 | 28 | 43 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඉහත කටයුතුවලට අමතර ව නියාමන අංශය මගින් පහත වැඩ කටයුතු ද සිදු කරනු ලබයි.

- තේ කර්මාන්තයට අදාළ තොරතුරු එකතු කිරීම හා බෙදා හැරීම
- තේ වගා කරනු ලබන ප්‍රදේශවල තේ නිෂ්පාදනය, තේ දළු එකතු කිරීම හා සකස් කර භාවිතයට ගත හැකි තේ පිරිසැකසීම සඳහා උපදෙස් හා සේවාවන් සැපයීම
- තේ දළුවල ප්‍රමිතිය ඉහළ නැංවීමට හා පසු අස්වනු හානිය අවම කිරීමට වැඩසටහන් දියත් කිරීම
- කාබනික විශ්ලේෂණය හා රසායනාගාර පරීක්ෂණය සඳහා වෙන්දේසියට පෙර හා හා නැව් ගත කිරීමට පෙර නියදි සාම්පල රස බැලීමේ පරීක්ෂා හා විද්‍යාගාර පර්යේෂණ සඳහා යොමු කිරීම
- තේ කර්මාන්තයේ අවභාවිතයන් නැවත් වීම සඳහා විශේෂ විමර්ශන සිදු කිරීමට ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා පොලිසිය හා ආරක්ෂක අංශ හා එක් ව කටයුතු කිරීම
- තේ ඉඩම් ලියාපදිංචි කිරීම හා තේ ඉඩම් පිළිබඳ ලේඛන පවත්වා ගැනීම

## 2.1.2. සංවර්ධන ව්‍යාපෘති වලින් ලත් මූලික ජයග්‍රහණ

### i).අක්කර 10 කට වැඩි රජයේ හා පුද්ගලික වතු සඳහා සෘජු වගා කිරීමේ හා පාළු සිටුවීමේ වැඩසටහන

ඉලක්ක ගත මූල්‍ය දිරි දීමනා මගින් ඉඩමේ ඵලදායිත්වය වේගයෙන් ඉහළ නැංවීමට හා සමස්ත තේ නිෂ්පාදනය වැඩි කිරීමට මෙම ඵලදායිතා ඉහළ නැංවීමේ වැඩසටහන සැලසුම් කොට ඇත. මෙම වැඩසටහන මගින් ගුණාත්මක බවෙන් ඉහළ තේ පැලයකට රුපියල් 75 බැගින් අදියර දෙකක දී ලබා දේ. එනම්, තේ පැල සිටුවීමෙන් පසු රුපියල් 60 බැගින් ද ඉතිරි රුපියල් 15 තේ පැල හොඳින් වර්ධනය වූ පසු ද වශයෙනි. තේ වගාව සඳහා ඉඩම හොඳින් උපයෝජනය කිරීම උදෙසා හෙක්ටයාරයකට පැල 12,000 ක ප්‍රමාණයකට සහනාධාරය ලබා දේ. වැඩසටහන සඳහා තේ වගාකරුවන්ගේ සක්‍රීය දායකත්වය සාර්ථකව ලබා ගෙන ඇත.

වගුව 2.1.7: සෘජු වගා සහනාධාර වැඩසටහන 2024

| ස.තේ.කො ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු. මිලි) | ප්‍රමාණය (හෙක්) |
|---|---|---|---|
| ගම්පොළ | 09 | 7.63 | 19.94 |
| බණ්ඩාරවෙල | 04 | 0.54 | 0.81 |
| රත්නපුර | 21 | 16.20 | 23.31 |
| බදුරලිය | 32 | 16.60 | 22.13 |
| මාතර | 46 | 13.97 | 20.58 |
| ගාල්ල | 18 | 10.32 | 14.12 |
| නුවරඑළිය | 04 | 5.74 | 7.68 |
| එකතුව | 134 | 71.00 | 108.57 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ii).තේ පැල පාළු සිටුවීමේ සහනාධාර ව්‍යාපෘතිය

තේ ඉඩම්වල පැල අතර පරතරය අවම කිරීමට හා තේ ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීමට මෙම වැඩසටහන සැලසුම් කොට ඇත. තේ ඉඩම්වල පැල අතර පරතරය පිරවීමට මෙමගින් වගාකරුවන් දිරි ගන්වන අතර පැල සිටුවීමෙන් පසු ගුණයෙන් ඉහළ තේ පැලයක් සඳහා රුපියල් 75 බැගින් එකවර ලබා දේ. තේ වගාව සඳහා ඉඩම හොඳින් උපයෝජනය කිරීම උදෙසා හෙක්ටයාරයකට පැල 12,000 ක ප්‍රමාණයකට සහනාධාරය ලබා දේ.

වගුව 2.1.8: තේ පැල පාළු සිටුවීමේ සහනාධාර වැඩසටහන 2024

| ස.තේ.කො ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු. මිලි) | ප්‍රමාණය (හෙක්) |
|---|---|---|---|
| ගම්පොළ | 21 | 4.31 | 57.60 |
| බණ්ඩාරවෙල | 06 | 1.31 | 17.45 |
| රත්නපුර | 21 | 4.17 | 55.60 |
| බදුරලිය | 17 | 5.06 | 67.50 |
| මාතර | 18 | 3.57 | 47.60 |
| ගාල්ල | 10 | 1.36 | 18.25 |
| නුවරඑළිය | 11 | 2.32 | 31.00 |
| එකතුව | 104 | 22.1 | 295.00 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### iii).අක්කර 10 කට වැඩි රජයේ හා පුද්ගලික වතු සඳහා යාන්ත්‍රිකරණය සහිත තේ නැවත වගා කිරීම හා අලුතින් වගා කිරීම.

තේ වගාව තුළ ඇති දැඩි අභියෝග දෙකක් සඳහා පිළියම් දීමට මෙම කටයුත්ත ආරම්භ කරන ලදී. එනම්, ඉඩමේ ඵලදායිතාවය ඉහළ නැංවීම හා ශ්‍රම හිඟය තුරන් කිරීම ය. නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා බිම් සැකසුම් මට්ටමේ සිට දළු නෙලන අවස්ථාව දක්වා වූ වගාවේ සියලු මට්ටම්වල දී පුළුල් වශයෙන් යන්ත්‍ර සූත්‍ර භාවිතය මෙම ව්‍යාපෘතිය මගින් හඳුන්වා දෙන ලදී.

වගුව 2.1.9: යාන්ත්‍රිකරණ වගා සහනාධාර වැඩසටහන 2024

| ස.තේ.කො ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු. මිලි) | ප්‍රමාණය (හෙක්) | ගෙවීම් කළ ඉඩම් ගණන |
|---|---|---|---|---|
| බදුරලිය | 09 | 8.05 | 32.00 | 04 |
| මාතර | 19 | 5.13 | 26.25 | 06 |
| ගාල්ල | 07 | 1.42 | 9.46 | 03 |
| නුවරඑළිය | 09 | 0.45 | 3.00 | 01 |
| එකතුව | 44 | 15.05 | 70.71 | 14 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### iv).අක්කර 10 කට වැඩි රජයේ හා පුද්ගලික වතු සඳහා විසිරි ජල බිඳු වාරි මාර්ග ක්‍රමය සහිත ප්‍රමිත ගත තේ තවාන් සකස් කිරීම.

අලුතින් ම තේ වගා කිරීම, නැවත වගා කිරීම හා පාළු සිටු වීම යන කටයුතුවල නිරත වගාකරුවන් සඳහා මනා ගුණාත්මයෙන් යුත් තේ පැලයක් ලබාගැනීමට අවස්ථාව සැලසීම මෙම වැඩසටහන් මගින් ඉලක්ක කරනු ලබයි. වර්ෂයකට ගුණාත්මක තේ පැල 50,000 ක් නිපදවීමට සමත් තේ තවාන් පිහිටුවීමට හා මෙහෙයවීමට හැකියාව ඇති තේ තවාන් හිමියන්ට මෙම වැඩසටහන මගින් මූල්‍යාධාර ලබා දේ. තේ තවාන් හිමියන් විසින් අනුයාත වර්ෂ තුනක කාලයක් පුරාවට වසරකට තේ පැල 50,000 ක් බැගින් නිපදවිය යුතු අතර සෑම වසරක ම තේ පැල නිකුත් කිරීමට අදාළව වාරික වශයෙන් මුදල් ලබා දේ.

වගුව 2.1.10: තේ තවාන් පිහිටුවීමේ ව්‍යාපෘතිය 2024

| ස.තේ.කො ප්‍රදේශය | ගෙවීම් කළ ව්‍යාපෘති ගණන | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| ගම්පොළ | 03 | 750,000.00 |
| බණ්ඩාරවෙල | 03 | 750,000.00 |
| රත්නපුර | 03 | 750,000.00 |
| බදුරලිය | 06 | 1,500,000.00 |
| මාතර | 02 | 500,000.00 |
| ගාල්ල | 04 | 1,000,000.00 |
| නුවරඑළිය | 02 | 500,000.00 |
| **එකතුව** | **23** | **5,750,000.00** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### v).පුද්ගලික අංශයේ අක්කර 10-50 අතර මධ්‍යම පරිමාණයේ තේ වතුවල ජල සැපයුම් ක්‍රම ඇති කිරීම

මෙම ජල සැපයුම් ක්‍රම ඇති කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය මගින් නවීන තාක්ෂණික විසඳුම් මගින් තේ වගාව සඳහා ජලය සැපයීම ඉහළ නැංවීම අරමුණු කෙරේ. තේ වගා කරනු ලබන ප්‍රදේශවලට ජලය සැපයීම ප්‍රශස්ත මට්ටමෙන් සිදු කිරීම සඳහා විසිරි ජල බිඳු හා වැස්සුම් ජල තාක්ෂණය ඇතුළු දියුණු ජල සැපයුම් ක්‍රම ක්‍රියාත්මකකිරීම මෙ මගින් සිදුකෙරේ.

වගුව 2.1.11: ජල සැපයුම් ක්‍රම ස්ථාපිත කිරීම 2024

| ස.තේ.කො ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු. මිලි ) | ප්‍රමාණය (හෙක්) | ගෙවීම් කළ ඉඩම් ගණන |
|---|---|---|---|---|
| ගම්පොළ | 3 | 0.85 | 8.5 | 02 |
| රත්නපුර | 13 | 0.1 | 10 | 01 |
| බදුරලිය | 16 | 2.8 | 28 | 03 |
| මාතර | 26 | 10.53 | 83.13 | 15 |
| **එකතුව** | **58** | **14.28** | **129.63** | **21** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### vi).තේ දළු වෙළෙන්දන් හා කර්මාන්තශාලා සඳහා තේ දළු ප්‍රවාහනය සඳහා පෙට්ටි හා ඉන්දියානු (නයිලෝන්) බෑග් ලබාදීමේ මූල්‍ය සහනාධාර

ප්‍රවාහනය කරන ලද තේ දළුවල ගුණාත්මකබව වැඩි කිරීම හා පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2024 වර්ෂයේ දී නව සහනාධාර ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. තේ දළු පරිහරණය හා ප්‍රවාහනය නිසි අයුරින් සිදු කිරීම සඳහා ප්ලාස්ටික් පෙට්ටි හා ඉන්දියානු බෑග් මිලදී ගැනීමට තේ කර්මාන්තශාලා වලට හා තේ දළු වෙළෙන්දන්ට ව්‍යාපෘතිය මගින් සහනාධාර ලබා දේ.

වගුව 2.1.12: ප්ලාස්ටික් බෑග් හා නයිලෝන් බෑග් බෙදා හැරීම 2024

| ස.තේ.කො ප්‍රදේශය | ලද අයදුම්පත් ගණන | බෙදා දුන් පෙට්ටි ගණන | බෙදා දුන් නයිලෝන් බෑග් ගණන | ගෙවූ ණය ගණන | ගෙවූ වෙළෙඳුන් ගණන |
|---|---|---|---|---|---|
| ගම්පොළ | 47 | - | 325 | 03 | 04 |
| බණ්ඩාරවෙල | 73 | 510 | - | - | 11 |
| රත්නපුර | 149 | 371 | 305 | 05 | 10 |
| බදුරලිය | 62 | 985 | - | 04 | 17 |
| මාතර | 34 | 550 | 100 | 13 | - |
| ගාල්ල | 44 | 175 | 245 | 05 | 04 |
| නුවරඑළිය | 105 | 50 | 635 | 04 | 10 |
| **එකතුව** | **514** | **2641** | **1610** | **34** | **56** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### vii).කර්මාන්ත පාදක තේ දළු නෙලන්නන් කණ්ඩායම් (දළු කණ්ඩායම්) නිර්මාණය සඳහා සහනාධාර සහ තේ ඉඩම්වල බිම සැකසීමල කප්පාදුව හා දළු කැඩීම සඳහා යන්ත්‍ර කුලියට ලබාදීම.

තේ අංශයේ පුහුණු ශ්‍රමික හිඟයේ බලපෑම අවම කිරීම සඳහා, ශ්‍රම බලකා සංවර්ධනය හා යාන්ත්‍රිකරණය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නව නියමු සහනාධාර වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන මගින් 8 දෙනෙකුගෙන් යුත් පුහුණු තේ දළු නෙලීමේ කණ්ඩායමක් නිර්මාණය කරන අතර කර්මාන්තශාලා මට්ටමින් යන්ත්‍ර කුලියට ලබා දීමේ සේවය සඳහා සහනාධාර ලබා දෙන ලදී. පුහුණු ශ්‍රම බලකායක් ගොඩ නැගීම හා වැඩි දියුණු කළ උපකරණ භාවිත කිරීම යන මෙම ද්විත්ව ප්‍රවේශය මගින් තේ කර්මාන්තයේ ඵලදායිතාවය හා තිරසාරබව වර්ධනය කිරීමට මෙමගින් අරමුණු කරයි.

### viii).තේ කර්මාන්තශාලා / තේ අපනයන ගබඩා තුළ විදුලි ජනනය සඳහා ඒවායේ වහල මත'සූර්ය බල ශක්ති පද්ධති' සවි කිරීම සඳහා මූල්‍ය සහාය

තේ කර්මන්තශාලාවල වහල මත සූර්ය කෝෂ සවි කිරීම තුලින් ආර්ථික වශයෙන් ලාභදායි පුනර්ජනනීය බල ශක්ති මූලාශ්‍ර භාවිතය දිරි ගැන්වීම සඳහා ලියාපදිංචි නිෂ්පාදකයන්, අපනයනකරුවන් හා තැරැව්කරුවන් සඳහා බැංකු ණය මත 3% ක පොළී සහනයක් ලබා දීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් 2021 වසරේ දී මෙම සහනාධාර යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. මෙහි උපරිම ව්‍යාපෘති කාල සීමාව වසර හතක් වන අතර මාසික ව පොලි සහනාධාර ගෙවීම් සිදු කරයි. 2024 වසරේ දී කර්මාන්තශාලා 33 ක් හා ගබඩා 3 ක් සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 15.78 ක් ගෙවන ලදී.

**ix).ලියාපදිංචි තේ කර්මාන්තශාලා සඳහා ආහාර සුරක්ෂිතතා සහතික (ISO22000/HACCP) සඳහා සහනාධාර**

ගුණාත්මක ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට හා ඒ සඳහා සහතික ලබා ගැනීම කෙරෙහි තේ කර්මාන්තශාලා දිරිගැන්වීම හා පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහනාධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. 2024 වර්ෂය සඳහා, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආහාර සුරක්ෂිතතා සහතික ලබා ගැනීම සඳහා ලියාපදිංචි තේ නිෂ්පාදකයින් 15 දෙනෙකු සඳහා රු. මිලියන 0.5 ක සහනාධාර ගෙවීම් සිදු කරන ලදී.

## 2.1.3. තේ කොමසාරිස් අංශය යටතේ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් මූලික ව්‍යාපෘති

**i).තේ වගා කරනු ලබන දිස්ත්‍රික්කවල Agro Met ස්වයංක්‍රිය කාලගුණ මැදිරි 10 ක් පිහිටු වීම**

නුවරඑළිය, මහනුවර, රත්නපුර, කළුතර සහ මාතර යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි කාලගුණ මැදිරි දහයක් (10) (මන්දාරම් නුවර, කලවාන, වටවල, හිස්පනේ, පේද්‍රෝ වතුයාය, ලූල් කඳුර වතුයාය, පුඩළුඔය, වැලිපැන්න සහ කොටපොළ) ස්ථාපිත කිරීමට නවීන තාක්ෂණ සඳහා වූ ආතර් සී. ක්ලාක් ආයතනය හා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය එක්ව කටයුතු කරන ලදී. මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මුල්‍යාධාර සැපයූ අතර මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ තේ කර්මාන්තය කාබන් උදාසීන කර්මාන්තයක් කරා ලගා වීමයි. තේ ඉඩම්වල පස, බෝග, ගුවන් සහ භූ දර්ශන තත්ත්වය තිරණය කිරීම සඳහා කාලගුණ මැදිරි මගින් වරින් වර රැස් කරන දත්ත වාර්තා භාවිතා කරනු ලැබේ.

**ii).තේ අගය දාමය ඩිජිටල්කරණය කිරීම මාර්ග ගත වේදිකාව සහ ජංගම යෙදුම (ADB ජංගම යෙදුම)**

ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමග එක් ව වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් දියුණුතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය නවීකරණය කිරීම සඳහා ඩිජිටල්කරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබයි. කෘෂිකර්මාන්තයේ ජාත්‍යන්තර පිළිවෙත් සමග අනුකූල වන මෙම ව්‍යාපෘතිය, තේ කර්මාන්තයට සැලකිය යුතු ප්‍රතිලාභ ලබා දීම සඳහා සකස් කළ පුළුල් ඩිජිටල් පද්ධතියක් හඳුන්වා දෙයි. ප්‍රධාන සංරචක අතර ට 'බී දළු 60' (B leaf 60) සහ CT Connect යන ජංගම යෙදුම් දෙකක් ඇතුළත් වන අතර එමගින් පාර්ශ්වකරුවන් අතර කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම අපේක්ෂාව වේ. කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සහතික කරමින් මෙම යෙදුම් සකස් කිරීම හා භාවිතය පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

**iii).තේ නිෂ්පාදකයන් සඳහා පොහොර ණය යෝජනා ක්‍රමය**

සියලු ම තේ වගාකරුවන්ට සහන මිලකට තේ පොහොර ලබා දීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පොහොර සහනාධාර යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. පොහොර මෙට්‍රික් ටොන් 30,000 ක් මිල දී ගැනීම සඳහා සහනාධාර ලබා දීමට මෙම යෝජනා ක්‍රමය මගින් සැලසුම් කරන ලදී. තේ වගාකරුවන්ට අක්කරයකට අවම වශයෙන් කිලෝ ග්‍රෑම් 150 ක (කිලෝ ග්‍රෑම් 50 මිටි තුනක්) සහනාධාර පොහොර මිලදී ගැනීමට අවසර ලබා දුනි. 2024 වසර අවසානයේ දී, තේ කර්මාන්තශාලා හරහා පොහොර මෙට්‍රික් ටොන් 7,904 ක් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ සමිති හරහා පොහොර මෙට්‍රික් ටොන් 8,494.55 ක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මුල්‍යාධාර (මුල දී කිලෝග්‍රෑම් 50 ක බෑගයකට රු. 2000 ක් ලෙසද , පසු ව එය කිලෝ ග්‍රෑම් 50 ක බෑගයකට රු. 4000 ක් වශයෙන් ද) ලබා දෙන ලදී.

වගුව 2.1.13: 2024 වසර තුළ පොහොර සහනාධාර බෙදා හැරීමේ ප්‍රගතිය

| ආයතනය | ප්‍රතිලාභීන් ගණන | සමස්ත ප්‍රමාණය (මෙ.ටොන්) | ගෙවන ලද සහනාධාරය (රු.මිලි ) |
|---|---|---|---|
| ශ්‍රී.ල.තේ.ම | තේ කර්මාන්තශාලා 147 | 7,904.00 | 542.05 |
| කු.තේ.ස.අ | කුඩා තේ වතු හිමියන් 59,987 | 8,494.55 | 480.99 |
| | | 16,398.55 | 1,023.04 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**iv).සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශක (GI) ලියාපදිංචිය ලබා ගැනීමට සහාය වීම**

GI පද්ධතිය ක්‍රියාත්මක කිරීම සියලු ම ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයක් වන අතර මෙම සමස්ත යෝජනා ක්‍රමය තුළට ක්ෂේත්‍ර චාරිකා, අන්තර් ක්‍රියාකාරී දැනුවත් කිරීමේ සැසි, පිරිවිතර පොත (BOS) සකස් කිරීම ආදිය ඇතුළත් වේ. දේශීය වශයෙන් සාමූහික කළමනාකරණ සංවිධානය විසින් පිරිවිතර පොත ලියාපදිංචි කිරීම එනම්, 2024 වර්ෂය තුළ දෙආකාර නිතිමය රාමුවක් යටතේ ජාත්‍යන්තර සහතික කිරීම් එනම්, වෙළඳ ලකුණක් හෝ සහතික කිරීමේ ලකුණක් සහ නිෂ්පාදනයේ කීර්ති නාමය සහ අඛණ්ඩතාව ප්‍රවර්ධනය කිරීමට අමතරව GI සඳහා පුළුල් ආරක්ෂාවක් ලබා දෙන පද්ධතියක් ඇතුළත් වේ. මෙම ලියාපදිංචිය ලබා ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- පිරිවිතර පොත සකස් කිරීම හා පාලන සැලැස්ම සකස් කිරීම අවසන් කිරීම හා අධිකාරිය විසින් අනුමත කිරීම
- මධ්‍ය පරිමාණ වතු හිමියන්ගේ සංගමය සහ සමස්ත ලංකා හරිත තේ අලෙවිකරුවන්ගේ සංගමය ඇතුළු ව ජාතික මට්ටමේ ප්‍රධාන සංගම් ස්ථාපිත කිරීම
- තේ අපනයනකරුවන්, තේ නිෂ්පාදකයින්, හරිත තේ දළු අලෙවිකරුවන් සහ තේ අංශයේ අදාළ ආයතනවලට අනුබද්ධ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

අයදුම්පත යුරෝපීය සංගමයට ඉදිරිපත් කරන ලද අතර ලියාපදිංචිය දැනට යුරෝපා සංගමය විසින් කරනු ලැබේ

**v).ඉරාන තේ තොග සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම**

ඉරානය ට අපනයනය කරනු ලබන නිෂ්පාදන ගුණාත්මක බවෙන් යුතු ව සිදු කරන බවට තේ නිපදවන රටවල රාජ්‍ය ආයතන වෙතින් තත්ව සහතිකයක් ඉරාන බලධාරීන් අපේක්ෂා කරයි. ඉරානය තම වෙළඳපොළ වෙතට අපනයනය කරනු ලබන නිෂ්පාදන, යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) සහ යහපත් සනීපාරක්ෂක පිළිවෙත් (GHP) අනුව සිදුකරන බවට සහතිකකරණයක් බලාපොරොත්තුවේ. එම අවශ්‍යතාවයන්ට අනුගත වීම සඳහා ඉරානයට නිම් තේ

අපනයනය කිරීමට අපේක්ෂිත අපනයනකරුවන් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් GMP සහ GHP සහතිකය නිකුත් කිරීමේ වැඩසටහනක් පවත් වන ලද අතර සතුටුදායක පුළුල් විගණනයකින් පසු ව සහතිකය නිකුත් කරන ලදී.

**vi).මනා කෘෂිකාර්මික භාවිතයන් (GAP) ක්‍රියාත්මක කිරීම.**

දැනුවත්භාවය ඉහල නැංවීම, මග පෙන්වීම සහ නිෂ්පාදන ක්‍රියාවලිය පුරාවට ආරක්ෂාව සහ සනිපාරක්ෂක ප්‍රමිතීන් පවත්වා ගැනීම සහතික කිරීම සහ අවසන් වශයෙන් පාරිභෝගිකයින්ට ගුණාත්මක නිෂ්පාදනයක් ලබා දීම සඳහා ක්ෂෙත්‍ර මට්ටමේදී යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. නිමි තේ අපවිත්‍ර වීමේ අවදානම අවම කිරීම හෝ නැති කිරීම සඳහා මෙම වැළැක්වීමේ ප්‍රවේශය ඉතා ප්‍රයෝජනවත් වේ. සැපයුම් දාමය පුරාවට ගුණාත්මකභාවය හා ආරක්ෂාව සහතික කරමින් තේ වගාව, අස්වනු නෙලීම සහ සැකසුම් කර්මාන්තශාලා වෙත තේ දළු ප්‍රවාහනය මෙහෙයවීම සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) ක්‍රියාත්මක කර ඇත. තේ සම්බන්ධ ප්‍රධාන පාර්ශවකරුවන් සමග සාකච්ඡා කිහිපයක් පවත්වා GAP ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ අත් පොතක් සකස් කර ඇති අතර, මහජන අදහස් ලබා ගනිමින් අත්පොත තවදුරටත් සමාලෝචනයට බඳුන් කරනු ලැබේ.

**vii).නැවුම් තේ මංගල්‍යය 2024**

තේ කර්මාන්තයේ සමෘද්ධි උදෙසා ආශිර්වාද අපේක්ෂා කරමින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ ප්‍රධාන සංස්කෘතික උත්සවය වන වාර්ෂික නැවුම් තේ මංගල්‍යය තේ වගා කරන සියලු ම දිස්ත්‍රික්කවල, ආගමික ස්ථාන කිහිපයක දී සියලු ම ආගම් නියෝජනය කරමින් අඛණ්ඩ ව 2024 වර්ෂයේ දීත් සමරනු ලැබිය.

සෑම වසරක ම සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවයෙන් පසුව තේ වතුවල පළමු අස්වැන්නෙන් නිපදවන ලද තේ, පන්සල්, පල්ලි, මුස්ලිම් පල්ලි සහ කෝවිල් වැනි ආගමික ස්ථානවලට පූජා කිරීම නැවුම් තේ මංගල්‍යය ලෙස හැඳින්වේ.

2024 වර්ෂයේ දී, තේ කර්මාන්තයට අනුබද්ධ සියලු ම තේ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් කොටපොළ ඓතිහාසික ගැටබරු රජමහා විහාරයේ දී ප්‍රධාන උත්සවය පවත්වන ලදී.

## 2.2. තේ අපනයන අංශය

1959 අංක 16 දරණ (බදු සහ අපනයන පාලනය) පනතේ බලතල හා කාර්යන් සහ 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ පවතින රෙගුලාසි පරිපාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අපනයන අංශය විසිනි. තේ අපනයනකරුවන්, තේ ඇසුරුම්කරුවන්, තේ ගබඩා, ආනයනකරුවන් ලියාපදිංචි කිරීම එමෙන් ම තේ ඇසුරුම් වර්ගීකරණය කිරීම මෙම අංශයේ මූලික වගකීම් යටතට ගැනේ. එයට අමතර ව තේ ලබා ගැනීම, තේ සඳහා අවම ප්‍රමිතීන් පැනවීම, තේ අපනයනය සඳහා අනුමැතිය ලබා දීම, තේ අපනයනය පිළිබඳ සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යාම සහ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ අපනයනය අධීක්ෂණය කිරීම ද සිදු කරනු ලබයි.

තව ද, ශ්‍රී ලංකා තේවල කීර්ති නාමය තහවුරු කරමින් තේ අපනයනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ සාමූහික ප්‍රයත්නයක් වශයෙන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය ශ්‍රී ලංකා රේගුව සමග එක් ව ශ්‍රී ලංකා රේගු අපනයන පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයේ දී තේ තොග සම්බන්ධයෙන් ඒකාබද්ධ ව විමර්ශන පවත්වනු ලැබේ. අපනයනකරුවන්ගේ ගබඩාවල තේ සැකසීමේ දී ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම උදෙසා, HACCP තත්ත්ව සහතිකය ලබා ගැනීම, තම මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම සඳහා සියලු ම ගබඩාවලට අනිවාර්ය අවශ්‍යතාවයක් බව ප්‍රකාශයට පත් කර ඇත. රට අමතරවල සියලු අපනයන ගබඩා සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) පිළිබඳ ඇගයීම් සිදු කරනු ලැබේ.

### 2.2.1. ලියාපදිංචි කිරීම්

සියලු ම ලියාපදිංචි තේ අපනයනකරුවන් අපනයනයට අවසර ලබා ගැනීම සඳහා ස්වයංක්‍රීය රේගු දත්ත පද්ධතිය (ASYCUDA) හරහා තේ අපනයන අංශයට වෙනත් අවශ්‍ය ලියකියවිලි සමග රේගු භාණ්ඩ ලියවිලි (CUSDECS) භාර දිය යුතු ය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අපනයනය කිරීමට සූදානම් තේ තොගය අපනයනය සඳහා අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව පවතින්නේ ද යන්න සොයා බලනු ලැබේ.

වගුව 2.2.1: අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, ගබඩාවන්, ආනයනකරුවන් සහ නිෂ්පාදන තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ තත්ත්වය.

| ලියාපදිංචි කිරීම් | 2024.01.01 දිනට | නව ලියාපදිංචි කිරීම් | 2024.12.31 දිනට මුළු එකතුව |
|---|---|---|---|
| අපනයනකරුවන් | 421 | 36 | 457 |
| ඇසුරුම්කරුවන් | 421 | 36 | 457 |
| දේශීය ඇසුරුම්කරුවන් | 210 | 140 | 350 |
| ගබඩාවන් | 292 | 28 | 310 |
| ආනයනකරුවන් | 150 | 07 | 157 |
| නිෂ්පාදන තැරැව්කරුවන් | 8 | - | 8 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකා තේ සමග මිශ්‍රිත වෙනත් සම්භවයක් සහිත විශේෂිත තේ අඩංගු සිල්ලර බහාලුම් (ආනයන හා අපනයන 1981) ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසි යටතේ අපනයනය කරනු ලැබේ. එවැනි බහාලුම් /ඇසුරුම් මත "ශ්‍රී ලංකාවේ දී ඇසුරුම් කරන ලද ශ්‍රී ලාංකීය හා වෙනත් සම්භවයක් සහිත තේ" හෝ" ශ්‍රී ලංකාවේ ඇසුරුම් කරන ලද වෙනත් සම්භවයක් සහිත තේ" යන්න පමණක් සඳහන් කළ යුතු අතර සියලුම බහාලුම් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතු ය.

## 2.2.2. තේ ආනයනය කිරීම

තේ කිලෝ ග්‍රෑම් 9,555,296.44 ක් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආනයන බලපත්‍ර 761 ක් නිකුත් කර ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වකවානුව තුළ සැබෑ ආනයන ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 8,342,184.49 කි.

වගුව 2.2.2 : තථ්‍ය ආනයන - 2024 ජනවාරි - දෙසැම්බර්

| රට | වර්ගය | ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | CIF අගය (රු) | අගය (රු) |
|---|---|---|---|---|
| චීනය | කළු තේ - CTC | 500.00 | 4,275.00 | 2,137,500.00 |
| | කළු තේ - විශේෂ | 33,395.00 | 2,120.75 | 70,822,458.00 |
| | හරිත තේ – CTC | 36,560.00 | 343.68 | 12,565,020.00 |
| | හරිත තේ - විශේෂ | 1,815,990.04 | 803.72 | 1,459,551,710.75 |
| | Oolong තේ - විශේෂ | 58,682.48 | 1,238.50 | 72,678,461.57 |
| | Puerh තේ - විශේෂ | 8,990.00 | 2,282.97 | 20,523,967.10 |
| | සුදු තේ - විශේෂ | 22,867.00 | 1,403.94 | 32,103,923.12 |
| | **අනු එකතුව** | **1,976,984.52** | **844.91** | **1,670,383,040.54** |
| ජර්මනිය | කළු තේ - CTC | 1,152.00 | 3,599.98 | 4,147,176.96 |
| | කළු තේ - විශේෂ | 938.00 | 4,284.69 | 4,019,035.03 |
| | හරිත තේ - විශේෂ | 908.00 | 4,955.04 | 4,499,172.27 |
| | Oolong තේ - විශේෂ | 50.00 | 18,329.17 | 916,458.50 |
| | සුදු තේ - විශේෂ | 105.00 | 17,464.17 | 1,833,738.87 |
| | **අනු එකතුව** | **3,153.00** | **4,889.18** | **15,415,581.63** |
| ඉන්දියාව | කළු තේ - CTC | 2,233,164.00 | 495.66 | 1,106,900,141.87 |
| | කළු තේ - විශේෂ | 354,306.70 | 1,373.11 | 486,501,971.28 |
| | හරිත තේ - විශේෂ | 44,780.00 | 1,575.10 | 70,533,127.00 |
| | **අනු එකතුව** | **2,632,250.70** | **632.13** | **1,663,935,240.15** |
| ජපානය | හරිත තේ - විශේෂ | 26,997.34 | 5,033.94 | 135,903,017.12 |
| | **අනු එකතුව** | **26,997.34** | **5,033.94** | **135,903,017.12** |
| කෙන්යාව | කළු තේ - CTC | 3,185,425.93 | 494.29 | 1,574,528,138.32 |
| | **අනු එකතුව** | **3,185,425.93** | **494.29** | **1,574,528,138.32** |
| මලාවි | කළු තේ - CTC | 20,880.00 | 709.80 | 14,820,624.00 |
| | **අනු එකතුව** | **20,880.00** | **709.80** | **14,820,624.00** |
| මියන්මාරය | කළු තේ- CTC | 1,503.50 | 1,216.28 | 1,828,674.50 |
| | **අනු එකතුව** | **1,503.50** | **1,216.28** | **1,828,674.50** |
| තායිවානය | Oolong Tea - විශේෂ | 30.00 | 18,513.09 | 555,392.70 |
| | **අනු එකතුව** | **30.00** | **18,513.09** | **555,392.70** |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | කළු තේ - CTC | 453,860.50 | 1,087.97 | 493,787,171.77 |
| | **අනු එකතුව** | **453,860.50** | **1,087.97** | **493,787,171.77** |
| එක්සත් රාජධානිය | කළු තේ – CTC | 3,247.00 | 2,167.63 | 7,038,325.74 |
| | කළු තේ– විශේෂ | 5,220.00 | 3,318.62 | 17,323,214.40 |
| | **අනු එකතුව** | **8,467.00** | **2,877.23** | **24,361,540.14** |
| වියට්නාමය | හරිත තේ - විශේෂ | 32,632.00 | 371.46 | 12,121,610.00 |
| | **අනු එකතුව** | **32,632.00** | **371.46** | **12,121,610.00** |
| **මුළු එකතුව** | | **8,342,184.49** | **672.20** | **5,607,640,030.88** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### 2.2.3. නිමි තේ සඳහා ISO 3720 අවම තත්ත්ව ප්‍රමිතිය

දෙන ලද සියලු ම තේ නියැදි සහ තේ කර්මාන්තශාලාවලින් ලබා ගන්නා ලද සියලු ම තේ නියැදි, ආනයනයෙන් පසු ලබා ගන්නා ලද තොග හා අපනයනය සඳහා සූදානම් කරන ලද තොග ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පත් කරන ලද තේ රස බලන්නන්ගේ කමිටුව විසින් අදාළ තේ වර්ගය අවසර ලත් වර්ගයට අයත් වේ ද, ISO 3720 ප්‍රමිතියට අනුකූල වේ ද, කිසිදු අපවිත්‍රතාවයකින් තොර වේ ද යන්න පිළිබඳ පරීක්ෂාවට ලක් කරනු ලබයි. එමගින් අපනයනයට සුදුසු තේ සඳහා පමණක් අවසර දෙනු ලබයි.

වගුව 2.2.3: නියැදිවල ගුණාත්මකබව සම්බන්ධ තොරතුරු

| නියැදි වර්ගය | නියැදි ගණන | ISO ප්‍රමිතියට පහළින් පවතින සහ අපවිත්‍රතා සහිත බවට හඳුනා ගත් ප්‍රමාණය |
|---|---|---|
| වෙන්දේසියට පෙර අපනයන අංශය මගින් ලබා ගත් නියැදි | 4,383 | 470 |
| වෙන්දේසියට පෙර ඉවත් කරන ලද නියැදි (කමිටුව විසින්) | 732 | 2,478 |
| නැවි ගත කිරීමට පෙර | 12,150 | 4 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**a).පරිභෝජනයට නුසුදුසු තේ විනාශ කිරීම**

වෙන්දේසියට පෙර හා නැවි ගත කිරීමට පෙර සහ විශේෂ පරීක්ෂණ වල දී මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට හඳුනා ගනු ලබන තේවල ස්වභාවික ගුණය වෙනස් කිරීම තේ විනාශ කිරීම අපනයන අංශයේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. මෙම අංශය මගින් 2024 වසරේ දී තේ කිලෝ ග්‍රෑම් 165,360 ක් භාවිතයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලදී.

**b).තේ නැවත ලබා ගැනීම**

විදේශීය ගැනුම්කරු විසින් යම් තේ තොගයක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, දේශීය අපනයනකරුට එය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතිය ඇති ව නැවත ලබා ගැනීමට සිදු වේ. අපනයනය හෝ නැවත භාවිතය සඳහා අවසර ලබා දීමට පෙර මෙම තොගය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නැවත පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

**c). ඉවත් කළ තේ තොග**

ඉහල අමු තන්තු මට්ටමක් සහිත තේ තොග (16.5% ට වඩා වැඩි) සංයුක්ත ගාස්තුවක් මත නැවත වැඩි දියුණු කිරීම් සඳහා කර්මාන්ශාලාවෙත යවන අතර වැඩිදියුණු කරන තේ, පෙර ඉන්වොයිස් අංකයෙන්ම නැවත නාමාවලිය සකස් කොට වෙන්දේසිය වෙත යැවිය හැක.

### 2.2.4. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන කාර්ය සාධනය

ඉන්දු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (TRQ) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, මනාප ගාස්තු අනුපාතයේ හි සැලකිය යුතු උපයෝජනයක් 2024 වර්ෂය තුළ දී වාර්තා වී නොමැත.

වගුව: 2.2.4 නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතය භාවිත කිරීම

| නිදහස් වෙළඳ ගිවිසුම | වසරකට වෙන් කරන ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | මුළු අපනයන (කිලෝ ග්‍රෑම්) |
|---|---|---|
| ඉන්දු-ශ්‍රී ලංකා | 15,000,000 | 43,935.49 |
| පාකිස්තාන-ශ්‍රී ලංකා | 10,000,000 | 2.80 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### 2.2.5. තේ අපනයන ඇසුරුම් කර්මාන්තශාලා වැඩි දියුණු කිරීම හෝ නවීකරණය කිරීම සඳහා පොළී යෝජනා සහනාධාර ක්‍රමය

අපනයනකරුවන්ට පහසුකම් සලසමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ණය පොළී සහනාධාර ක්‍රමයක් දියත් කර ඇත. එහි දී වසර 5 ක කාලයක් සඳහා රුපියල් මිලියන පහක් දක්වා වාර්ෂිකව ගෙවිය යුතු පොළියෙන් උපරිම 50% ක පොළී සහනාධාරයක් උපරිම 10% ක පොළී අනුපාතිකයක් සඳහා පොළී අපනයනකරුට හිමි වේ. ගෝලීය තේ වෙළෙඳපොළ තුළ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා නිෂ්පාදන විවිධාංගීකරණය, නිෂ්පාදන තත්ත්වය ඉහළ නැංවීම, නිෂ්පාදන සඳහා ඉහළ මිලක් එකතු කිරීම සහනාධාර යෝජනා ක්‍රමයේ අරමුණ වේ.

## 2.3. තේ ප්‍රවර්ධන අංශය

දේශීය හා විදේශීය වෙළඳපොළවල විවිධ පුළුල් කාණ්ඩ යටතේ ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තේ ප්‍රවර්ධන අංශයේ වගකීම වේ.

i. භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම
ii. ජාත්‍යන්තර ප්‍රවර්ධන කාර්යයන් හා උත්සව
    2.1.රුසියාව/CIS කලාපය
    2.2.මැද පෙරදිග හා ගල්ෆ්
    2.3.පෙරදිග කලාපය, ඕෂනියා කලාපය, ජපාන වෙළඳපොළ
    2.4.තේ ප්‍රවර්ධන ඒකකය, චීනය
    2.5.යුරෝපා කලාපය
    2.6. ඇ.එ.ජ, උතුරු හා දකුණු ඇමරිකානු කලාපය
iii. සන්නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමය
iv. 5% දිරි දීමනා යෝජනා ක්‍රමය
v. බුද්ධිමය දේපල පිළිබඳ කාරණා - සිංහ ලාංඡනය, සිලෝන් තේ හා ඕසෝන් ලාංඡනය ලියාපදිංචිය
vi.දේශීය ප්‍රවර්ධන (ආරාධිත ජනමාධ්‍යවේදී වැඩසටහන සහ බණ්ඩාරනායක ගුවන්තොටුපොළ / මහින්ද රාජපක්ෂ ගුවන් තොටුපොළ /කොළඹ සිදු කරන ලද සංචාරක ප්‍රවර්ධන කටයුතු / වෙළඳ ප්‍රදර්ශන / අවස්ථා)
vii. සිලෝන් ශිල්පීය තේ ප්‍රවර්ධනය
viii.ශ්‍රී ලංකාව හා ඉරානය අතර අවබෝධතා ගිවිසුම - තෙල් සඳහා තේ හුවමාරුව

## 2.3.1. භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම

තේ සම්බන්ධයෙන් නියාමන සහ ප්‍රවර්ධන කටයුතු සිදු කරනු ලබන රටේ ඉහළ ම ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලය (SLTB), 'ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ප්‍රංශ කෘෂිකාර්මික පර්යේෂණ මධ්‍යස්ථානය' (CIRAD), 'ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS)' සහ, 'ප්‍රංශ සංවර්ධන ආයතනය (AFD)' හි මූල්‍ය සහයෝගය සහිතව, 2021 දෙසැම්බර් මාසයේ සිට "භූගෝලීය දර්ශක (GI) සහ ජාත්‍යන්තර තත්ත්ව සහතික සකස් කිරීම තුළින් සිලෝන් තේ සඳහා අගය නිර්මාණය" කිරීමේ ව්‍යාපෘතිය සිදු කර ගෙන යනු ලබයි. වසර 4 ක කාලයක් සඳහා 2021 දෙසැම්බර් 7 වන දින ගිවිසුම අත්සන් කරන ලද අතර ව්‍යාපෘතිය සඳහා AFD වෙතින් ලැබෙන මූල්‍ය ප්‍රදානය යුරෝ මිලියන එකක් වේ.

මෙම ව්‍යාපෘතියේ ගෝලීය අරමුණ වන්නේ "සිලෝන් තේ" සඳහා භූගෝලීය දර්ශක සහතිකයක් සහ අදාළ ගුණාත්මකභාවය හා තිරසාරභාවය සහතික කිරීමේ ක්‍රම ස්ථාපිත කිරීමට සහාය වීම යි. පහත සඳහන් නිමවුම් අත් කර ගැනීම මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කරයි.

- සිලෝන් තේ භූගෝලීය දර්ශකයක් වශයෙන් ලියාපදිංචි කිරීම අරමුණු කර ගත් කේන්ද්‍ර ගත උපාය මාර්ගයක් කරා සිලෝන් තේ වටිනාකම් දාමය තුළ භාවිතයන් සහ ක්‍රමානුකූල සීමාවන් සිතියම් ගත කිරීම
- භූගෝලීය දර්ශක පිරිවිතරයන් සහ අදාළ භාවිතයන් පිළිබඳ සාමූහික අර්ථ දැක්වීමට සහාය වීම සහ භූගෝලීය දර්ශක ලියාපදිංචිය සඳහා ඒවා ලේඛන ගත කිරීම
- නිෂ්පාදනය, නිෂ්පාදන ක්‍රමය සහ අගය දාමය සොයා ගැනීමේ හැකියාව ආදිය මෙහෙයවීම සඳහා ලියකියවිලි සහ මෙහෙයවීමේ සුදානම ඇතුළුව භූගෝලීය දර්ශක යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අත්හදා බැලීම
- භූගෝලීය දර්ශක යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පුළුල් මට්ටමෙන් සිදු කිරීම සහ අලෙවිකරණ උපාය ආරම්භ කිරීම සහ තෝරා ගත් වෙළඳපොළවල සිලෝන් තේවල පැවැත්ම කරගත් භූගෝලීය දර්ශක සහ වටිනාකම ශක්තිමත් කිරීමට සැලසුම් කිරීම

ඒ අනුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2024 සැප්තැම්බර් 26 වන දින සිලෝන් තේ GI අයදුම්පත යුරෝපීය කොමිසම වෙත ඉදිරිපත් කර ඇත.

සිලෝන් තේ සඳහා භූගෝලීය සහතික පිරිනැමීම මගින් පහත සඳහන් පරිදි ප්‍රවර්ධන හා ආරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ප්‍රතිලාභ කිහිපයක් අත් වේ.

- ගෝලීය වෙළඳපොළ තුළ සිලෝන් තේ පිළිබඳ අවභාවිතයන් /වංචා වලින් ආරක්ෂා කිරීම
- නිෂ්පාදනයේ සම්භවය පිළිබඳව සහතික වීමක් ලබා දීම
- අවසාන නිෂ්පාදනයේ ගුණාත්මකබව පිළිබඳ සහතිකයක් ලබා දීම
- වංචා සහ අවභාවිතයන් වැළැක්වීම සඳහා ශක්තිමත් හඳුනාගැනීම් යාන්ත්‍රණයක් ලැබීම
- අගය දාමයට සම්බන්ධ සියලුම පාර්ශවකරුවන් අතර කර්මාන්තයේ අග්‍රගන්‍ය බව ප්‍රචලිත කිරීම
- නව වෙළඳපොළවල් සඳහා අවස්ථා විවෘත කිරීම
- ගුණාත්මක නිෂ්පාදනයක් සඳහා ඉහළ මිලක් ලැබීම තුළින් අවසානයේ ගුණාත්මක බවෙන් ඉහළ තේ දළු සපයන ගොවීන්ට (වගාකරුවන්ට) ඉහළ මිලක් ලැබීම

## 2.3.2. ජාත්‍යන්තර ප්‍රවර්ධන කාර්යයන් හා උත්සව

### රුසියාව/CIS කලාපය

#### i.ප්‍රොඩෙක්ස්පෝ 2024 (Prodexpo)

ආහාර නිෂ්පාදන, පාන හා අමු ද්‍රව්‍ය පිළිබඳ 31 වන ජාත්‍යන්තර ප්‍රදර්ශනය - ප්‍රොඩෙක්ස්පෝ 2024 - මොස්කව් Expo මධ්‍යස්ථානයේ දී 2024 පෙබරවාරි මස 5 සිට 9 දක්වා පැවැත්විණි. තේ කර්මාන්තයේ ප්‍රධානම ප්‍රදර්ශන වලින් එකක් වන මෙම වසරේ පවත්වන ලද ප්‍රදර්ශනයට රටවල් 40 කින් සමාගම් 2,195 කට අධික සංඛ්‍යාවක් සහභාගී වූ අතර, මස් හා මාංශ නිෂ්පාදන, කිරි නිෂ්පාදන (කිරි, චීස් සහ අයිස්ක්‍රීම්), තේ, කෝපි, පාන වර්ග හා අනෙකුත් ආහාර නිෂ්පාදන අංශ ඇතුළු ප්‍රධාන වශයෙන් පවතින අංශවල සුවිශේෂී නිෂ්පාදන මෙහි දී ප්‍රදර්ශනය කරන ලදී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහාය ඇති ව රුසියාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තේ ප්‍රවර්ධන ඒකකය (TPU) මොස්කව් හි TPU සමග ප්‍රදර්ශනයට සහභාගී විය. ඇතැම් ශ්‍රී ලාංකික තේ සමාගම් - එනම්, Millennium Teas (Pvt) Ltd, Ceylon Tenny Teas, Samley Teas, Maltras International (Pvt) Ltd සහ Ceylon Tea Land (Pvt) Ltd - විසින් තම නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී.





### ii.Uzfood 2024

UzFood 2024 හි 23 වන සංස්කරණය වූ ආහාර සහ අමුද්‍රව්‍ය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රදර්ශනය 2024 මාර්තු 26 සිට 28 දක්වා උස්බෙකිස්තානයේ ටෂ්කන්ට් හි 'Uzexpocentre' හි දී පැවැත්විණි. උස්බෙකිස්තානයේ ආහාර කර්මාන්තය පිළිබඳ ප්‍රමුඛතම ප්‍රදර්ශනය වන UzFood ප්‍රදර්ශනය මගින් විශේෂයෙන් මධ්‍යම ආසියාවේ. දේශීය හා ගෝලීය යන දෙඅංශයේම ප්‍රමුඛ පෙළේ නිෂ්පාදකයින්, සැපයුම්කරුවන් සහ බෙදාහරින්නන් ආකර්ෂණය කරගනු ලබයි.

මොස්කව් හි තේ ප්‍රවර්ධන ඒකකය විසින් මෙම ප්‍රදර්ශනයේ දී සිලෝන් තේ මණ්ඩපයක් ඉදි කරන ලදී. ශ්‍රී ලාංකික තේ සම්බන්ධයෙන් වූ ප්‍රමුඛ සමාගම් දෙකක් වන සිලෝන් ෆ්‍රෙෂ් ටීස් පුද්ගලික සමාගම (Ceylon Fresh Teas Pvt Ltd) සහ HVA Foods PLC විසින් මණ්ඩපය අසල වූ යාබද කුටි වල තම නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී.




ප්‍රදර්ශනයට අමතරව, මොස්කව් හි තේ ප්‍රවර්ධන ඒකකය (TPU) විසින් සිංහ ලාංඡනය සහිත සිලෝන් තේ සන්නාම ප්‍රවර්ධනය කිරීම සහ පාරිභෝගිකයන් අතර දැනුවත්භාවය වැඩි දියුණු කිරීම අරමුණු ඇතිව වෙන ම සිලෝන් තේ සන්නාම සක්‍රිය කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙහි දී 'Eco' සුපිරි වෙළඳසැලේ සහ 'Katartal Bazar' හි නොමිලේ තේ සාම්පල ලබා දුන් අතර, මෙම කටයුත්ත සඳහා කලාපයේ වෙළඳපොළ තුළ සුලභව පවතින 'Impra', 'Dilmah' සහ 'Tudor' යන සන්නාම තෝරා ගන්නා ලදී.




### iii.Interfood අසර්බයිජාන් - 2024

29 වන අසර්බයිජාන් ජාත්‍යන්තර ආහාර ප්‍රදර්ශනය වන ඉන්ටර්ෆුඩ් අසර්බයිජාන් 2024 ප්‍රදර්ශනය මැයි 15 සිට 17 දක්වා බාකු එක්ස්පෝ (Baku Expo) මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. කැස්පියන් කලාපයේ ආහාර කර්මාන්තය සඳහා වඩාත් ම වැදගත් වෙළඳ ප්‍රදර්ශනයක් වන මෙම උත්සවය මගින් ප්‍රධාන කර්මාන්තකරුවන් ආකර්ෂණය කර ගන්නා ලදී. සිලෝන් තේ සම්බන්ධයෙන් පවතින ප්‍රාථමික වෙළඳපොළක් වශයෙන් අසර්බයිජානයේ වැදගත්කම හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මොස්කව් හි තේ ප්‍රවර්ධන ඒකකය විසින් සිලෝන් තේ ප්‍රදර්ශන කුටිය සකස් කරන ලදී. Ceylon Tea Land (පුද්) සමාගම ද යාබද කුටියක දී මොස්කව් හි තේ ප්‍රවර්ධන ඒකකයේ කටයුත්තට සම්බන්ධ විය.






ප්‍රදර්ශනයට වඩාත් සාර්ථකව පැවැත්වීමට උපකාර කරමින් මොස්කව් හි තේ ප්‍රවර්ධන ඒකකය මගින් වෙන ම සිලෝන් තේ සන්නාම සක්‍රිය කිරීමේ වැඩසටහනක් පැවැත් විය. මෙම කටයුත්තේ දී බාකු හි ප්‍රධාන පෙළේ සුපිරි වෙළඳපොළ දාම දෙකක් වන "මෙගා ස්ටෝර්" සහ "ඕකෙන්" හි නොමිලේ සිලොන් තේ සාම්පල ලබා දෙන ලදී. මෙම කටයුත්ත මගින් විශේෂයෙන් අරමුණු කරන ලද්දේ සිංහ ලාංඡන සහතිකය සහිත සැබෑ සිලෝන් තේ වෙළඳ නාම ප්‍රවර්ධනය කිරීම, සිලෝන් තේවල ගුණාත්මකභාවය සහ සම්භවය පිළිබඳ පාරිභෝගික දැනුවත්භාවය වැඩි කිරීම සහ වෙළඳ නාමය සම්බන්ධයෙන් අසර්බයිජාන් වෙළඳපොළේ පවතින පිළිගැනීම වඩාත් ශක්තිමත් කිරීම යි.




### iv.කසකස්තානයේ ලෝක ආහාර ප්‍රදර්ශනය

2024 නොවැම්බර් 13 සිට 15 දක්වා කසකස්තානයේ අල්මාටි හි දී FoodExpo Qazaqstan 2024 වෙළඳ ප්‍රදර්ශනය පවත්වන ලදී. පුද්ගලික අංශයේ තේ සමාගම් වන Basilur Tea Export (Pvt) Ltd සහ Premier Natural Teas (Pvt) Ltd මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගි විය.

## මැද පෙරදිග හා ගල්ෆ් කලාපය

### i.සෞදි අරාබියේ සෞදි HORECA ප්‍රදර්ශනය

2024 පෙබරවාරි 5 සිට 7 වන දින දක්වා සෞදි HORECA ප්‍රදර්ශනය සෞදි අරාබියේ ජෙඩා හි දී පැවැත්විණි. ජාත්‍යන්තර ගැනුම්කරුවන්ට තම උසස් තේ නිෂ්පාදන ප්‍රදර්ශනය කරමින් සිලෝන් තේ මණ්ඩපය තුළ ප්‍රමුඛ ශ්‍රී ලාංකික තේ සමාගම් හතරක් සහභාගි විය. එනම්, LOLC Holdings PLC, Stassen Exports (Pvt) Ltd, Continental Tea (Pvt) Ltd සහ Expo Teas Ceylon (Pvt) Ltd යන සමාගම් ය.

### ii.GUL FOOD 2024 ප්‍රදර්ශනය

මැදපෙරදිග සහ ගල්ෆ් කලාපයේ විශාලතම ආහාර පාන වෙළඳ ප්‍රදර්ශනය වන Gul food 2024 ප්‍රදර්ශනය 2024 පෙබරවාරි 19 සිට 23 දක්වා ඩුබායි හි දී පවත් වන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙම උත්සවයේ දී සිලෝන් තේ ප්‍රදර්ශන කුටි දෙකක් පැවැත් වූ අතර, තම ඉහළ පෙළේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා තේ සමාගම් 21 කට ඉඩ පහසුකම් සැලසී ය.











### iii. රියාද් හි සවුදි ෆුඩෙක්ස් 2024

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රදර්ශනයේ දී සිලෝන් තේ ප්‍රදර්ශන මණ්ඩපයක් සකස් කරන ලද අතර, ඒ සඳහා සමාගම් පහක් සහභාගී විය: Meezan & Company (Pvt) Ltd, Ceylon Tea Land (Pvt) Ltd, Expoteas Ceylon (Pvt) Ltd, Enrich Tea & Food Exports (Pvt) Ltd, සහ A.F. Jones Exporters Ceylon (Pvt) Ltd. මෙම සමාගම්වලට ඔවුන්ගේ උසස් තේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට සහ නව ව්‍යාපාරික සම්බන්ධතා ඇති කර ගැනීමට මෙම ප්‍රදර්ශනයේ දී ඉඩ සැලසිණි.




### iv.ඩුබායිහි දී මැද පෙරදිග කාබනික හා ස්වභාවික නිෂ්පාදන ප්‍රදර්ශනය 2024

අපනයන සමාගම් හතරක සත්කාරකත්වය සහිත ව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රදර්ශනයේ දී සිලෝන් තේ ප්‍රදර්ශන කලාපයක් සංවිධානය කරන ලදී Gemi Teas Colombo (Pvt) Ltd, TDK Trade Links (Pvt) Ltd, Kandrick Tea Beverages Lanka සහ Forest Hill Tea (Pvt) Ltd වේ.

### v.Agro Pack Iraq in Erbil (2024 නොවැම්බර් 25 – 28)

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඉරාකයේ එර්බිල් හි ඇග්‍රෝ පැක් ප්‍රදර්ශනය සඳහා සිලෝන් තේ ප්‍රදර්ශන කුටියක් පවත්වන ලදී. ඒ සඳහා අපනයනකරුවන් දෙදෙනෙකු වන Divine Nature Teas (Pvt) Ltd සහ Expo Teas Ceylon (Pvt) Ltd සහභාගී විය.

## ඈත පෙරදිග ඕෂනියා කලාපය

### i.FOODEX JAPAN 2024 ප්‍රදර්ශනය

මෙය ජපානයේ විශාලත ම ආහාරපාන ප්‍රදර්ශනය වන අතර 2024 මාර්තු 5 සිට 8 දක්වා ටෝකියෝ හි දී පැවැත්විණි. මෙම අවස්ථාවට නේචර් සිලෝන් ට්‍රේඩින් (පුද්) සමාගම, එක්ස්පෝටියාස් සිලෝන් (පුද්) සමාගම, ජැෆර්ජී බ්‍රදර්ස්, ටී ටැන්ග් (පුද්) සමාගම, සිලෝන් ලිෆ් එස්ටේට් (පුද්) සමාගම, ස්ටැසන් එක්ස්පෝර්ට්ස් (පුද්) සමාගම, සියම් කොමොඩිටීස් (පුද්) සමාගම, එම්පයර් ටීස් (පුද්) සමාගම, තලවකැලේ තේ වතු පී.එල්.සී සහ සිලෝන් ටී ස්ටෝරි (පුද්) සමාගම යන සිලෝන් තේ අපනයනකරුවන් දස දෙනෙකු සහභාගී විය.




### ii. ඔසාකා හි ලෝක තේ උත්සවය 2024

2024 ලෝක තේ උත්සවය 2024 මැයි 08 සිට 13 දක්වා ඔසාකා හි හන්කියු දෙපාර්තමේන්තු අලෙවිසැලේ දී පැවැත්විණි. ශ්‍රී ලංකාව, ඉන්දියාව, චීනය, තායිවානය, නේපාලය සහ කෙන්යාව යන රටවල තේ නියෝජනය කරන ජපානයේ තේ සමාගම්වල සහභාගිත්වයෙන් ඔසාකා හි හන්කියු දෙපාර්තමේන්තු ගබඩාව විසින් මෙම උත්සවය සංවිධානය කරන ලදී. තේ නිෂ්පාදනය කරන රටවල තේ සම්බන්ධයෙන් අධ්‍යාපනික වැඩසටහන්, සංවාද වැඩසටහන්, සම්මන්ත්‍රණ, තේ රස බැලීමේ සැසි සහ තේ නැවත වගා කිරීම ආදිය මෙම B2C උත්සවයට ඇතුළත් විය. තේ ප්‍රිය කරන තෝරා ගත් පුද්ගලයන් 8 දෙනෙකු සඳහා හන්කියු දෙපාර්තමේන්තු ගබඩාවේ කලා වේදිකාව තුළ සම්මන්ත්‍රණ ප්‍රදේශයේ සිලෝන් තේ සම්මන්ත්‍රණයක් සහ කලාපීය තේ රස බැලීමේ සැසි හතක් පවත්වන ලදී. ප්‍රදර්ශන සංවිධායකයින් විසින් සිලෝන් තේ සම්මන්ත්‍රණය සහ තේ රස බැලීමේ සැසිය සඳහා පූර්ව ප්‍රචාරණයක් ඔවුන්ගේ වෙබ් පිටුව තුළ ලබා දී ඇති අතර එමගින් ගෙවීමක් සිදු කර තේ ප්‍රිය කරන පුද්ගලයන්ට සම්මන්ත්‍රණයට සම්බන්ධ විය හැකි ය. සහභාගිවන්නන් සඳහා ආසන සංඛ්‍යාව 08 කට සීමා විය.

ජපානයේ MITSUTEA සමග එක් ව, සිලෝන් තේ පිළිබඳව මෙන් ම Seven Regional Ceylon Tea, Ceylon Milk Tea Tradition සහ Ceylon Tea Tourism (SLTB Tea Sales Counter, Ceylon Tea Museum, Tea Houses, Tea Factories, Pekoe Trial, Tea Plantations etc) සම්බන්ධයෙන් සංවාද වැඩසටහනක් පවත් වන ලදී.





### iii.තායිවානයේ තායිපේ ආහාර ප්‍රදර්ශනය - 2024

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තායිපේ ෆුඩ් ප්‍රදර්ශනයේ දී ප්‍රදර්ශන කලාපයක් සංවිධානය කරන ලද අතර, සිලෝන් තේ නියෝජනය කරමින් තේ සමාගම් 06 ක් (Venture Tea (Pvt) Ltd, Expoteas Ceylon (Pvt) Ltd, Tea Tang (Pvt) Ltd, Enrich Tea & Food Exports (Pvt) Ltd, Empire Teas (Pvt) Ltd iy HVA Foods PLC) සහභාගි විය. මෙම ප්‍රදර්ශනය තායිවානයේ තායිපේ නන්ගැන්ග් ප්‍රදර්ශන ශාලාවේ දී පවත්වන ලදී.







### iv.හොංකොං ජාත්‍යන්තර තේ සල්පිල

හොංකොං ජාත්‍යන්තර තේ ප්‍රදර්ශනය 2024 අගෝස්තු 13 සිට 18 දක්වා හොංකොං හි දී පැවැත් වූ අතර සිලෝන් තේ සඳහා මණ්ඩපයක් සංවිධානය කරමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රදර්ශනයට සහභාගි විය. තේ සමාගම් 11 ක් සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සිලෝන් තේ මණ්ඩපය තුළ රැඳී සිටි අතර පුළුල් පරාසයක සිලෝන් තේ නිෂ්පාදන ප්‍රවර්ධනය කරන ලදී.

### v.Fine Food Australia ප්‍රදර්ශනය - මෙල්බන්, ඕස්ට්‍රේලියා

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, මෙල්බර්න් හි කොන්සල් ජනරාල් කාර්යාලයේ සහයෝගයෙන් මෙල්බර්න් හි ෆයින් ෆුඩ් ඕස්ට්‍රේලියා ප්‍රදර්ශනයේ දී සිලෝන් තේ ප්‍රදර්ශන මණ්ඩපයක් සංවිධානය කළ අතර, අපනයනකරුවන් හතර දෙනෙකු මෙම අවස්ථාවට සහභාගි විය. එනම්, FBG Ceylon (Pvt) Ltd, Regency Teas (Pvt) Ltd, Ceylon Royal Teas (Pvt) Ltd සහ Tea Talk (Pvt) Ltd යන සමාගම් ය.

### vi. දකුණු කොරියාවේ සියෝල් හි Cafe Show 2024 ප්‍රදර්ශන

දකුණු කොරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ඇති ව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2024 නොවැම්බර් 6 සිට 9 දක්වා සියෝල් හි කැෆේ ෂෝ හි සිලෝන් තේ ප්‍රදර්ශන මණ්ඩපය සංවිධානය කරන ලදී. කොරියානු වෙළඳපොළේ සිලෝන් තේ සහ එහි විශේෂිත ප්‍රභේද ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ විය. මෙම මණ්ඩපයට ශ්‍රී ලංකා තේ මණ්ඩලය, Regency Teas (Pvt) Ltd සහ Nature Ceylon Trading (Pvt) Ltd යන සමාගම් සහභාගි විය.




### චීන කලාපය

චීනයේ තේ ප්‍රවර්ධන ඒකකය විසින් චීන වෙළඳපොළ තුළ සිලෝන් තේ අලෙවිය ශක්තිමත් කිරීම සඳහා පළාත් කිහිපයක ඉලක්ක ගත අලෙවිකරණ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ප්‍රධානව එමෙන්ම වර්ධන වෙමින් පවතින වෙළඳපොළ තුළ සිලෝන් තේ වෙළඳ නාමය පිළිබඳ දැනුවත්භාවය සහ වෙළඳපළ කොටස වැඩි කිරීම සඳහා මෙම පුළුල් ප්‍රවර්ධන වැඩසටහන් උපාය මාර්ගිකව නිර්මාණය කර ඇත.

i.තේ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන 2024, බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය




ii.ලෝක ඩිජිටල් ආර්ථික සංසදය 2024, බීජිං - චීනය (2024 ජනවාරි 26)




iii. Jingzhe තේ උත්සවය 2024, Huzhou, ෂිපියැන්ග් පළාත, චීනය (2024 මාර්තු 4)



iv. බීජිං ටී එක්ස්පෝ - 2024 වෙළඳ ප්‍රදර්ශනය, (2024 අප්‍රේල් 19 - 22)




v. චීනයේ ගුවැන්ඩොන්ග් පළාතේ ගුවැන්ශූ නගරයේ FHC ගුවැන්ශූ 2024 - (2024 මැයි 09 -12)




vi.සියල් ෂැන්ග්හයි 2024 වෙළඳ ප්‍රදර්ශනය, (2024 මැයි 28 – 30)



vii.නැගෙනහිර චීනයේ තේ කර්මාන්ත ප්‍රදර්ශනය - 2024, ෂීපියැන්ග් පළාත, (2024 ජුනි 07-10)




viii.ජාත්‍යන්තර ගොල්ෆ් සමාජය තුළ පිළිගැනීම- ටියැන්ජින්- චීනය (2024 ජුලි 18)



ix.ජාත්‍යන්තර හෝටල් කර්මාන්ත සංවර්ධන සංසදය - 2024 Taiyuan නගරය,ෂැන්ක්ෂි පළාත, චීනය (2024 ජුලි 25 -26)



x. 23 වන සියලු ආහාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රදර්ශනය 2024, ෂැන්ග්හයි, චීනය (2024 අගෝස්තු 21 – 23)




xi. සියල් ෂෙන්සෙන් - 2024 වෙළඳ ප්‍රදර්ශනය, ෂෙන්සෙන් නගරය, ගුවැන්ග්ඩොන්ග් පළාත, චීනය (2024 සැප් 02 - 04)




xii. HICOOL ගෝලීය ව්‍යවසායකත්ව සමුළුව 2024, බීජිං - චීනය (2024 අගෝස්තු 24 – 25 )



**xiii.** 17 වන සමුද්‍ර සන්ධි කුවන්ෂු කෘෂි නිෂ්පාදන මිල දී ගැනීම සහ එක්ස්පෝ 2024 වෙළඳ ප්‍රදර්ශනය සඳහා ඇණවුම් ලබා දීම, කුවන්ෂු නගරය, ෆුජියැන් පළාත, චීනය (2024 සැප් 07 - 09)




**xiv.** සේවා වෙළඳාම සඳහා වූ චීන ජාත්‍යන්තර ප්‍රදර්ශනය (CIFTIS) 2024 වෙළඳ ප්‍රදර්ශනය, බීජිං, චීනය (2024 සැප් 12 – 16)




**xv.** ගෝලීය භූගෝලීය දර්ශක නිෂ්පාදන ප්‍රදර්ශනය 2024 වෙළඳ ප්‍රදර්ශනය, ලුෂෝ නගරය, සිචුවාන් පළාත, චීනය. (2024 සැප්තැම්බර් 20 සිට 22 දක්වා)



**xvi.** ෂියාමෙන් ජාත්‍යන්තර තේ ප්‍රදර්ශනය 2024 සහ වෙළඳ ප්‍රදර්ශනය, ෆුජියැන් පළාත, ෂියාමෙන් නගරය - චීනය (2024 ඔක්තෝබර් 10 – 14)




**xvii.** චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනය (CIIE) 2024 වෙළඳ ප්‍රදර්ශනය, ෂැන්හයි - චීනය (2024 නොවැම්බර් 05-10)




**xviii.** චීන ජාත්‍යන්තර සැපයුම් දාම ප්‍රදර්ශනය (CISCE) 2024 වෙළඳ ප්‍රදර්ශනය, බීජිං, චීනය (2024 නොවැම්බර් 26 – 30)



xix.5 වන තේ මන්දිර කර්මාන්ත සම්මේලනය, බීජිං, චීනය (2024 දෙසැම්බර් 26 - 27)



**යුරෝපා කලාපය**

### i.Alimentaria ප්‍රදර්ශනය, බාසිලෝනා, ස්පාඤ්ඤය

Alimentaria & Hostelco 2024 ප්‍රදර්ශනය මාර්තු 18 සිට 21 දක්වා බාර්සිලෝනා හි දී පවත්වන ලද අතර ආහාර, පාන වර්ග සහ ඒවා පිළිගැන්වීමේ උපකරණ මෙහි දී ප්‍රදර්ශනය කරන ලදී. ප්‍රදර්ශන සමාගම් 3,200 කට අධික සංඛ්‍යාවක් සහ පුද්ගලයන් 107,900 කට ආසන්න සංඛ්‍යාවක් මෙම ප්‍රදර්ශනය නැරඹූ අතර කර්මාන්ත ජාලකරණය සහ නවෝත්පාදනය සඳහා ප්‍රමුඛ ජාත්‍යන්තර වේදිකාවක් වශයෙන් මෙම ප්‍රදර්ශනය ක්‍රියාත්මක විය.

මෙම අවස්ථාව හේතුවෙන් ස්පාඤ්ඤයේ සිලෝන් තේ ප්‍රදර්ශනය කිරීමට සහ තේ සහ එහි සෞඛ්‍ය ප්‍රතිලාභ කෙරෙහි බොහෝ සෙයින් උනන්දුවක් දක්වන ස්පාඤ්ඤ පාරිභෝගිකයින් අතර දැනුවත් භාවය වැඩි කිරීමට හැකි විය. වෙනවර් ටී පුද්ගලික සමාගම, එම්පයර් ටී පුද්ගලික සමාගම , රිජන්සි තේ පුද්ගලික සමාගම සහ ගැමී තේ කොළඹ පුද්ගලික සමාගම ඇතුළු ශ්‍රී ලාංකික තේ සමාගම් කිහිපයක් ද මේ අවස්ථාවට සහභාගී විය. මෙම සමාගම් විසින් ඔවුන්ගේ විවිධ නිෂ්පාදන ප්‍රදර්ශනය කළ අතර ස්පාඤ්ඤ වෙළඳපොළ තුළ ඔවුන්ගේ නිෂ්පාදන පුළුල් කිරීමට ප්‍රයත්න දරන ලදී.

මීට අමතර ව, ආනයනකරුවන්, තේ සාප්පු හිමියන් සහ තේ ප්‍රිය කරන්නන් ඇතුළු 50 ක් පමණ පුද්ගලයන් ආකර්ෂණය කර ගනිමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිලෝන් තේ ප්‍රදර්ශනය කිරීමේ සහ රස බැලීමේ සැසියක් ද පවත්වන ලදී.




### ii.වෝර්සෝ ආහාර ප්‍රදර්ශනය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2024 අප්‍රේල් 16 සිට 18 දක්වා පෝලන්තයේ වෝර්සෝ හි ලෝක ආහාර ප්‍රදර්ශනයට සහභාගී වූ අතර, එහි දී සිලෝන් තේ ප්‍රදර්ශන වේදිකාවක් පැවැත් වූ අතර ස්ටැසන් එක්ස්පෝර්ට්ස් (පුද්) සමාගම, එම්පයර් ටීස් (පුද්) සමාගම, මැල්ට්‍රාස් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම, සිලෝන් ටී ලෑන්ඩ් (පුද්) සමාගම සහ සායා ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම යන තේ අපනයන සමාගම් ඒ සඳහා සහභාගී විය.




ප්‍රදර්ශනයට සහභාගී වීමට අමතර ව, පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ඇති ව පෝලන්තයේ වෝර්සෝ විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිලෝන් තේ පිළිබඳ දැනුවත් කිරීමේ සහ සිලෝන් තේ රස බැලීමේ සැසි පවත් වන ලදී.



### iii.සියල් පැරිස් 2022, පැරිස්, ප්‍රංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2024 ඔක්තෝබර් 19 සිට 23 දක්වා පැවති ලොව ප්‍රමුඛත ම ආහාර පාන ප්‍රදර්ශනයක් වන SIAL පැරිස් 2024 තුළ සිලෝන් තේ ප්‍රදර්ශන කුටි පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම තේ කර්මාන්තය නියෝජනය කරමින් පෞද්ගලික අංශයේ තේ සමාගම් පහක් මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ අතර එහි දී සිලෝන් තේ ප්‍රදර්ශනය කරන ලදී. ද්විවාර්ෂිකව පවත්වනු ලබන මෙම උත්සවය ගෝලීය වශයෙන් සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීමට සහ ගැනුම්කරුවන් සමග මනා සම්බන්ධතා ගොඩ නගා ගැනීමට උපකාරී වන ප්‍රධාන අවස්ථාවක් වේ.

ප්‍රදර්ශනයට අමතර ව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් SIAL පැරිස් 2024 හි ප්‍රධාන ආරාධිතයින් සඳහා වූ විවේකාගාරයේ සිලෝන් තේ සේවාවක් සංවිධානය කරන ලද අතර, උත්සවය පුරාවට ම හොඳ ම සිලෝන් තේ නිෂ්පාදන රසවිඳීමට සහභාගිවන්නන්ට සුවිශේෂී අවස්ථාවක් ලබා දෙන ලදී.







**iv.ජාත්‍යන්තර තේ දිනය 2024 - සිලෝන් තේ ප්‍රවර්ධන වැඩසටහන, ප්‍රංශය**

2024 ජාත්‍යන්තර තේ දිනයේ දී පැරිසියේ යුනෙස්කෝ හි දී රටවල් 16 ක් විසින් තේ සංස්කෘතිය හා අන්තර් සංස්කෘතික සංවාද පිළිබඳ සහශ්‍රකය සමරනු ලැබී ය. යුනෙස්කෝවේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත කණ්ඩායම ලොව සුපතල සිලෝන් තේ එහි උසස් තත්වය, රසය, මිශ්‍රණ, තිරසාර භාවිතයන් සහ සුවිශේෂී ලක්ෂණ සම්බන්ධයෙන් ප්‍රදර්ශනය කරන ලදී.



**v. හොරේකා ආහාර හා පාන වෙළඳ ප්‍රදර්ශනය, බෙල්ජියම**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2024 නොවැම්බර් 17 සිට 20 ,දක්වා බෙල්ජියමේ දී පැවති ප්‍රමුඛත ම ආහාර පාන වෙළඳ ප්‍රදර්ශනයක් වන හොරේකා බෙල්ජියම 2024 හි සිලෝන් තේ ප්‍රදර්ශන කලාපය සංවිධානය කරන ලදී. මෙම කලාපයට ඉම්පීරියල් තේ අපනයන (පුද්) සමාගම සහ සිලෝන් ලුම්බිණි තේ (පුද්) සමාගම යන සමාගම් සහභාගී වූ අතර, ශ්‍රී ලංකාවේ ඉහළ තත්ත්වයේ සිලෝන් තේ ප්‍රවර්ධනය කරන ලදී.

මෙම අවස්ථාව ජාත්‍යන්තර ගැනුම්කරුවන් අතර සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීමට, වෙළඳ සබඳතා ශක්තිමත් කිරීමට සහ යුරෝපීය වෙළඳපොළ තුළ නව ව්‍යාපාරික අවස්ථා සෙවීමට මනා අවස්ථාවක් සපයන ලදී.




**vi.සිර්හා බුඩපෙස්ට්, හංගේරියාව**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2024 මාර්තු 5 සිට 7 දක්වා හංගේරියාවේ හන්ග්එක්ස්පෝ හි දී සිර්හා බුඩපෙස්ට් 2024 ප්‍රදර්ශනය තුළ සිලෝන් තේ කලාපයක් සංවිධානය කරන ලදී. එය කුටි දෙකකින් සමන්විත වූ අතර, එක් කුටියක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගන්නා ලදී. අනෙක ස්ටැසන් එක්ස්පෝට් (පුද්) සමාගම හි ප්‍රදර්ශන කටයුතු සඳහා භාවිත කරන ලදී.

අනුමැතිය ප්‍රමාද වීම හේතුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන්ට සහභාගී වීමට නොහැකි වූ බැවින්, කුටි මෙහෙයුම් කටයුතු විකල්පයක් වශයෙන් යුරෝ ස්කෑන් (පුද්) සමාගමේ දේශීය නියෝජිතයාට පවරන ලදී. ප්‍රදර්ශනයේ දී සිලෝන් තේ ප්‍රදර්ශනය අඛණ්ඩව සහතික කරමින් එකී නියෝජිතයා විසින් මිලෙස්නා සන්නාම ප්‍රවර්ධනය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තොරතුරු කවුන්ටරය ඵලදායි ලෙස කළමනාකරණය කරන ලදී.




### vii.IFE ලන්ඩන් වෙළඳ ප්‍රදර්ශනය, ලන්ඩන්, එක්සත් රාජධානිය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය එහි සභාපතිවරයාගේ නායකත්වයෙන් යුත් දූත පිරිසක් සමග IFE ලන්ඩන් 2024 (මාර්තු 25 සිට 27 දක්වා) සඳහා සහභාගී වූ අතර, මිලෙනියම් ටී, සැමිලි ටී, නේචර් සිලෝන් වෙළෙඳ සමාගම, ඇවෙන්රිච් ටී, සහ එන්රිච් ටී යන අපනයනකරුවන් පස් දෙනෙකුගෙන් සමන්විත සිලෝන් තේ කලාපයක් සංවිධානය කරන ලදී. මෙම සංචාරය අතරතුර, ශ්‍රී ලංකා තේ මණ්ඩල නියෝජිත පිරිස විසින් එක්සත් රාජධානියේ ප්‍රධාන කලාපවල වෙළඳපළ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ග්ලාස්ගෝ සහ ඇබර්ඩීන් හි සිලෝන් තේ ප්‍රවර්ධන වැඩසටහන් පවත් වන ලදී.



### viii.ලොක ආහාර සල්පිල, තුර්කිය

සැප්තැම්බර් 3 සිට 6 වන දින දක්වා පැවති වර්ල්ඩ් ෆුඩ් ඉස්තාන්බුල් 2024 සඳහා සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය තුර්කිය - සිලෝන් තේ පවුල සමග හවුල් විය. මෙම අවස්ථාවට ප්‍රමුඛ පෙළේ සිලෝන් තේ අපනයනකරුවන් හය දෙනෙකු සහභාගී විය [ඉම්පීරියල් ටී (පුද්) සමාගම, යුනිවර්ල්ඩ් ටී (පුද්) සමාගම, සිලෝනි ටී ලෑන්ඩ් (පුද්) සමාගම, ඕවයින් නේචර් ටී, ටී පැක්ස් (පුද්) සමාගම සහ වින්ටේජ් ටී (පුද්) සමාගම] මෙමගින් තුර්කි වෙළඳපොළේ සිලෝන් තේ වල උසස් තත්ත්වය සහ සුවිශේෂී ලක්ෂණ ඵලදායි ලෙස ප්‍රවර්ධනය කරන ලදී.

## ඇමරිකා එක්සත් ජනපදය සහ දකුණු ඇමරිකානු කලාපය

### i.එස්පැසියෝ ආහාර සේවාව, සන්තියාගෝ, චිලි

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පෞද්ගලික තේ අපනයන සමාගම්වල කුටි 10 කින් සමන්විත සිලෝන් තේ ප්‍රදර්ශන කුටි සංවිධානය කරන ලදී - බොගවන්තලාව සිලෝන් ටී (පුද්) සමාගම, වෙන්චර් ටී (පුද්) සමාගම, යූ.එච්.ඊ එක්ස්පෝර්ට් (පුද්) සමාගම, මැබ්‍රොක් ටී (පුද්) සමාගම,එක්ස්පො ටී සිලෝන් (පුද්) සමාගම, මැල්ට්‍රස් ඉන්ටර්නැශනල් , මිසන් සහා සමාගම සහ ටී ට්‍රෙන්ඩ්ස් එක්ස්පෝර්ට් (පුද්) සමාගම, සමාගම් විසින් තම අගය එකතු කළ තේ නිෂ්පාදන චිලි රාජ්‍යයේ එස්පැසියෝ ආහාර සේවාව හි දී (2024 ඔක්තෝබර් 1 සිට 3 දක්වා) ප්‍රදර්ශනය කරන ලදී.

### ii.කැනඩාවේ මොන්ට්‍රියල් හි සියල් කැනඩා ප්‍රදර්ශනය

උක්ත ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නේචර් සිලෝන් ට්‍රේඩින් (පුද්) සමාගම සහ රිජන්සි ටීස් (පුද්) සමාගම යන සමාගම් දෙකකට පහසුකම් සැලසීම සඳහා සිලෝන් තේ ප්‍රදර්ශන කලාපයක් සංවිධානය කරන ලදී. කුඩා පරිමාණ කාණ්ඩය යටතේ, සායා ඉන්ටර්නැශනල් තේ සමාගම ,ෆුඩ් එක්ස්පොර්ට් පුද්ගලික සමාගම සහ මින්ග්ටේ සිලෝන් යන සමාගම් සිලෝන් තේ කලාපය යටතේ මේ සඳහා සහභාගී විය.




### iii.නිව්යෝක් හි සමර් ෆැන්සි - ආහාර ප්‍රදර්ශනය

නිව්යෝර්ක් හි පැවති සමර් ෆැන්සි ආහාර ප්‍රදර්ශනය තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිලෝන් තේ ප්‍රදර්ශන මණ්ඩපය සංවිධානය කළ අතර යූ.එච්.ඊ. එක්ස්පොර්ට් (පුද්) සමාගම සහ ෆින්ලේ කොළඹ සමාගම සහ කුඩා පරිමාණ අපනයනකරුවන් දෙදෙනෙකු වන මැක්සන්ස් එක්ස්පොර්ට් (පුද්) සමාගම සහ කේ.ඩී.යූ එක්ස්පොර්ට් (පුද්) සමාගම යන සමාගම් ඒ සඳහා සහභාගී කර ගන්නා ලදී.




**iv.කැනඩාවේ ටොරොන්ටෝ තේ උළෙල**

ටොරොන්ටෝ හි ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලයේ සහාය ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2024 ජනවාරි 28 සිට 29 දක්වා කැනඩාවේ පැවති ටොරොන්ටෝ තේ උළෙලට සහභාගී විය.



## 2.3.3. වෙළඳ නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමය

සිංහ ලාංඡනය සහිත ශ්‍රී ලාංකික සන්නාම නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමය සඳහා මූල්‍යාධාර ලබා දීමේ යෝජනාව සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. සහනාධාර යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය අරමුදල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ ස්ථාපිත ප්‍රවර්ධන සහ අලෙවිකරණ බද්දෙන් ලබා ගනී. තව ද, ඇමරිකානු ඩොලර්වලින් ගනුදෙනුව සිදු වූ දිනයට අදාළ විනිමය අනුපාතයට සමාන අගයකින් රුපියල් වලින් පියවීමට / ප්‍රතිපූරණය කිරීමට 2022.10.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබුණි.

ඒ අනුව, රටවල් 45 ක තම වෙළඳ නාම ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම සඳහා සමාගම් 22 ක් සුදුසුකම් ලබා ඇති අතර 2022 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති 80 සඳහා ගිවිසුම් අත්සන් කරන ලද අතර අපනයන පරිමාව මත ඉලක්ක නියම කරන ලදී. රටතුල ජාතික නිෂ්පාදනය පහත වැටීම හේතුවෙන් අදාළ වකවානුව තුළ අගය එකතු කළ තේ අපනයන පහත වැටීම සැලකිල්ලට ගනිමින්, සියලු ම අයදුම්කරුවන් සඳහා ඉලක්ක ගත ප්‍රමාණයන් සපුරා ගැනීම සඳහා පමණක් 2022 මාර්තු 31 දක්වා මාස තුනක කාල දිගුවක් ලබා දීමට මණ්ඩලය අවසර දී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2021/2022 වර්ෂය සඳහා සිංහ ලාංඡනය සහිත වෙළඳ නාම ප්‍රවර්ධනය සඳහා මූල්‍යාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇති අතර ඒ පිළිබඳ සැකෙවින් පහත දක්වා ඇත.

වගුව 2.3.1: සන්නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමයේ සාරාංශය

| | |
|---|---|
| අත්සන් කළ සමස්ත ව්‍යාපෘති ගණන | 80 |
| ඇගයීම සඳහා භාර නොදුන් ව්‍යාපෘති ගණන | 57 |
| ඇගයීම සඳහා භාර දුන් ව්‍යාපෘති ගණන | 23 |
| ලේඛන ප්‍රමාණවත් නොවීම හෝ ඉලක්ක සපුරා නොගැනීම හේතුවෙන් ප්‍රතික්ෂේපිත ව්‍යාපෘති ගණන | 10 |
| ප්‍රතිපූර්ණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට තිබෙන ව්‍යාපෘති ගණන | 02 |
| සම්පූර්ණ කළ හා අරමුදල් නිදහස් කළ ව්‍යාපෘති ගණන | 11 |
| සමස්ත ප්‍රතිපූර්ණ අගය (අපේක්ෂිත ව්‍යාපෘති 2 ඇතුළුව ) | රු.127,334,750.47 |

## 2.3.4. බුද්ධිමය දේපල පිළිබඳ කාරණා - සිංහ ලාංඡනය, සිලෝන් තේ සහ ඕසෝන් ලාංඡනය ලියාපදිංචිය

CEYLON TEA
SYMBOL OF QUALITY

සිලෝන් තේ සිංහ ලාංඡනය වෙළඳ ලකුණ නීත්‍යානුකූලව ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වේ. ශ්‍රී ලංකාවේ සහ අනෙකුත් රටවල සිලෝන් තේ සිංහ ලාංඡනය ලියාපදිංචි කිරීම සහ අලුත් කිරීම තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන අංශයේ වගකීමක් වේ. 2024 වන විට, සිංහ ලාංඡනය රටවල් 103 ක ලියාපදිංචි කර ඇත. ශ්‍රී ලංකාවේ පෙර ඇසුරුම් කර ඇති, 100% සිලෝන් තේ අඩංගු සහ ISO 3720 ප්‍රමිතීන්ට අනුකූල වන, එක් එක් රටවල් සඳහා අවම ප්‍රමිතීන් ඉක්මවා යන සන්නාම ගත, අගය එකතු කළ තේ නිෂ්පාදන (තේ පැකට් සහ බෑග්) සඳහා පමණක් සිංහ ලාංඡනය අවසරයක් වශයෙන් භාවිතා කිරීමේ අයිතිය ලබා දී ඇත.

සමාලෝචිත කාල වකවානුව තුළ, බ්‍රසීලයේ නව සිංහ ලාංඡනයක් (ගුණාත්මකභාවය සහ සිංහ ලාංඡනය පිළිබඳ සිලෝන් තේ සංකේතය) ලියාපදිංචි කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය කටයුතු කර ඇත. අසර්බයිජානය, ඉන්දියාව සහ බංග්ලාදේශයේ නව ලියාපදිංචි කිරීමේ කටයුත්ත අවසන් කර ඇත. තව ද, සිංහ ලාංඡන

අලුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා උපදෙස් ලබා දී ඇති අතර දැනට එම කටයුතු ලයිබීරියාවේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිදුවෙමින් පවතී. සියෙරා ලියොන් හි ලියාපදිංචිය අලුත් කිරීම අවසන් කර ඇත. තව ද, ප්‍රකාශිත වෙළඳ ලකුණට එරෙහිව නිසි පරිදි විරෝධතා ගොනු කර ඇති බැවින්, ඉරාකයෙන් වෙළඳ ලකුණු පිළිබඳ දැනුම් දීමේ කටයුත්ත මේ වන විටත් ආරම්භ කර ඇත.

### 2.3.5. දේශීය ප්‍රවර්ධනය

**i.ජාත්‍යන්තර තේ දිනය 2024**




2024 මැයි 21 වන දින මතුගම ප්‍රදේශයේ දී සිලෝන් තේ විසින් 2024 ජාත්‍යන්තර තේ දිනය සමරනු ලැබූ අතර එහි දී සිලෝන් තේවල අනගි උරුමය, ගුණාත්මකභාවය සහ ගෝලීය වැදගත්කම ඉස්මතු කරන ලදී. ශ්‍රී ලංකාවෙන් සම්භවය ලද මෙම තේ, සියවස් ගණනාවක් තිස්සේ තේ ප්‍රිය කරන ජනයා අතර ආකර්ෂණය රඳවා ගෙන ඇත. සමාජය තුළ තේවල සංස්කෘතික හා ආර්ථික බලපෑම මෙම දිනය මඟින් සිහිපත් කරනු ලබයි.



තිරසාරභාවය, ප්‍රජා බල ගැනවීම සහ පාරිසරික භාරකාරත්වය කෙරෙහි තම කැපවීම සිලෝන් තේ නිෂ්පාදකයින් විසින් මෙමගින් නැවත තහවුරු කරන ලදී. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල තේ කර්මාන්තයට කාන්තාවන්ගේ විවිධාකාර දායකත්වයන් ද මෙම උත්සවය මගින් අවධාරණය කරන ලදී. සිලෝන් තේ පිළිබඳ අතීත සම්ප්‍රදාය සහ දිගු කාලීන උරුමය සැමරීම සඳහා පාර්ශවකරුවන් මෙහි දී එකට එක් විය.



**ii.බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල, රත්මලාන ගුවන්තොටුපල හා යාපනය ගුවන්තොටුපලවල් හිදී ගුවන්තොටුපල හා ගුවන් සේවා සඳහා සිලෝන් තේ ප්‍රවර්ධන කටයුතු**

ජාත්‍යන්තර පැමිණීම් ඉලක්ක කර ගනිමින් විවිධ ප්‍රවර්ධන ව්‍යාපාර පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2024 දී ශ්‍රී ලංකා ගුවන් සේවය සහ පෞද්ගලික සිලෝන් තේ අපනයනකරුවන් සමග හවුල්කාරත්ව ගොඩ නගා ගන්නා ලදී. එහි දී, රට තුළ පවතින උසස් ගුණයෙන් යුත් තේ ලබා දෙමින් හා අමුත්තන්ගේ අනගි අත්දැකීම් පිළිබඳ අවධාරණය කරමින් සම්බන්ධීකරණ කටයුතු හරහා සිලෝන් තේ සහ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය යන දෙඅංශය ම ඵලදායී ලෙස ප්‍රවර්ධනය කරන ලදී.

- වැලන්ටයින් දින සැමරුම
- සිංහල අලුත් අවුරුදු උත්සවය
- ශ්‍රී ලංකාවට පැමිණි නව ගුවන් මගීන් සඳහා උණුසුම් තේ කෝප්පයක් සහ තිලිණ වශයෙන් තේ පැකට් ලබා දීම
- 2024 කොළඹ ජාත්‍යන්තර තේ සමුළුව අතර වාරයේ දී ගුවන් තොටුපළ තුළ සන්නාමකරණය කටයුතු සිදු කිරීම

**iii. ශ්‍රී.ල.තේ.ම තේ පැකට් අලෙවිය, ප්‍රවර්ධන ද්‍රව්‍ය බෙදා හැරීම හා තේ පානය සඳහා පහසුකම් සැලසීම ආදී කටයුතු ශ්‍රී.ල.තේ.ම කුටිය තුළ සිදු කරන ලදී.**

- ආසියා හා පැසිපික් කලාපයේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ කලාපීය සමුළුවේ 37 වන සැසිය, හිල්ටන් හෝටලය (2024 පෙබරවාරි 19 - 22)



• Agri Tech 2024 කෘෂිකර්ම ප්‍රදර්ශනය, බටඅත (2024 මාර්තු 2-5)






- දක්ෂිණ ජන මෙහෙවර 2024 - ඇල්පිටිය (ජංගම සේවය) 2024 මාර්තු 30
- NIPM දින එළිමහන් ප්‍රදර්ශනය - 2024 මාර්තු 28
- ජාත්‍යන්තර තේ සමුළුව පිළිබඳ පුවත්පත් සාකච්ඡාව -2024 අප්‍රේල් 24

- කොළඹ කේන්ද්‍ර කර ගත් රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද සිංහල සහ දෙමළ අලුත් අවුරුදු සැමරුම්- 2024 අප්‍රේල් 20
- ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පවත්වනු ලබන "වසත් සිරිය" සිංහල සහ දෙමළ අලුත් අවුරුදු සැමරුම් - 2024
- නැවුම් තේ උත්සවය - 2024 - ගැටබරු (2024 මැයි 23 - 24)
- ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වෙසක් දන්සල 2024 - මැයි 28






- ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
- මැලේසියාවේ දිස්ත්‍රික් කොමසාරිස් සමුළුව (2024 ජූනි 9 - 14)
- බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ කර්මාන්ත ප්‍රදර්ශනය 2024 - (2024 ජූනි 19 - 23)
- බොන් ඔදාරි වැඩසටහන 2024 - ජාතික තරුණ සේවා සභාව (2024 ජූලි 13)
- කොළඹ ජාත්‍යන්තර තේ සමුළුව - (2024 ජූලි 24 - 26)

**iv. පහත සඳහන් සඟරා / සමරුවල සිලෝන් තේ දැන්වීම් සහ ලිපි පළ කිරීම සහ ප්‍රවර්ධන බැනර් ප්‍රදර්ශනය කිරීම.**

- 76 වන නිදහස් දින සැමරුම සඳහා "නිදහස් අරුණළු" වාර්ෂික සඟරාව
- සිංහල සහ දෙමළ අලුත් අවුරුදු සැමරුම් සඳහා CA සාමාජිකයින්ගේ සුභසාධක සංගමයේ සිහිවටනය
- ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලයේ 32 වන වාර්ෂික සම්මාන උළෙල - 2024
- ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ උපාධි ප්‍රදානෝත්සවය - 2024
- ඩේලි නිවුස්, දිනමිණ, තිනකිරන් පුවත්පත්වල ලෝක ආහාර දින අතිරේකයේ පළ කිරීම්
- බටඅත 'කෘෂි තාක්ෂණ ප්‍රදර්ශනය - 2024' සඳහා ප්‍රවර්ධන පුවරු

**v. චීන දූත පිරිසක් සඳහා (විශ්ව විද්‍යාල සිසුන්) සිලෝන් තේ ඉදිරිපත් කිරීම / ආදර්ශනයක් පවත්වන ලදී.**

**vi. විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා නොමිලේ (ත්‍යාග වශයෙන්) තේ පිරිනැමීම.**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල 34 ක් සඳහා තේ සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය නොමිලේ නිකුත් කර ඇත.

**vii. සංචාරක මණ්ඩලය සමග සිලෝන් තේ ප්‍රවර්ධනය**

- නාවික සංචාරයක් ලෙස ශ්‍රී ලංකාවට පැමිණි මගීන් අතර තිළිණ වශයෙන් සිලෝන් තේ පැකට් සහ මුහුණු ආවරණ බෙදා හැරීම
- විදේශ රටවලට කරන සංචාර සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ නිලධාරීන්ට සිලෝන් තේ පැකට් සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය නිකුත් කිරීම

**viii. "Tea Journey" සඟරාව තුළ සිලෝන් තේ ප්‍රවර්ධනය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2024 ජූලි/අගෝස්තු මාසවල දී "Tea Journey" සඟරාවේ ලේඛිකා ඩයනා ජෙන්ඩෝබ් මහත්මිය සඳහා චාරිකාවක් සංවිධානය කරන ලදී. සිලෝන් තේ පිළිබඳ ලිපි 06 ක් සඟරාවේ ප්‍රකාශයට පත් කිරීමට එකඟ වී ඇත.

**ix. යුරෝපා විශේෂඥ තේ සංගමයේ (ESTA) සාමාජිකත්වය ලබා ගැනීම**

කොළඹ තේ තැරැව්කරුවන්ගේ සංගමයේ සභාපති හරහා ලැබුණු යෝජනාවට අදාළව 2024 සැප්තැම්බර් 25 වන දින සිට වසර තුනක කාලයක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය යුරෝපා විශේෂිත තේ සංගමයේ හි සාමාජිකයෙකු වශයෙන් ලියාපදිංචි විම.

### 2.3.6. ලංකා ශිල්පීය තේ ප්‍රවර්ධනය කිරීම (අතින් සාධන තේ)

ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ පවතින ඉල්ලුම සහ විදේශයන් හි පිහිටි ඇතැම් ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙතින් ලැබුණු විශේෂ ඉල්ලීම් සැලකිල්ලට ගනිමින්, ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ශිල්පීය/විශේෂ තේ නිෂ්පාදකයින් සඳහා ඇති අවස්ථා ගවේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කුඩා පරිමාණ කාණ්ඩය යටතේ පවත්වනු ලබන ජාත්‍යන්තර ප්‍රදර්ශනවලට සහභාගී වන ලෙස ශිල්පීය/විශේෂ තේ නිෂ්පාදකයින් දිරිමත් කරන ලදී.

එසේ ම, විවිධ නිෂ්පාදකයින් වෙතින් ලැබුණු තේ සාම්පල සෞදි අරාබිය, බ්‍රසල්ස් වැනි රටවල ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් සංවිධානය කරන ලද විශේෂ උත්සවවල දී ප්‍රදර්ශනය කිරීම සඳහා ඔවුන් වෙතට යවන ලදී.

## 2.4. තේ රස බැලීමේ ඒකකය

සිලෝන් තේවල තත්ත්ව සහතික කරන ප්‍රධාන ආයතනයක් වශයෙන් තේ රස බැලීමේ අංශය කටයුතු කරයි. වෙන්දේසි කිරීමට හා අපනයනයට පෙර තේවල ගුණාත්මක බව පිළිබඳ තක්සේරු කිරීම මෙහි වගකීම වේ. විවිධ තේ ප්‍රභේදවල තත්ත්වය ඇගයීමට ලක් කිරීම සඳහා තේ රස බලන්නන් විසින් තේවල රසය, සුවඳ, පෙනුම හා දිවට දැනෙන හැඟීම ආදීය පිළිබඳ තක්සේරුවක් ගැනීමට ගුණාත්මක විශ්ලේෂණයක් සිදු කරනු ලබයි. එය භෞතික ව දැනෙන ආකාරය මත ලබා ගන්නා අවබෝධය හා අත්දැකීම මත පදනම් වූ කුසලතා පූර්ණ ක්‍රියාවලියකි. තේ රස බලන්නන්, තේවල ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා එහි රසය, පෙනුම, ස්පර්ශය, සුවඳ විමසීම යන සාධක භාවිත කරමින් ගුණය පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරයි. තේ රස බලන්නන් විවිධ තේවල සියුම් රසයන් සහ ගුණාංග හඳුනා ගැනීමේ විශේෂඥතාව සහිත පිරිසක් වශයෙන් ප්‍රසිද්ධ වී ඇති අතර, තේ සම්බන්ධයෙන් කාර්යක්ෂම සහ වෘත්තීය තීරණ ඔවුන් විසින් ගනු ලැබේ. අසතුටුදායක මට්ටමක පවතින නියැදි, විශ්ලේෂණ විද්‍යාගාරය වෙත වැඩි දුර පරීක්ෂා කිරීම සඳහා යවනු ලබයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ රස පරීක්ෂා කිරීමේ කණ්ඩායම විවිධ පාර්ශව නියෝජනය කරන රාජ්‍ය සහ පුද්ගලික අංශයේ තේ රස පරීක්ෂා කරන්නන්ගෙන් යුත් විශේෂඥ මණ්ඩලයකින් සමන්විත වේ. එනම්, ලංකා තේ වෙළෙඳුන්ගේ සංගමය [Ceylon Tea Traders' Association (CTTA)], ලංකා බ්‍රෝකර්වරුන්ගේ සංගමය [Ceylon Brokers' Association (CBA)], ලංකා වැවිලි සංගමය [Ceylon Plantation Association (CPA), කුඩා තේ හිමියන්ගේ සංවර්ධන සමිති පිළිබඳ ශ්‍රී ලංකා සම්මේලනය [Sri Lanka Federation of Tea Small Holdings Development Societies (SLFTSHDS)], තේ අපනයනකරුවන්ගේ සංගමය [Tea Exporters Association (TEA)], ශ්‍රී ලංකා තේ කර්මාන්ත හිමියන්ගේ සංගමය [Sri Lanka Tea Factory Owners Association (SLTFOA)] වැනි ආයතනයන් සහ ස්වාධීන සාමාජික මඬුල්ලකින් ද මෙම කණ්ඩායම සමන්විත වේ.

**මෙම අංශයේ හි ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ,**

- තේ ලබා දෙන ඕනෑම අවස්ථාවක අවම තත්ත්ව ප්‍රමිතිය සහ ප්‍රමිතීන් පවත්වා ගැනීම
- පුද්ගලික විකුණුම්, සෘජු විකුණුම් හා කොන්ත්‍රාත්තු අධීක්ෂණය හා අනුමත කිරීම
- සන්නාම සහිත නිෂ්පාදන සහ පරිභෝජන ඇසුරුම් සඳහා සිංහ ලාංඡන සහතික නිකුත් කිරීම සඳහා පහසුකම් සැපයීම
- නව අපනයන සමාගම් සඳහා තේ රස බලන්නන් ඇගයීමට ලක් කිරීම
- ආනයනය කළ තේ නියැදි ඇගයීමට ලක් කිරීම

## 2.4.1. තේ රස බැලීමේ සංකල්පය හා ක්‍රමවේදය

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවේදක පරීක්ෂණවල දී, තේ පිළියෙළ කිරීම පිළිබඳ ISO 3103.
- ශ්‍රී ලංකාවේ තේ රස බැලීම සම්බන්ධයෙන් කළු තේ සඳහා ISO 6078 පාරිභාෂිත වචන මාලාව/ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය පිළිබඳ විෂය ග්‍රන්ථය - අංක 4 - ලංකාවේ තේ නිෂ්පාදනය යනාදිය පිළිගනු ලබයි.

තේ පිළිබඳ විශේෂඥ මණ්ඩලයක සහභාගීත්වයෙන් ප්‍රධාන වශයෙන් සඳුදා සහ සිකුරාදා යන දිනයන් හිදී සතියකට දෙවරක් සාමාන්‍ය තේ රස බැලීමේ සැසි පවත්වනු ලැබේ. මෙම සැසි අතරවාරයේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ආනයන අංශය මගින් ලබා දෙන සහ තේ රස බැලීමේ අංශයට සෘජු ව ලැබෙන පහත තේ නියැදි ඇගයීම සඳහා සලකා බලනු ලැබේ.

(අ) පූර්ව වෙන්දේසි තේ
(ආ) විශේෂ විමර්ශන තේ
(ඇ) පූර්ව ආනයන නියැදි
(ඈ) සෘජු විකුණුම්
(ඉ) දෛනික ඇගයීමට ලක් කරන බෙදා හැරීමට පෙර කරනු ලබන අධීක්ෂණය. නියැදි පිළිබඳ මණ්ඩලයේ තීරණය වැඩි දුර නියාමනය සඳහා තේ කොමසාරිස් අංශයටත්, තේ අපනයන ඒකකයටත් යවනු ලැබේ.
(ඊ) පුද්ගලික විකුණුම් නියැදි
(උ) ඉදිරි කොන්ත්‍රාත් නියැදි

2.4.1 : 2024 වසරේ දී පරීක්ෂා කරන ලද හා සැක සහිත නියැදි පිළිබඳ විස්තරය

| විස්තරය | පරීක්ෂාවට ලක් කළ නියැදි සංඛ්‍යාව | සැකයට බඳුන් කරන ලද නියැදි සංඛ්‍යාව |
|---|---|---|
| දෘශ්‍ය පරීක්ෂණ | 254,265 | 1931 |
| පූර්ව වෙන්දේසි නියැදි | | |
| අහඹු ඇගයීම | 4,383 | 470 |
| දියර වර්ග මිශ්‍ර වීමෙන් අපවිත්‍ර වී ඇතැයි යන සැකය හේතුවෙන් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීම | | 364 |
| සිලිකාමය කරුණු | | 538 |
| අමු කෙඳි | | 936 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**අ) පූර්ව වෙන්දේසි තේ**

විකිණීමට සති දෙකකට පෙර තැරැව්කරුවන් අට දෙනෙකු තම තේ නියැදි වෙන්දේසියට පෙර ඇගයීම සඳහා එවනු ලැබේ. පළමු පියවර ලෙස ඉහළ සහ මධ්‍යම, හොඳින් මල් සහිත, අඩු වැඩුණු පත්‍ර, අඩු වැඩුණු අර්ධ-පත්‍ර, අඩු වැඩුණු කිනිති සහිත/තත්ත්වයෙන් පහළ කුඩා සහ උප වර්ග, කුඩු සහ Bop 1A නියැදීන් හඳුනා ගැනීම සඳහා දෘශ්‍ය ඇගයීම සිදු කරනු ලැබේ. අහඹු තෝරා ගැනීම මත පදනම් ව, තැරැව්කරුවන්ගේ තේ නියැදි තෝරා ගෙන කාබනික ඇගයුම සිදු කරනු ලැබේ. ඇගයීමෙන් පසු තෝරා ගත් සාම්පල ඉදිරි වෙන්දේසියේ දී ඉදිරිපත් කිරීම හෝ නොකිරීම පිළිබඳ සාමූහික තීරණයක් ගැනීමට මණ්ඩලයට ඉදිරිපත් කෙරේ. තීරණය අපනයන අංශයේ නියෝජ්‍ය තේ කොමසාරිස් වෙත දැනුම් දෙනු ලැබේ.

**ආ) බෙදා හැරීමට පෙර තේ**

කළු තේ සඳහා සිංහ ලාංඡනය හා ISO 3720 ද, හරිත තේ සඳහා ISO 11287 පරාමිතීන් භාවිතය හෝ වෙනත් අපවිත්‍රතාවයක් තේ තොගය බෙදා හැරීමට පෙර කරනු ලබන පරීක්ෂාව යටතේ පරීක්ෂාවට ලක් කරනු ලැබේ. මෙම පූර්ව බෙදා හැරීමේ නියාමන ක්‍රමය යටතේ 2024 වර්ෂය තුළ දී නියැදි 12,150 ක් පරීක්ෂාවට ලක් කරන ලදී.

**ඇ) පූර්ව ආනයන තේ සහ ආනයනික තේ**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අපනයන අංශය හරහා ලැබෙන පූර්ව ආනයන නියැදි සමග අපනයනය සඳහා එහි වූ යෝග්‍යතාවය, ඇගයීමට ලක් කිරීම සඳහා ආකෘතියක් ද අඩංගු කර ඇත. සම්භවය, ශ්‍රේණිය සහ අදාළ අනෙකුත් තොරතුරු ආදී වශයෙන් සෑම ඉල්ලුම් පත්‍රයක ම අදාළ නියැදිය පිළිබඳ විස්තර ඇතුළත් ය. තේ රස බැලීමේ කණ්ඩායම විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ චක්‍රලේඛ අංක OR/1/65 සහ එහි සංශෝධනයන් හි මාර්ගෝපදේශ අනුව තේ නියැදි ඇගයීමට ලක් කරනු ලබයි. 2024 වසර සඳහා තේ රස බැලීමේ අංශය විසින් නියැදි 1,609 ක් පූර්ව ආනයන තේ සහ පශ්චාත් ආනයන වශයෙන් පරීක්ෂාවට ලක් කරන ලදී.

## 2.4.2. පුද්ගලික විකුණුම් අනුමත කිරීම සහ මණ්ඩල තක්සේරු සහතිකය

**අ) පුද්ගලික විකුණුම් අනුමත කිරීම**

ස්වාධීන තැරැව්කරුවන්ගේ අනුමැතිය සමග විකුණුම් තැරැව්කරුවන් විසින් ලැබෙන තේ නියැදි තේ රසය පිළිබඳ ඇගයීම සඳහා ඉදිරිපත් කර ඇත. මෙහි දී නියමිත සේවා ගාස්තු අදාළ වන අතර අනුමත කිරීමේ ගාස්තු වශයෙන් එක් තේ වර්ගයක් සඳහා රුපියල් 500 ක් අගය මත එකතු කළ බද්ද (VAT) අය කරනු ලැබේ. වර්තමානයේ දී, ඉහත යෝජනා ක්‍රමය කොළඹ වෙන්දේසි හරහා අලෙවි නොවන හරිත තේ, කාබනික තේ, විශේෂිත තේ සහ කුඩා පරිමාණයේ ශ්‍රේණි සඳහා පමණක් සීමා කර ඇත. සමස්ථයක් ලෙස 16,611 ක පුද්ගලික විකුණුම් කොටස් ප්‍රමාණයක් 2024 වර්ෂය සඳහා පරීක්ෂා කර අනුමත කරන ලදී.

**ආ) ඉදිරි කොන්ත්‍රාත්තු සහතික කිරීම**

ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවය අනුව තෝරා ගත් ලකුණු කිහිපයක් යම් කාල වකවානුවක් සඳහා අනුමත කිරීම මේ යටතේ සිදු කෙරේ. විකුණුම්කරු, ගැනුම්කරු, තැරැව්කරු සහ තේ මණ්ඩලය විසින් විකිණීමේ කොන්ත්‍රාත්තුව අනුමත කිරීම සිදු කරන ලදී. රු.500 ක අනුමත කිරීමේ ගාස්තුවක් සහ අගය මත එකතු කළ බද්ද (VAT) ඉහත සේවාව සඳහා ද අය කරන ලදී. වර්ෂය තුළ ඉදිරි කොන්ත්‍රාත්තු 2312 ක් අනුමත කරන ලදී.

**ඇ) සෘජු විකිණුම් අනුමත කිරීම**

තම නිෂ්පාදන සෘජුව ම විදේශීය ගැනුම්කරුවන්ට විකිණීම සඳහා ඉහත යෝජනා ක්‍රමය මගින් නිෂ්පාදකයාට සහ අපනයනකරුවාට අවසර දෙනු ලබයි. හරිත තේ හැර, කාබනික තේ සහ විශේෂ තේ දේශීය ගැනුම්කරුවන්ට අලෙවි කිරීමට හැකි විය. සඳුදා දිනයන් හි රැස් වන කමිටුව මගින් සෘජු විකුණුම් අනුමත කරන ලදී. එමෙන් ම සලකා බලන ලද වර්ෂය සඳහා විකුණුම් තොග 543 ක් අනුමත කරන ලද අතර අනුමත කළ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 0.505 කි.

### 2.4.3.සිංහ ලාංඡනය සඳහා ලියාපදිංචි වීම

ගුණාත්මකබව සහ ආරම්භක රට පිළිබඳ සංකේතයක් වන සිංහ ලාංඡනය හිමිකම ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වන අතර සන්නාම ගත පාරිභෝගික ඇසුරුම්වල සිංහ ලාංඡනය නිරූපණය කිරීමට අපේක්ෂා කරන අපනයනකරුවන් ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු යි. එහි දී ගමනාන්තය සහ වෙළඳපොළ අනුව සන්නාම ගත නිෂ්පාදන ඇගයීමට ලක් කරනු ලැබේ. වෙළඳ නාම සඳහා සිංහ ලාංඡන සහතිකයක වලංගු කාලය වසර තුනකි. සිල්ලර ඇසුරුම්වල සිංහ ලාංඡනය භාවිත කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අවසරය ලබා දෙනු ලබයි. 2024 වසරේ දී නව වෙළඳ නාම, අළුත් කිරීම් සහ අමතර ඇසුරුම් සඳහා අයදුම්පත් 487 ක් පිළිබඳ කටයුතු කරන ලදී.

ගුණාත්මකබව හා කීර්ති නාමය පවත්වා ගැනීම උදෙසා මෙන් ම ප්‍රධාන වශයෙන් සිංහ ලාංඡනය වංචනික ලෙස භාවිත කිරීමේ අවස්ථා හඳුනා ගැනීම සඳහා විදේශීය වෙළඳපොළවල සහ දේශීය වෙළඳපොළවල සිංහ ලාංඡනය භාවිතය පිළිබඳ අධීක්ෂණ ක්‍රියාවලින් සිදු කරනු ලැබේ. පූර්ව බෙදා හැරීමේ අධීක්ෂණය අතරවාරයේ දී සිංහ ලාංඡනය සහිත බෙදා හැරීමේ බඩු තොග 80%කට අධික ප්‍රමාණයක් අහඹු නියැදි පදනම මත ඇගයීමට ලක් කෙරේ. ඊට අමතර ව විදේශීය කාර්යාංශ සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සිටින වාණිජ උපදේශකයින් වෙත විදේශීය වෙළඳපොළවල තිබෙන සිංහ ලාංඡනය සහිත ඇසුරුම් ඇගයීම සහ වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. දේශීය වෙළඳපොළ තුළ සිංහ ලාංඡනය භාවිත කරන වෙළඳ නාම ද අහඹු ලෙස තෝරා ගැනීමෙන් ඇගයීමට ලක් කෙරේ. ප්‍රධාන වශයෙන්, තේ මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින හා සැලකිය යුතු වෙළඳපොළ කොටසක් හිමි කීර්තිමත් හා දිගු කාලීන ඇසුරුම්කරුවන්ට සිංහ ලාංඡනය භාවිත කිරීමට අවසර ලබා දී ඒ අනුව අධීක්ෂණය කරනු ලැබේ.

### 2.4.4. නව අපනයන සමාගම් සඳහා තේ රස බලන්නන් ඇගයීමට ලක් කිරීම

අපනයන සමාගම් විසින් පත් කරන ලද තේ රස බලන්නන් සතු තේවල විවිධ ප්‍රභේද / උන්නතාංශ සම්භවය හඳුනා ගැනීම සම්බන්ධයෙන් වේ. කුසලතා, දැනුම සහ හැකියාවන් ඇගයීම සිදු කරනු ලැබේ. අයදුම්කරුවන් මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරන අතර තේ රස බැලීමේ ඒකකයේ ප්‍රධානියාගෙන් සහ තේ රස බැලීමේ කණ්ඩායමේ සාමාජිකයින් තිදෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ.

## 2.5. විශ්ලේෂණ විද්‍යාගාරය

ගෝලීය වෙළෙඳපොළ තුළ සිලෝන් තේවල ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා වැදගත් කාර්යභාරය ක්ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (ශ්‍රී.ල.තේ.ම) විශ්ලේෂණ විද්‍යාගාරය ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තත්ත්ව සහතිකකිරීමේ ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් දේශීය නිෂ්පාදනයෙන් සහ අපනයන තොගවලින් ලබා ගත් තේ සාම්පල සඳහා විද්‍යාගාරය මගින් පුළුල් මට්ටමේ රසායනික හා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණයන් සිදු කරනු ලබයි. 2013 වර්ෂයේ සිට පවත්වා ගෙන එනු ලබන ISO / IEC 17025: 2017 ප්‍රතීතනය තුළින් විශිෂ්ටත්වය සඳහා විද්‍යාගාරයේ කැප වීම පිළිබිඹු වන අතර, එමගින් ජාත්‍යන්තර තේ වෙළඳාම තුළ තේවල ගුණාත්මකබව පිළිබඳ තක්සේරුව තුළ විශ්වාසදායී වන අධිකාරිභාවයක් ස්ථාපිත කරනු ලබයි.

### 2.5.1. විද්‍යාගාරයේ ව්‍යුහය

විශ්ලේෂණ විද්‍යාගාරය මනා කැපවීමෙන් කටයුතු කරන තත්ත්ව සහතික ඒකකයක සහාය ඇති විශේෂිත පරීක්ෂණ ඒකක තුනකින් සමන්විත වේ.

**අ) රසායනික විශ්ලේෂණ ඒකකය**

රසායන විශ්ලේෂණ විද්‍යාගාරය මගින් තේවල තෙතමන මට්ටම, පොලිෆිනෝල්, කැෆේන් මට්ටම් සහ අනෙකුත් ප්‍රධාන තත්ත්ව දර්ශක ඇතුළු තේවල අඩංගු රසායනික සංයුතිය තීරණය කිරීම සඳහා පරීක්ෂණ පවත්වනු ලබයි.

**ආ) ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය**

මෙම ඒකකය මගින් බැක්ටීරියා, යීස්ට් සහ පුස් වැනි දූෂක කොටස් හඳුනා ගැනීම සඳහා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ සිදු කරයි.

**ඇ) පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය**

ජාත්‍යන්තර ආහාර සුරක්ෂිතතා මූලධර්මවලට අනුකූල වීම සහතික කිරීම සඳහා පළිබෝධනාශක අපද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම මෙම ආයතනයෙන් සිදු කරයි.

**ඈ) තත්ත්ව පරීක්ෂණ ඒකකය**

රසායනාගාර භාවිතයන් ජාත්‍යන්තර ප්‍රතීතන අවශ්‍යතා සපුරාලන බව සහතික කරමින් තත්ත්ව පරීක්ෂණ ඒකකය මගින් ISO / IEC 17025:2017 ප්‍රමිතිය සමග අනුකූලතාවය අධීක්ෂණය කරයි. ඊට අමතර ව, කාර්ය සාධනය පිළිබඳ සටහන් කිරීම හා විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා මෙම ඒකකය මගින් රසායනාගාර අතර සිදු කරනු ලබන ප්‍රවීණතා පරීක්ෂණ සම්බන්ධීකරණය කරනු ලබයි. පවතින ක්‍රියා පටිපාටිවලට අනුකූල වෙමින් ඒ අනුව කටයුතු කිරීම පිළිබඳ සහතික කරමින් මෙම ඒකකය මගින් තත්ත්ව කළමනාකරණ පද්ධති ලේඛනකරණය කළමනාකරණය කරනු ලබයි.

### 2.5.2.විද්‍යාගාරයේ ක්‍රියාකාරීත්වය

**i).නියාමන සහාය**

ජාතික හා ජාත්‍යන්තර ආහාර සුරක්ෂිතතා නියාමයන්ට අනුකූල වීම සහතික කරමින් මෙම විද්‍යාගාරය මගින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට අත්‍යවශ්‍ය සහායක් ලබා දෙයි. එනම්,

- පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම උදෙසා පළිබෝධනාශක අපද්‍රව්‍ය සහ අනෙකුත් අපවිත්‍ර දෑ පිළිබඳ සම්පූර්ණ විශ්ලේෂණයන් සිදු කිරීම
- කාලෝචිත පරීක්ෂණ සේවා සිදු කරමින් නියාමන බලාත්මක කිරීමට සහ තීරණ ගැනීමට තේ කොමසාරිස් අංශයට සහාය වීම
- ගෝලීය වෙළෙඳපොළ තුළ සිලෝන් තේවල කීර්ති නාමය ආරක්ෂා කරමින් කළු සහ හරිත තේ ISO ප්‍රමිතීන්ට සහ SLTB හි අවම ගුණාත්මක අවශ්‍යතාවලට අනුකූල වන බවට සහතික කිරීම

**ii).පාර්ශවකරුවන් සඳහා විශ්ලේෂණ සේවා**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරය මගින් තේ නිෂ්පාදකයින්, අපනයනකරුවන් සහ තේ කර්මාන්තයේ අනෙකුත් පාර්ශවකරුවන්ට පුළුල් පරීක්ෂණ සේවා සපයනු ලබයි.එනම්,

- තේවල ගුණාත්මක බවට බලපාන පොලිෆිනෝල් අන්තර්ගතය සහ ප්‍රතිඔක්සිකාරක මට්ටම් ඇතුළුව සවිස්තරාත්මක රසායනික සංයුතිය විශ්ලේෂණය
- තේවල ආරක්ෂාවට බලපාන අපවිත්‍රකාරක හඳුනා ගැනීම සඳහා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ
- ශක්තිමත්ව ක්‍රියාත්මක වන ජාත්‍යන්තර රෙගුලාසිවලට අනුකූල වීම තහවුරු කිරීම සඳහා පළිබෝධනාශක අපද්‍රව්‍ය විශ්ලේෂණය

**iii).පර්යේෂණ සහ සංවර්ධන සහාය**

විශ්ලේෂණාත්මක ක්‍රමවේද වැඩි දියුණු කිරීම සහ නව පරීක්ෂණ ක්‍රම සංවර්ධනය කිරීම සඳහා රසායනාගාරය විසින් ක්‍රියාකාරීව පර්යේෂණ සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය සමග එක් ව කටයුතු කිරීමෙන් හා පරීක්ෂණ ක්‍රම පිළිබඳ අඛණ්ඩ යාවත්කාලීන වීමෙන්, වෙනස් වන ගෝලීය ප්‍රමිතීන්ට අනුගත වෙමින් ශ්‍රී ලංකා තේවල තත්ත්ව තක්සේරු කිරීම් සිදු කිරීමට හැකි වේ. මීට අමතරව, තේ විද්‍යාවට අදාළ අධ්‍යයන පර්යේෂණ සිදු කරන විශ්වවිද්‍යාල සිසුන්ට සහාය ලබා දීම ද රසායනාගාරය මගින් සිදු කරනු ලබයි.

**iv). සහතික කිරීම හා ලේඛන ගත කිරීම**

අපනයන සම්බන්ධ ලියකියවිලි සම්බන්ධයෙන් ඉතා වැදගත් ජාත්‍යන්තරව පිළිගත් පරීක්ෂණ වාර්තා සහ විශ්ලේෂණ සහතික නිකුත් කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණාත්මක විද්‍යාගාරය මගින් සිදු කරනු ලබයි. මෙම සහතික කිරීම් වෙළඳ මෙහෙයුම් සඳහා අඛණ්ඩ ව පහසුකම් සපයන අතර, ගෝලීය වශයෙන් පැවතිය යුතු ගුණාත්මකබව සිලෝන් තේවල අඩංගු බවට සහතික කරයි.

**v). තාක්ෂණික පුහුණුව සහ විශේෂඥතාව**

රසායනාගාරය විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වශයෙන්, විශ්ව විද්‍යාල සිසුන් සඳහා වෘත්තිමය පුහුණු අවස්ථා සපයන අතර, උසස් රසායනාගාර භාවිතයන් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙයි.

රසායනාගාරය තුළ වූ විධිමත් පරීක්ෂණ ක්‍රමවේද , ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සහ නවෝත්පාදනය සඳහා කැපවීම යනාදිය තුළින්, සිලෝන් තේ ලෝකයේ හොඳම තේ වශයෙන් එහි උරුමය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරය මගින් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

## 2.5.3. 2024 වසර තුළ රසායනාගාරයේ කාර්ය සාධනය සහ වැඩි දියුණු කිරීම්

### a). රසායනික විශ්ලේෂණ ඒකකය

රසායනික විශ්ලේෂණ ඒකකය මෑතක දී නව විශ්ලේෂණ ක්‍රම හඳුන්වා දීම හා රසායනාගාර උපකරණ වැඩි දියුණු කිරීම තුළින් එහි පරීක්ෂණ හැකියාවන් පුළුල් කර ඇත. මෙහි දී පහත පරීක්ෂණ ක්‍රම හඳුන්වා දී ඇත.

- **තේ වල පොලිෆීනෝල් නිර්ණය කිරීම (ISO 14502-1:2005)**

මෙම පරීක්ෂණය මගින් තේ වල ප්‍රතිඔක්සිකාරක ගුණාංග පිළිබඳ මනා අවබෝධයක් ලබා දෙන අතර එමගින් ගුණාත්මකබව මෙන් ම සෞඛ්‍ය ප්‍රතිලාභ පිළිබඳ තක්සේරුවක් ද ලබා දේ.

- **තේ වල අඩංගු Theanine නිර්ණය කිරීම (ISO 19563:2016)**

Theanine යනු තේවල රසය හා ලිහිල් කිරීමේ ගුණාංග කෙරෙහි බලපාන ප්‍රධාන ඇමයිනෝ අම්ලයක් ය. තේවල ගුණාත්මක බවේ ප්‍රභේදනය හා නිෂ්පාදන සංවර්ධනයට මෙම පරීක්ෂණය සහාය වේ.

- **තේ වල පොලිෆීනෝල් නිර්ණය කිරීම (ISO 14502-1:2005)**

මෙම ක්‍රමය සඳහා ISO/IEC 17025:2017 ප්‍රතීතනය හිමි වී ඇති අතර, එමගින් රසායනාගාරයේ විශ්ලේෂණ සේවාවන් හි විශ්වසනීයත්වය තවදුරටත් ශක්තිමත් කරනු ලබයි.

මෙම පුළුල් හැකියාවන් සඳහා සහාය වීමට, මෙම ඒකකය වෙතට නවීන විශ්ලේෂණ උපකරණ ලබා ගෙන ඇත. පහත දැ ඒ අතරට අයත් වේ.

- **Agilent HPLC පද්ධතිය**

(කොටස් හතරක් සහිත පොම්පය, වායු වෙන් කරන යන්ත්‍රය, ස්වයංක්‍රීයව සාම්පල වෙන් කරන යන්ත්‍රය, තීරු මැදිරිය, ඉහළ ක්‍රියාකාරී පරිගණකය සහ DAD, ELSD සහ IR ඇතුළු ව පවතින පරීක්ෂණ උපකරණය සඳහා මෘදුකාංග). මෙම පද්ධතිය මගින් තේ සංයෝග ඉතා නිවැරදිව වෙන් කිරීමට සහ ප්‍රමාණනය කිරීමට හැකි වන අතර පරීක්ෂණ නිරවද්‍යතාවය සහ කාර්යක්ෂමතාව ද වැඩි දියුණු කරයි.

- **UV-VIS වර්ණාවලි ඡායාරූප**

වර්ණාවලි විශ්ලේෂණය සඳහා අත්‍යවශ්‍ය මෙම උපකරණය මගින් පොලිෆීනෝල් සහ වර්ණමිතික පරීක්ෂණවල නිරවද්‍යතාවය වැඩි කරන අතර වඩා හොඳ ගුණාත්මක ඇගයීමකට දායක වේ.

- **අර්ධ ස්වයංක්‍රීය දළ තන්තු විශ්ලේෂකය**

තේ ශ්‍රේණි ගත කිරීමේ සහ වර්ගීකරණයේ වැදගත් පරාමිතියක් වන තේ වල අඩංගු දළ තන්තු නිවැරදි ව පහසුවෙන් මෙමගින් තීරණය කළ හැකි ය.

### b). ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය

තේවල ආරක්ෂාව සහතික කිරීම උදෙසා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය මගින් තක්සේරු කිරීම් සිදු කරයි. ජාත්‍යන්තර වෙළෙඳපොළවල පාරිභෝගික ආරක්ෂාව සහ නියාමන අනුකූලතාවය යන දෙඅංශය ම සඳහා ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ සිදු කොට ගුණාත්මකභාවය සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. සිලෝන් තේවල කීර්ති නාමය ආරක්ෂා කිරීම සඳහා මෙම ඒකකය විසින් ඉහළ මට්ටමේ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ ශිල්ප ක්‍රම භාවිත කරනු ලබයි.

වඩාත් කාර්යක්ෂම සහ විශ්වාසදායක ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ පැවැත්වීමට පහසුකම් සැලසීම සඳහා ඒකකය පහත නව උපකරණ ලබාගන්නා ලදී.

- **උඳුන් තැටිය (Hot Plate)**

පාලනය කරන ලද තාපය අවශ්‍ය වන රසායනාගාර ක්‍රියාවලින් මෙමගින් වැඩි දියුණු කරන අතර ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණය සඳහා වඩා හොඳින් සාම්පල සකස් කිරීම ද සිදු කරයි.

- **පීඩන තාපකය (Autoclave)**

අපවිත්‍ර නොවූ පරීක්ෂණ පරිසරයන් සහතික කරමින් මාධ්‍ය සහ රසායනාගාර උපකරණ විෂබීජහරණය කිරීම සඳහා භාවිත කරන උපකරණයකි.

- **නිරවද්‍ය තුලාව (Precision Balance)**

පරීක්ෂණයේ සමස්ත නිරවද්‍යතාවය සහ අනුකූලතාව වැඩි දියුණු කරමින් අදාළ නියැදි නිවැරදි මිනුම්වලට අනුව සකස් කරනු ලබයි.

### c). පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකකය

ශ්‍රී ලංකා තේ ජාත්‍යන්තර ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන්ට අනුකූල වන බවට සහතික කිරීම සඳහා පළිබෝධනාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. අපනයනය කරනු ලබන තේ ජාත්‍යන්තර උපරිම අපද්‍රව්‍ය සීමාවන්ට (MRL) අනුකූල වන බවට සහතික කරමින්, පළිබෝධනාශක පරීක්ෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා මෙම ඒකකය මගින් නව පරීක්ෂණ ක්‍රම හඳුන්වා දී ඇත. මෙම නව ක්‍රම හඳුන්වා දීම තුළින් පුළුල් පරාසයක පළිබෝධනාශක අපද්‍රව්‍ය හඳුනා ගැනීමට ඇති රසායනාගාරයේ හැකියාව වර්ධනය කරන අතර එමගින් නියාමන අනුකූලතාවය සහ පාරිභෝගික විශ්වාසය ශක්තිමත් කරනු ලබයි.

- **හරිත තේවල (ISO 14502-2:2005) අඩංගු කැෆෙන් සහ කැටේචින් (+C, EC, EGC, ECG, සහ EGCG) නිර්ණය කිරීම.**

හරිත තේවල තත්ත්ව පාලනය සහ සෞඛ්‍යට සම්බන්ධ ගුණාංග සඳහා ඉතා වැදගත් වන කැටේචින් සහ කැෆෙන් මට්ටම් නිවැරදිව මැනීමට මෙම පරීක්ෂණය මගින් හැකියාව ලැබේ.

- **LC-MS/MS මගින් ග්ලයිෆොසේට් නිර්ණය කිරීම**

පුළුල් ව නිරීක්ෂණය කරනු ලබන වල් නාශකයක් වන ග්ලයිෆොසේට් හොඳින් හඳුනා ගැනීමට මෙම පරීක්ෂණය මගින් හැකියාව ලබා දෙන අතර ගෝලීය අපද්‍රව්‍ය සීමාවන් සහ ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කරයි. නව පරීක්ෂණ ක්‍රම සහ අති නවීන උපකරණ භාවිත කිරීම මගින් විද්‍යාගාරයේ කාර්යක්ෂමතාව, නිරවද්‍යතාවය සහ විශ්ලේෂණ විෂය පථය තුළ සැලකිය යුතු අන්දමේ වර්ධනයක් ඇති කරයි. පොලිෆිනෝල් නිර්ණය කිරීමේ පරීක්ෂණ ක්‍රමය පිළිගැනීම මගින් තේ පිළිබඳ තත්ත්ව සහතික ලබා දෙන විශ්වාසදායක අධිකාරියක් වශයෙන් රසායනාගාරය තවදුරටත් පිළිගැනීමට ලක් වේ.

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල පුළුල් තත්ත්ව තක්සේරු සේවා ලබා දීමෙන් ඉහළ මට්ටමේ විශ්ලේෂණ හැකියාවන් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට සහාය වේ. මෙම වැඩි දියුණු කිරීම් හරහා, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරය තේ තත්ත්ව සහතිකය, විද්‍යාත්මක විශිෂ්ටත්වය සහ ගෝලීය තරගකාරිත්වයේ ඉහළ ම ප්‍රමිතීන් පවත්වා ගැනීමට කැප වී කටයුතු කරයි.

## 2.5.4. විශ්ලේෂණ රසායනාගාරය විසින් සිදු කරන ලද වාර්ෂික පරීක්ෂණවල සාරාංශය

වගුව 2.5.1: විශ්ලේෂණ රසායනාගාරය විසින් සිදු කරන ලද පරීක්ෂණවල සාරාංශය

| පරීක්ෂණයේ නම | 2023 | 2024 |
|---|---|---|
| **රසායනික විශ්ලේෂණ ඒකකය** | | |
| තේ වල තෙතමනය තීරණය කිරීම | 327 | 832 |
| තේ වල අඩංගු ජලසාරය තීරණය කිරීම | 176 | 282 |
| තේ වල අඩංගු සමස්ථ අළු ප්‍රමාණය තීරණය කිරීම | 175 | 293 |
| තේ වල අඩංගු ජලයේ ද්‍රාව්‍ය අළු ප්‍රමාණය නිර්ණය කිරීම | 174 | 282 |
| තේ වල අඩංගු ද්‍රාව්‍ය අළුවල ඇති අම්ල ප්‍රමාණය නිර්ණය කිරීම | 174 | 282 |
| තේ වල අඩංගු ජලයේ ද්‍රාව්‍ය අළුවල ක්ෂාරීයතාව තීරණය කිරීම | 176 | 284 |
| තේ වල ඇති අමු කෙඳි ප්‍රමාණය තීරණය කිරීම | 190 | 452 |
| ශ්‍රේණිය හඳුනා ගැනීමේ පරීක්ෂණ / පෙරණ විශ්ලේෂණය | 41 | 37 |
| මූලික විකිරණ නිර්ණය කිරීමේ පරීක්ෂණ | 242 | 204 |
| තේ වල අඩංගු සමස්ථ පොලිෆිනෝල් ප්‍රමාණය නිර්ණය කිරීම | - | 36 |
| **ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය** | | |
| සමස්ථ පට්ටක ගණන තීරණය කිරීම | 198 | 412 |
| යීස්ට් සහ පුස් ප්‍රමාණය තීරණය කිරීම | 204 | 417 |
| මළ කොලිෆෝම් සහ එස්චරිචියා කොලි (E.coli) හඳුනා ගැනීම සහ ගණනය කිරීම | 198 | 421 |
| සම්පූර්ණ කොලිෆෝම් හඳුනා ගැනීම සහ ගණනය කිරීම | 198 | 423 |
| තේවල ඇති මැරුණු හෝ සජීවී කෘමීන් සහ වෙනත් අපද්‍රව්‍ය / බාහිර ද්‍රව්‍ය පිළිබඳ අන්වීක්ෂීය පරීක්ෂණය | 37 | 32 |
| තේවල අඩංගු ජානමය වශයෙන් වෙනස් කරන ලද ජීවීන් (GMO) නිර්ණය කිරීම | 113 | 149 |
| **පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය** | | |
| HPLC RI අනාවරකය භාවිත කරමින් සීනි පිළිබඳ විශ්ලේෂණය | 1810(5430)[a] | 1873(5619)[a] |
| LCMS/MS භාවිතයෙන් ඩයිරෝන් විශ්ලේෂණය | 354 | 421 |
| LCMS/MS භාවිතයෙන් MCPA සහ 2,4 D අපද්‍රව්‍ය විශ්ලේෂණය | 354 | 416 |
| LCMS/MSභාවිතයෙන් බහු අපද්‍රව්‍ය විශ්ලේෂණය (Acephate, Imidacloprid, Dimethoate, Methidathion, Triazophos, Fipronil, Quinalphos, Propiconazole & Profenofos) | 434(3906)[b] | 963(8667)[b] |
| ග්ලයිෆොසෙට් අපද්‍රව්‍ය විශ්ලේෂණය | - | 230 |
| **එකතුව** | **5,573** | **8,741** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තේවල ගුණයේ ඉහළ ප්‍රමිතීන් හා ආරක්ෂාව සහතික කිරීම උදෙසා වූ අඛණ්ඩ කැප වීම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරය මගින් වර්ෂය තුළ සැලකිය යුතු පරීක්ෂණ ගණනාවක් සිදු කරන ලදී.

a) සංයෝග 3 ම එක ම පරීක්ෂණ ක්‍රමවේදය භාවිත කරමින් පරීක්ෂා කළ බැවින් 2023 වර්ෂයේ නියැදි සංඛ්‍යාව 3 න් ගුණ කර පරීක්ෂණ සංඛ්‍යාව ගණනය කරන ලදී.

b)සංයෝග 9 ම එක ම පරීක්ෂණ ක්‍රමවේදය භාවිත කරමින් පරීක්ෂා කළ බැවින් 2023 වර්ෂයේ නියැදි සංඛ්‍යාව 9 න් ගුණ කර පරීක්ෂණ සංඛ්‍යාව ගණනය කරන ලදී.

## 2.6.පාලන අංශය

සියලු ම මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් සැකසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම, නෛතික කටයුතු කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පුස්තකාලය, ප්‍රසම්පාදන කටයුතු, ආරක්ෂක සහ ප්‍රවාහන කටයුතු ආදිය කළමනාකරණය සහ නඩත්තු කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරිපාලන අංශයේ වගකීම් වේ.

වගුව 2.6.1: 2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

| වර්ගය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | 4 |
| තෘතියික මට්ටම | 18 | 13 | 31 |
| ද්විතියික මට්ටම | 56 | 96 | 152 |
| ප්‍රාථමික මට්ටම | 55 | 07 | 62 |
| එකතුව | | | 249 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

වගුව 2.6.2 : 2024 වසර සඳහා මානව සම්පත් පිරිවැටුම

| විස්තරය | කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව |
|---|---|
| ඉල්ලා අස්වීම් | 16 |
| විශ්‍රාම ගැනීම් | 05 |
| සේවය අවසන් වීම් | 01 |
| තනතුර හැර යාම් | 01 |
| එකතුව | 23 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

වගුව 2.6.3: මානව සම්පත් සංවර්ධනය දේශීය පුහුණු (පුද්ගල)

| විස්තරය | පුහුණු කළ සේවකයින් ගණන |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 07 |
| තෘතියික මට්ටම | 40 |
| ද්විතියික මට්ටම | 60 |
| ප්‍රාථමික මට්ටම | 00 |
| එකතුව | 107 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### 2.6.1. අභ්‍යන්තර පුහුණු වැඩසටහන්

2024 වසර තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විධායක කාර්ය මණ්ඩලය, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ කළමනාකරණ සහකාර කාර්යමණ්ඩලය සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 08 ක් පවත්වා ඇත. විධායක කාර්ය මණ්ඩලය, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය තාක්ෂණික වශයෙන් බල ගැන්වීම හා අභියෝගාත්මක පරිසරයක් තුළ කාර්යක්ෂම සේවයක් තේ කර්මාන්තයට ලබා දීම මෙහි අරමුණ විය.

වගුව 2.6.4: පුහුණු පිළිබඳ සාරාංශය

| සේවක මට්ටම | දේශීය පුහුණු ගණන |
|---|---|
| ජ්‍යෙෂ්ඨ,මධ්‍යම හා ප්‍රාථමික කළමනාකරණ මට්ටම් | 47 |
| තේ පරීක්ෂක / උපදේශක (කළමනාකරණ සහකාර තාක්ෂණික) | 40 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 20 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### 2.6.2. දේශීය සංවර්ධන අවස්ථා අධ්‍යයන (පුද්ගල)

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පුහුණු ප්‍රතිපත්තිය අනුව, අදාළ විෂය ක්ෂේත්‍රය තුළ උසස් අධ්‍යාපනය සම්පූර්ණ කළ නිලධාරීන් 04 ක් සඳහා මුදල් ගෙවන ලදී.

වගුව 2.6.5: විදේශීය පුහුණු (පුද්ගල)

| වර්ගය | පුහුණු කළ සේවකයින් ගණන |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 00 |
| තෘතියික මට්ටම | 08 |
| ද්විතියික මට්ටම | 02 |
| ප්‍රාථමික මට්ටම | 00 |
| එකතුව | 10 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.7. අභ්‍යන්තර විගණන ඒකකය

ශ්‍රී ලංකා රජයේ තේ කම්හල් හිමියන්, තේ වතු හිමියන්, තේ අංශයේ සේවකයන් සහ මහජනතාව වැනි ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම සඳහා මූල්‍ය, පරිපාලන සහ මානව සම්පත් ඵලදායී ලෙස යොදා ගැනීම උදෙසා අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කිරීම අභ්‍යන්තර විගණන ඒකකයේ අරමුණ වේ.

2024 වසර පුරාවට කාර්යක්ෂමතාව, නිරවද්‍යබව හා අනුකූලතාවය වර්ධනය කරමින් විගණන අංශය විසින් සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන තිබේ. අභියෝග හමුවේ වුව ද, තාක්ෂණය භාවිතය, දක්ෂතා වර්ධනය සහ ක්‍රියාශීලී අවදානම් කළමනාකරණය තුළින් තම හැකියාවන් වැඩි දියුණු කිරීමට මෙම අංශය දිගින් දිගට ම කැප වී කටයුතු කරයි. ඉදිරියට ම ගමන් කරමින්, මෙම ජයග්‍රහණ මත සාර්ථකව කටයුතු කරමින් ආයතනික අරමුණු සහ සාර්ථකත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා අංශයේ දායකත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට සාමූහික උත්සාහයෙන් කටයුතු කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටුව තුන් වතාවක් රැස් වූ අතර අවශ්‍යතා පදනම මත කරන ලද ආරාධනයෙන් අදාළ අංශ ප්‍රධානීන් / නිලධාරීන් කමිටුවේ රැස්වීම්වලට සහභාගි විය. සුදුසු නිවැරදි ක්‍රියා මාර්ග ගැනීම සහතික කිරීම සඳහා වාර්තා සහ පසු විපරම් ද සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.

# 2.8. තොරතුරු තාක්ෂණ ඒකකය

කාර්යභාරයන් විධිමත් කිරීම සහ සමස්ත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් අති නවීන තාක්ෂණයන් භාවිත කිරීම සඳහා නිරන්තර ප්‍රයත්නයකින් කටයුතු කරන සහායක අංශයක් වශයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. ආයතනික රාමුව තුළ භෞතික සහ අථත්‍ය යන ආරක්ෂක ක්‍රම දෙක ම ශක්තිමත් කරන උසස් මට්ටමේ ක්‍රම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, අපගේ වත්මන් උපාය මාර්ගික ප්‍රමුඛතාවලට ඇතුළත් වේ. අංශ කිපයකින් යුත් මෙම ප්‍රවේශය මගින් සංවේදී දත්තවල රහස්‍යභාවය, අඛණ්ඩතාව සහ සුලභතාවය සහතික කරන අතර, වැදගත් අයතනික කටයුතු බාධාවකින් තොරව සිදු කිරීමට ඉඩ සලසයි. දියුණු තාක්ෂණ භාවිතයෙන් හා ශක්තිමත් ආරක්ෂක පියවරයන් අනුගමනය කිරීමෙන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය තුළ නවෝත්පාදන හා විශිෂ්ට මෙහෙයුම් පිළිබඳ පරිසරයක් නිර්මාණය කිරීමේ කටයුත්ත සඳහා තොරතුරු තාක්ෂණ අංශය කැප වී කටයුතු කරයි.

### i.CCTV යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

පරිශ්‍රය තුළ තත්කාලීන අධීක්ෂණ හා, පුළුල් මට්ටමේ නිරීක්ෂණ කටයුතු වැඩිදියුණු කිරීම මෙමගින් සහාතික කරනු ලැබේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අභ්‍යන්තර සහ බාහිර පරිශ්‍ර දෙකෙ හි ම CCTV කැමරා 11 ක් සවි කර ඇත. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සම්පූර්ණ ගොඩනැගිල්ල සහ අවට ප්‍රදේශය ආවරණය කිරීමට එමගින් අපේක්ෂා කෙරේ.

කැමරා සංඛ්‍යාව වැඩි කිරීමෙන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අභ්‍යන්තර සහ බාහිර ප්‍රදේශ දෙක ම හොඳින් අධීක්ෂණය කළ හැකි අතර, අනවසරයෙන් ඇතුල් වීම, සොරකම් වැළැක්වීම සහ සේවකයින්ගේ සහ වත්කම්වල ආරක්ෂාව එමගින් සහතික කළ හැකිය.

### ii. ෆයර්වෝල සහ සයිබර් ආරක්ෂාව ශක්තිමත් කිරීම

සයිබර් තර්ජන දිනෙන් දින වෙනස් වෙමින් අති නවීන අකාරයෙන් බලපෑම් කරන විට දී, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ෆයර්වෝල් සහ සමස්ත සයිබර් ආරක්ෂක පද්ධති ශක්තිමත් කිරීම සඳහා ප්‍රමුඛතාවය දීම අත්‍යවශ්‍ය වේ. සයිබර් ප්‍රහාරවලින්, තොරතුරු ජාලය සහ සංවේදී දත්ත ආරක්ෂා කර ඇති බව සහතික වෙමින් ඉහළ ම ප්‍රමුඛතාවයක් ලබා දී පවතින ඕනෑම අවදානමක් විසඳිය යුතු ය. සැක සහිත ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා ජාලයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව නිරීක්ෂණය කළ යුතු අතර වංචනික උත්සාහයන්, අනර්ථකාරී මෘදුකාංග සහ ආරක්ෂාවට පොදුවේ බලපෑම් කරන අනෙකුත් තර්ජන හඳුනා ගෙන ඒවා වළක්වා ගැනීම තොරතුරු තාක්ෂණ කණ්ඩායමක් විසින් කරනු ලබයි.

### iii.TVCM පද්ධතිය වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අගයදාමය කළමණාකරණ පද්ධතිය සම්පූර්ණ කිරීම උදෙසා තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය 2024 වර්ෂය පුරා සේවා සැපයුම්කරු සමග මනා සහයෝගයෙන් කටයුතු කළේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සියලු ම සකසන්නන් සඳහා වට තුනකට පරිශීලක පිළිගැනීමේ පරීක්ෂාව ද සිදු කරමින් ව්‍යාපෘතිය 80% ක මට්ටමකට සම්පූර්ණ කිරීමට හැකි වූ අතර, මෙයට පද්ධතියේ පවතින ඕනෑම අඩු පාඩුවක් හෝ අකාර්යක්ෂමතාවයක් හඳුනා ගෙන ඒ සඳහා විසඳුම් ලබා දීම හා විවිධ මාර්ග ඔස්සේ බාධාවකින් තොරව සන්නිවේදනය සිදු කිරීම ද ඇතුළත් වේ. ප්‍රශස්ත සන්නිවේදන ක්‍රියාවලින් ඇති කිරීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා තේ කර්මාන්තයේ කොටස්කරුවන් අතර සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා ලබන වසර වන විට සමස්ත පද්ධතියම සම්පූර්ණ කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමනාකරණය අපේක්ෂා කරයි.

# 3. කර්මාන්ත පැතිකඩ

කිලෝ මිලියන 262 ක නිෂ්පාදනයක් සහිතව 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය තුළ සැලකිය යුතු වර්ධනයක් ඇති වූ අතර, වසර පුරාවට සිදු වූ ධනාත්මක වර්ධනයන් තුළින් ශක්තිමත් වූ ආර්ථික ප්‍රකෘතිය කරා තිරසාර ලෙස රට ගමන් කිරීම එමගින් පිළිබිඹු කරයි. 2019 වසරේ අග භාගයේ පටන් ශ්‍රී ලංකා ආර්ථිකය දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දුන් අතර ආර්ථික දර්ශක, වෙළඳපොළ ඉල්ලුම සහ සැපයුම, විනිමය අනුපාත, විදේශ විනිමය ඉපැයීම්, උද්ධමනය, දළ දේශීය නිෂ්පාදන වර්ධන අනුපාත සහ අභ්‍යන්තර දේශපාලන වාතාවරණයන් අහිතකර ලෙස පැවතුණි.

කෙසේ වෙතත් 2024 වර්ෂය උදාවත් සමග, අභියෝගවල දැඩි බව ලිහිල් වීම, අවිනිශ්චිතතාවන් තුරන් වීම, නිසා 2024 වර්ෂයේ උදාවත් සමග සෑම අංශයකම කැපී පෙනෙන සුභවාදී බවක් ඇතිවිය.

විශේෂයෙන්, ගෝලීය ඉල්ලුම ඉහළයාම, උපායමාර්ගික අපනයන ක්‍රියාකාරකම්, අගය එකතු කළ නිෂ්පාදන සහ තිරසාර නිෂ්පාදන සඳහා ආයෝජන ඉහළයාම යන කරුණු හේතුවෙන් තේ කර්මාන්තයේ සැලකිය යුතු වර්ධනයක් ඇති විය. එපමණක් නොව, 2023 දී වාර්තා වූ කිලෝ ග්‍රෑම් මිලියන 262 ට සාපේක්ෂව 2024 දී තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 6 කින් වැඩි විය. සාම්ප්‍රදායික තේ සිලෝන් තේ වල ප්‍රමුඛ කාණ්ඩය වශයෙන් පවතී. 2024 වර්ෂයේ දී නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 236 ක් වූ අතර 2023 වර්ෂයේ අනුරූප කාල වකවානුව තුළ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 231 ක් විය. CTC නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව 2024 වර්ෂයේ දී 5% ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. අනෙක් අතට, 2024 දී හරිත තේ නිෂ්පාදනය 1% ක සුළු අඩුවීමක් වාර්තා කළේය.

2024 වර්ෂයේ දී දේශීය වෙන්දේසිය තුළ තේ අලෙවි ප්‍රමාණය 2023 ට සාපේක්ෂව 4% ක වර්ධනයක් වාර්තා කළ අතර එමගින් වෙළඳපොළ ඉල්ලුමේ ධනාත්මක ප්‍රවණතාවක් පිළිබිඹු කරයි. මීට අමතරව, වෙළඳපළ අගයේ වර්ධනයක් පෙන්නුම් කරමින් කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය විකුණුම් මිල රුපියල් 66 කින් වැඩි විය. ඇමෙරිකානු ඩොලර් මිලියන 978 (රුපියල් බිලියන 295ක) සමස්ත විකුණුම් ඉපැයීම්වලට (රාජ්‍ය, පෞද්ගලික, ඍජු ඇතුළුව) දායක වෙමින් දේශීය විකුණුම් තුළ කිලෝ ග්‍රෑමයක මිල ඇමෙරිකානු ඩොලර් 4 ක් වශයෙන් වාර්තා විය.

2023 දී කිලෝ ග්‍රෑම් මිලියන 242 ක් වූ සමස්ත තේ අපනයන ප්‍රමාණයට සාපේක්ෂව වසර තුළ සමස්ත තේ අපනයනය කිලෝග්‍රෑම් මිලියන 246 ක් විය. එපමණක් නොව, 2023 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය තුළ අපනයන ඉපැයීම් රුපියල් බිලියන 428 ක් වූ අතර 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා අපනයන ඉපැයීම් රුපියල් බිලියන 433 ක් දක්වා ඉහළ ගොස් තිබේ. 2023 වර්ෂයේ දී ඇමරිකානු ඩොලර් බිලියන 1.3 ක් වූ අපනයන ආදායම 2024 වර්ෂයේ දී ඇමරිකානු ඩොලර් බිලියන 1.4 දක්වා ඉහළ ගොස් ඇති අතර, එය සිලෝන් තේ අපනයනයෙන් ලද ඇමරිකානු ඩොලර් ඉපැයීම්වල 10% ක වර්ධනයක් පිළිබිඹු කරයි. මේ අතර, 2024 දී වාර්තා වූ සාමාන්‍ය FOB මිල කිලෝග්‍රෑමයකට රුපියල් 1,764 ක් වූ අතර 2023 දී එය කිලෝග්‍රෑමයකට රුපියල් 1,770 ක් දක්වා සුළු වශයෙන් අඩු විය. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේ ම කොටස්කරුවන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් වෙළඳපළ විවිධාංගීකරණය තුළින් අපනයන වෙළඳපොළ පුළුල් විය. සමාලෝචිත කාලය තුළ, ඉරාකය සිලෝන් තේ අපනයනයේ ප්‍රධාන රටක් ලෙස ඉස්මතු වූ අතර, එමගින් කිලෝග්‍රෑම් මිලියන 34 ක් ආනයනය කරමින් සමස්ත අපනයන ප්‍රමාණයෙන් 14% ක් සඳහා දායක විය. ඉහළ ම අපනයන ප්‍රමාණයක් සඳහා දායක වන අනෙකුත් ප්‍රධාන රටවල් පහ අතරට රුසියාව (කිලෝග්‍රෑම් මිලියන 25), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (කිලෝග්‍රෑම් මිලියන 21), තුර්කිය (කිලෝග්‍රෑම් මිලියන 18) සහ චීනය (කිලෝග්‍රෑම් මිලියන 12) ඇතුළත් විය. මෙම ඉහල අපනයන වෙළඳපොළවල් පහ මගින් සමස්ත තේ අපනයනයෙන් 45% කට දායක විය.

වත්මන් වෙළඳපළ තත්ත්වයන් හා නිෂ්පාදනයට අදාළ සාධක සලකා බැලීමේ දී, තේ කර්මාන්තයේ ඉදිරි ගමන ධනාත්මක වන බවට අපේක්ෂාවක් ඇත. ප්‍රධාන කලාපවල වර්ධනයට සමගාමීව අපනයන වෙළඳපොළ අඛණ්ඩව විවිධාංගීකරණය වීම තුළින් තේ කර්මාන්තය ගෝලීය වශයෙන් පවතින ඉල්ලුමේ වෙනස්කම් සඳහා හොඳින් හැඩගැසෙන බව පෙන්නුම් කරයි. තේ කර්මාන්තයේ තිරසාර වර්ධනයක් ඇති කරමින් නිෂ්පාදන කාර්යක්ෂමතාව හා ගුණාත්මකභාවය සඳහා වැඩි වැඩියෙන් ආයෝජන කිරීම මෙම ප්‍රගතිය සඳහා තවදුරටත් හේතු වේ. නැගී එන වෙළඳපොළවල පුළුල් වෙමින් පවතින අවස්ථා සහ ස්ථාවර මට්ටමක් සහිත කලාපවල පවතින ශක්තිමත් පදනම හේතුවෙන්, ඉදිරි වසරවල දී තේ කර්මාන්තයේ ඔරොත්තු දීමේ හැකියාව සහ අඛණ්ඩව සාර්ථකව කටයුතු කිරීමේ හැකියාව ඇති කරයි.

## 3.1. තේ ඉඩම් ව්‍යාප්තිය

වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ තේ වගා කරන සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 269,875 කි. මෙම තේ, වතු කළමනාකරණ නිර්ණායක අනුව පෞද්ගලික අංශය (74%) සහ රාජ්‍ය අංශය (26%) යනුවෙන් වර්ග කළ හැකිය. තේ වගාව සඳහා හිතකර දේශගුණික තත්ත්වයන් හේතු කොට ගෙන මෙරට තේ වගාව ප්‍රධාන වශයෙන් තෙත් කලාපයේ හා දිස්ත්‍රික්ක කිහිපයක් තුළ ව්‍යාප්තව ඇත.

## 3.2. තේ නිෂ්පාදනය

වගා කරන හා නිෂ්පාදනය කරන උන්නතාංශ මත පදනම් ව ශ්‍රී ලංකාවේ තේ කාණ්ඩ තුනකට වර්ගීකරණය කෙරේ. පහත රට තේ නිෂ්පාදනය කරනු ලබන්නේ මුහුදු මට්ටමේ සිට මීටර් 600 ක් පමණ ඉහළින් වන අතර ජාතික නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට වඩා (2024 දී 61%) දායක වන අතර එය කළු පැහැති පෙනුමක්, තද වර්ණයක් සහ රසයකින් යුක්ත ය.

මීටර 1200 ට වැඩි උස් ප්‍රදේශයක නිපදවන තේ, උඩරට තේ ලෙස හඳුනා ගෙන ඇති අතර, සුවඳක් හා අද්විතීය රසයක් සහිත ගුණාත්මක බවින් ඉහළ තේ වශයෙන් සලකනු ලබයි. 2024 වර්ෂය තුළ ජාතික නිෂ්පාදනය සඳහා උඩරට සහ මැදරට දායකත්වය පිළිවෙලින් 21% සහ 18% කි. එමෙන් ම, පහතරට තේ මගින් ජාතික තේ නිෂ්පාදනයෙන් තුනෙන් දෙකක ට (61%) වඩා දායකත්වයක් ලබා දුනි.

වගුව 3.2.1: උන්නතාංශය අනුව තේ නිෂ්පාදනය

| උන්නතාංශය | ප්‍රමාණය (කිලෝග්‍රෑම්) |
|---|---|
| උඩරට | 55,721,413 |
| මැදරට | 47,621,684 |
| පහතරට | 158,816,178 |
| **එකතුව** | **262,159,275** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ප්‍රස්ථාරය 3.2.1: උන්නතාංශය අනුව සමස්ත තේ නිෂ්පාදනය




## 3.2.1. මාසික තේ නිෂ්පාදනය

පසුගිය වසර මුලුල්ලේම සැලකිල්ලට ගත්විට, ජාතික තේ නිෂ්පාදනයට ප්‍රධාන දායකත්වය පහතරට තේ වලින් ලබාදුනි. 2024 වර්ෂයේ දී වැඩිම මාසික තේ නිෂ්පාදනය මැයි මාසයේ දී කිලෝ ග්‍රෑම් මිලියන 24 ලෙස වාර්තා වු අතර, අඩුම තේ නිෂ්පාදනය ලෙස කිලෝ ග්‍රෑම් මිලියන 18 ක් ජනවාරි මාසයේ වාර්තා විය.

ප්‍රස්තාරය 3.2.2: උන්නතාංශය අනුව මාසික තේ නිෂ්පාදනය




## 3.2.2. කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය

කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව කිලෝ ග්‍රෑම් මිලියන 40 ක ඉහළ ම නිෂ්පාදනයක් රත්නපුරයෙන් වාර්තා වු අතර, දෙවන ඉහළම නිෂ්පාදනය වු කිලෝ ග්‍රෑම් මිලියන 37.7 ක් ගාල්ලෙන් වාර්තා විය.

සමාලෝචිත වර්ෂය තුළ පහතරට කෘෂිදේශගුණික දිස්ත්‍රක්කය තුල කිලෝ ග්‍රෑම් මිලියන 148.3 ක් නිෂ්පාදනය කර ඇති අතර එය 2023 වර්ෂයේ දී නිෂ්පාදනය කරන ලද ප්‍රමාණයට වඩා කිලෝ ග්‍රෑම් මිලියන 5.3 ක් (3.7%) වැඩිය.

වගුව 3.2.2: කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

| කෘෂි දේශගුණික දිස්ත්‍රික්කය | 2024 සහ 2023 | | | |
|---|---|---|---|---|
| | 2024 (කි.ග්‍රෑ.) | 2023 (කි.ග්‍රෑ.) | වෙනස (කි.ග්‍රෑ.) | % |
| **නුවරඑළිය** | **3,040,493** | **3,269,242** | **(228,749)** | **(7.00)** |
| **බටහිර** | | | | |
| රම්බොඩ | 1,765,961 | 1,930,540 | (164,580) | (8.53) |
| පුඩලු ඔය | 4,522,591 | 4,288,813 | 233,778 | 5.45 |
| ආගරපතන | 4,484,678 | 4,777,802 | (293,124) | (6.14) |
| නානුඔය/ ලිඳුල/ තලවකැලෙ | 6,938,484 | 7,834,229 | (895,745) | (11.43) |
| පතන / කොටගල | 3,081,257 | 3,240,289 | (159,033) | (4.91) |
| හැටන් / දික්ඔය | 6,479,885 | 6,633,112 | (153,227) | (2.31) |
| බොගවන්තලාව | 5,274,776 | 5,140,111 | 134,665 | 2.62 |
| අප්කොට් / මස්කෙළිය | 5,564,102 | 5,095,745 | 468,357 | 9.19 |
| **එකතුව - බටහිර** | **38,111,734** | **38,940,641** | **(828,909)** | **(2.13)** |
| **මධ්‍යම** | | | | |
| වටවල/ ගිනිගත්හේන/ නෝටන් පාලම | 312,493 | 1,186,120 | (873,627) | (73.65) |
| පුස්සැල්ලාව/ හේවාහැට | 4,631,399 | 4,818,780 | (187,381) | (3.89) |
| කොත්මලේ | 2,245,294 | 692,560 | 1,552,734 | 224.20 |
| ගම්පොළ/ නාවලපිටිය/ දොළොස්බාගේ | 17,646,480 | 17,147,414 | 499,066 | 2.91 |
| නිලඹෙ/ හන්තාන/ ගලහ | 1,983,125 | 1,564,196 | 418,929 | 26.78 |
| කඩුගන්නාව | 3,261,348 | 4,513,099 | (1,251,751) | (27.74) |
| මඩුල්කැලේ / නකල්ස් / රන්ගල | 2,234,136 | 2,895,633 | (661,497) | (22.84) |
| හුන්නස්ගිරිය / මාතලේ / යක්දෙස්ස | 1,270,863 | 1,061,677 | 209,186 | 19.70 |
| බලංගොඩ / රක්වාන | 7,399,452 | 6,611,832 | 787,620 | 11.91 |
| **එකතුව - මධ්‍යම** | **40,984,590** | **40,491,311** | **493,279** | **1.22** |
| **උඩපුස්සැල්ලාව** | | | | |
| උඩපුස්සැල්ලාව/ හල්ග්‍රාන්ඔය | 3,344,888 | 3,715,557 | (370,669) | (9.98) |
| මතුරට | 2,057,181 | 1,837, 490 | 219,691 | 11.96 |
| **එකතුව - උඩපුස්සැල්ලාව** | **5,402,069** | **5,553, 047** | **(150,978)** | **(2.72)** |
| **ඌව** | | | | |
| කොස්ලන්ද/ හල්දුමුල්ල | 773,649 | 698,485 | 75,164 | 10.76 |
| හපුතලේ | 3,520,313 | 3,628,187 | (107,874) | (2.97) |
| බණ්ඩාරවෙල/ පූනාගල | 3,200,315 | 2,650,201 | 550,114 | 20.76 |
| මල්වත්ත/ වැලිමඩ | 2,768,767 | 2,443,630 | 325,137 | 13.31 |
| දෙමෝදර/ හාලිඇල/ බදුල්ල | 9,419,421 | 8,555,920 | 863,501 | 10.09 |
| ඇල්ල/නමුණුකුළ | 921,723 | 1,229,201 | (307,479) | (25.01) |
| පස්සර/ ලුණුගල | 3,346,667 | 3,287,497 | 59,170 | 1.80 |
| මඩුල්සීම | 2,380,778 | 2,376,987 | 3,791 | 0.16 |
| **එකතුව - ඌව** | **26,331,633** | **24,870,108** | **1,461,524** | **5.88** |
| **පහත රට** | | | | |
| දෙණියාය | 12,129,912 | 11,167,936 | 961,976 | 8.61 |
| ගාල්ල | 37,736,286 | 38,723,674 | (987,388) | (2.55) |
| කළුතර | 16,621,092 | 16,566,484 | 54,608 | 0.33 |
| කෑගල්ල | 5,840,090 | 5,494,282 | 345,808 | 6.29 |
| කැළණි මිටියාවත | 6,744,987 | 6,881,943 | (136,956) | (1.99) |
| මහනුවර/ මාතලේ/ කුරුණෑගල | 4,909,469 | 2,608,096 | 2,301,373 | 88.24 |
| මාතර | 11,397,360 | 12,037,196 | (639,836) | (5.32) |
| මොරවක | 5,142,127 | 5,763,878 | (621,751) | (10.79) |
| රත්නපුර | 44,054,753 | 40,078,843 | 3,975,910 | 9.92 |
| බලන්ගොඩ | 3,712,681 | 3,641,972 | 70,709 | 1.94 |
| **පහතරට එකතුව** | **148,288,757** | **142,964,304** | **5,324,453** | **3.72** |
| **එකතුව** | **262,159,276** | **256,088,653** | **6,070,623** | **2.37** |

*සංශෝධනයට යටත්ව, මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 3.2.3. දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය.

සමාලෝචිත වසර තුළ දී උඩරට ඉහළම තේ නිෂ්පාදනය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර, බදුල්ල දිස්ත්‍රික්කයෙන් දෙවන ඉහළම නිෂ්පාදන වාර්තා විය. ඉහළ ම පහත රට තේ නිෂ්පාදනය රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර,ගාල්ල දිස්ත්‍රික්කයෙන් දෙවනුව ඉහළ නිෂ්පාදනය වාර්තා විය. මෙම දිස්ත්‍රික්ක දෙක ම ජාතික තේ නිෂ්පාදනයට පිළිවෙලින් 21% කින් සහ 14% කින් දායක විය. උන්නතාංශ තුන ම සලකා බලන විට , ඉහළ ම නිෂ්පාදනය රතන්පුර දිස්ත්‍රික්කයෙන් ද, පහළ ම නිෂ්පාදනය මොණරාගල දිස්ත්‍රික්කයෙන් ද වාර්තා විය.

වගුව 3.2.3: දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ)

| දිස්ත්‍රික්කය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 12,884,346 | 14,112,789 | - | 26,997,135 |
| කොළඹ | - | - | 1,334,650 | 1,334,650 |
| ගාල්ල | - | - | 37,230,683 | 37,230,683 |
| හම්බන්තොට | - | - | 179,576 | 179,576 |
| කළුතර | - | - | 15,765,199 | 15,765,199 |
| මහනුවර | - | 22,287,534 | 8,135,180 | 30,422,714 |
| කෑගල්ල | - | 167,370 | 10,859,164 | 11,026,534 |
| මාතලේ | - | 687,880 | 389,044 | 1,076,924 |
| මාතර | - | - | 29,213,758 | 29,213,758 |
| මොණරාගල | - | 188 | - | 188 |
| නුවරඑළිය | 42,837,068 | 8,632,288 | 1,674,185 | 53,143,541 |
| රත්නපුර | - | 1,733,634 | 54,034,739 | 55,768,373 |
| එකතුව | **55,721,414** | **47,621,683** | **158,816,178** | **262,159,275** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 3.2.4. අමු තේ දළු රැස් කිරීමේ ක්‍රමවේදය අනුව නිෂ්පාදනය විශ්ලේෂණය කිරීම

තේ කර්මාන්තශාලා තම තේ දළු අවශ්‍යතාවය ඔවුන්ගේ ම වතුවලින් මෙන් ම, මිල දී ගත් තේ දළුවලින් ද සපුරා ගනු ලැබේ. සාදන ලද තේ ප්‍රමාණය 4.65 න් ගුණ කරමින් රැස් කර ගන්නා ලද තේ දළු ප්‍රමාණය ගණනය කරන අතර, එය තේ කර්මාන්තයේ පිළිගත් සූත්‍රයක් ලෙස භාවිත කෙරේ.

වගුව 3.2.4: දිස්ත්‍රික්ක අනුව අමු තේ දළු නිෂ්පාදනය (කි.ග්‍රෑ)

| පරිපාලන දිස්ත්‍රික්කය | තමන්ගේ වත්තේ දළු | මිල දී ගත් දළු | මුළු වාර්ෂික අමු දළු නිෂ්පාදනය |
|---|---|---|---|
| බදුල්ල | 72,144,302 | 53,392,374 | 125,536,677 |
| කොළඹ | - | 6,206,123 | 6,206,123 |
| ගාල්ල | 2,564,609 | 170,558,068 | 173,122,676 |
| හම්බන්තොට | - | 835,028 | 835,028 |
| කළුතර | 1,179,659 | 72,128,517 | 73,308,176 |
| මහනුවර | 25,007,153 | 116,458,467 | 141,465,620 |
| කෑගල්ල | 3,933,821 | 47,339,560 | 51,273,381 |
| මාතලේ | 689,134 | 4,318,562 | 5,007,696 |
| මාතර | 6,707,324 | 129,136,653 | 135,843,977 |
| මොණරාගල | 358 | 516 | 874 |
| නුවරඑළිය | 190,175,339 | 56,942,127 | 247,117,466 |
| රත්නපුර | 20,346,280 | 238,976,656 | 259,322,936 |
| එකතුව | **322,747,979** | **896,292,651** | **1,219,040,630** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 3.2.5. සැකසුම් ක්‍රමවේද අනුව නිෂ්පාදන විශ්ලේෂණය කිරීම

### 3.2.5.1. කළු තේ සහ හරිත තේ නිෂ්පාදනය

2024 වසර තුළ දී සම්ප්‍රදායික තේ නිෂ්පාදනය 2% කින් ද සී.ටී.සී. තේ නිෂ්පාදනය 5% කින් ද ඉහළ නැගීමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වසර තුළ දී සමස්ත කළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 6,071 කින් (2.4%) ඉහළ ගොස් ඇත. පෙර වර්ෂයේ ක්ෂණික තේ හා ජෛව තේ නිෂ්පාදනය හා සැසඳීමේ දී 1% ක පහළ බැසීමක් පෙන්නුම් කරයි.

## 3.2.6. නිෂ්පාදිත තේ නිෂ්පාදන පිරිවැය.

ඵලදායිතාව සහ නිෂ්පාදන වියදම එකිනෙකට සම්බන්ධ වන අතර, නිෂ්පාදන පිරිවැය ඉහළ යාම වැවිලි අංශය තුළ බොහෝ විට දැකිය හැකි කණගාටුදායක කරුණක් බවට පත්ව ඇත. තේ නිෂ්පාදනයේ දී ශ්‍රමය විශාල වශයෙන් අවශ්‍ය වන හෙයින් ශ්‍රම ඵලදායිතාව හා නිෂ්පාදන වියදම අතර දැඩි සම්බන්ධතාවයක් පවතී. තේ නිපදවන ප්‍රධාන පෙලේ රටවල් අතර ශ්‍රී ලංකාව තුළ ඉහළ නිෂ්පාදන වියදමක් දැකිය හැක. ගෝලීය සන්දර්භය තුළ රටෙහි පවතින තරගකාරිත්වය සඳහා මෙම තත්ත්වය බලපා ඇත.

නිමි තේ කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන වියදම පසුගිය දශකය තුළ සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබේ. ශ්‍රම පිරිවැය සහ යෙදවුම් මිල ඉහළ යාම විශේෂයෙන් නිෂ්පාදන වියදම සඳහා බලපා තිබුණි. 2022/2023 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා දත්ත අනුව සංශෝධනයට යටත්ව තේ කිලෝ ග්‍රෑමයක් සඳහා වාර්ෂික නිෂ්පාදන පිරිවැය රුපියල් 885.00 වූ අතර එය 2021/2022 හා සැසඳීමේදී 38% ක වර්ධනයකි.

ප්‍රස්තාරය 3.2.3: නිමි තේ කිලෝවක සමස්ත පිරිවැය




* වෙනස් විය හැකි ය / මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

# 3.3. තේ අලෙවිය

තේ වෙන්දේසිවල දී වාර්තා වූ ශුද්ධ විකුණුම් සාමාන්‍ය අගයන් සමග සසඳන විට, 2024 වසරේ මේ දක්වා වාර්ෂික සාමාන්‍ය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,225.17 ක් (අවමය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,137 ක්, උපරිමය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,307.37) වූ අතර එය පෙර වසරේ සාමාන්‍ය අගය වූ රුපියල් 1,159.26 ක අගය හා සැසඳීමේ දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 66 ක ඉහළ යාමකි.

ඉහළ ම විකුණුම් සාමාන්‍යය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,304 ක් වශයෙන් වාර්තා වුයේ පහත රට තේ විකුණුම් මගිනි. 2024 වර්ෂයේ දී වාර්ෂික විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 261ක් වූ අතර, 2023 වසරේ දී එය තේ කිලෝග්‍රෑම් මිලියන 255 ක් වූ අතර පොදු, පෞද්ගලික සහ සෘජු විකුණුම් ඇතුළු ව, සමාලෝචිත වර්ෂය සඳහා කිලෝ ග්‍රෑම් මිලියන 5.8 ක වර්ධනයක් (2.2%) වාර්තා කරන ලදී.

2024 පෙබරවාරි මාසය තුළ මේ දක්වා ඉහළ ම විකුණුම් සාමාන්‍යය කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,307 ක් වූ අතර, 2024 ජනවාරි මාසයේ දී ඉහළ ම විකුණුම් ප්‍රමාණය වශයෙන් කිලෝ ග්‍රෑම් මිලියන 26 ක් වාර්තා විය. සමාලෝචිත වසරේ අනෙකුත් සෑම මසක ම විකුණුම් සාමාන්‍යය රුපියල් 1100 ක් වශයෙන් වාර්තා විය.

## 3.3.1. අලෙවි ක්‍රම

කර්මාන්තශාලාවල නිපදවන තේ අලෙවි කරන ප්‍රධාන ක්‍රමවේදය වන්නේ ප්‍රසිද්ධ වෙන්දේසිය යි. 2024 වසරේ දි කිලෝ ග්‍රෑම් මිලියන 249.5 ක තේ ප්‍රමාණයක් කොළඹ තේ වෙන්දේසියේ දී අලෙවි කරන ලදී. පෞද්ගලික විකුණුම් ප්‍රමාණය, කිලෝ ග්‍රෑම් මිලියන 10.6 ක් වූ අතර ඉතිරි කිලෝ ග්‍රෑම් මිලියන 0.5 ක ප්‍රමාණය සෘජු විකුණුම් හරහා අලෙවි කරන ලදී.

## 3.3.2. කොළඹ තේ වෙන්දේසිය

කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය යටතේ ලංකා වානිජ මණ්ඩලය මගින් පවත් වන කොළඹ තේ වෙන්දේසිය 2024 වසර තුළ දී වෙන්දේසි 51 ක් පවත් වන ලදී. ප්‍රසිද්ධ වෙන්දේසියේ දී කිලෝ ග්‍රෑම් මිලියන 4.5 ක (1.8%) ක වැඩි වීමක් වාර්තා වූ අතර, එම වසර තුළ දී සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 1,231.73 ක් ලෙස කොළඹ තේ වෙන්දේසිය තුළ වාර්තා විය. එය පසුගිය වසර හා සැසඳීමේ දී 6% ක මිල ඉහළ යාමකි.

## 3.3.3. භූමි උන්නතාංශය අනුව අලෙවිය

උන්නතාංශ තුනම අතුරින්, 2023 වසරට සාපේක්ෂව උඩරට ප්‍රදේශවල වගා කළ තේ විකුණුම් පරිමාව 2% ක අඩුවීමක් වාර්තා වූ අතර මැදරට සහ පහතරට උන්නතාංශ යන ප්‍රදේශ දෙකෙහි ම පිළිවෙලින් 7% ක සහ 2% ක ආන්තික වර්ධනයක් වාර්තා විය. පසු ගිය වසර හා සසඳන විට සියලු ම විකුණුම් පරිමාවන් 2% ක ආන්තික වැඩිවීමක් පෙන්නුම් කළ අතර, සංයුක්ත ජාතික සාමාන්‍යය 6% කින් වර්ධනය විය. 2023 වසරට සාපේක්ෂව උන්නතාංශ තුනෙහි ම සාමාන්‍ය මිලෙ හි ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී.

වගුව 3.3.1: භූමි උන්නතාංශය අනුව තේ අලෙවිය

| උන්නතාංශය | 2024 | 2023 | වෙනස | % | 2024 | 2023 | වෙනස | % |
|---|---|---|---|---|---|---|---|---|
| | අලෙවි ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | | | | දළ ඒකක මිල (රු / කිලෝ ග්‍රෑම්) | | | |
| උඩරට | 56.47 | 57.54 | (1.07) | (2.00) | 1,141.63 | 1,058 .29 | 83.34 | 7.87 |
| මැදරට | 47.64 | 44.37 | 3.27 | 7.00 | 1,064.48 | 998.56 | 65.92 | 6.60 |
| පහතරට | 156.53 | 152.94 | 3.59 | 2.00 | 1,304.38 | 1,243.92 | 60.46 | 4.86 |
| මුළු විකුණුම් | 260.70 | 254.87 | 5.82 | 2.00 | 1,225.16 | 1,159.26 | 65.91 | 5.69 |

මූලාශ්‍රය: අලෙවි වාර්තා- භූමි උන්නතාංශය අනුව සියලු විකුණුම් - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# 3.4. තේ අපනයනය

සමාලොචිත වර්ෂය සඳහා කිලෝ ග්‍රෑම් මිලියන 246 ක් වූ සමස්ත තේ අපනයනය (ප්‍රති අපනයනය ඇතුළුව) 2023 වර්ෂයේ වාර්තා වූ කිලෝ ග්‍රෑම් මිලියන 242 ට සාපේක්ෂව කිලෝ ග්‍රෑම් මිලියන 4 ක ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. 2024 වර්ෂයේ වාර්තා වූ අපනයන ඉපැයීම් වූ රුපියල් බිලියන 433 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රුපියල් බිලියන 5 ක වර්ධනයක් සහිත ව රුපියල් බිලියන 428 ක් උපයා ගන්නා ලදී. 2024 වසර තුළ දී, සාමාන්‍ය වාර්ෂික FOB ඒකක මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 1764 ක් වූ අතර සාපේක්ෂව එය පසුගිය වසරේ කිලෝ ග්‍රෑමයකට රුපියල් 1, 770 ක් ලෙස වාර්තා විය. එනම් රුපියල් 6 ක අඩු වීමකි.

## 3.4.1. වර්ග අනුව තේ අපනයන විශ්ලේෂණය

සාමාන්‍යයෙන් සලකා බැලීමේ දී, තේ දළුවල සම්භවය හා ගුණාත්මකභාවය මත පදනම් ව තේ සඳහා ඇති රුචිකත්වය සැලකිය යුතු අන්දමෙන් වෙනස් වේ. මැද පෙරදිග සහ පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් ස්වාධීන රටවල් තුළ මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ නිපදවන තද රසයක් සහිත පහත රට හා සාම්ප්‍රදායික තේ සඳහා ඉල්ලුමක් පවතී.

2024 වසරේ දී, ප්‍රතිඅපනයනයන් ද සහිතව, සමස්ත කළු තේ සහ හරිත තේ අපනයනය ප්‍රමාණාත්මකව පිළිවෙලින් 2% කින් හා 4% කින් ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. වාර්ෂික ක්ෂණික තේ නිෂ්පාදන ප්‍රමාණය 2023 වර්ෂයට සාපේක්ෂව 6% ක පහත බැසීමක් පෙන්නුම් කළේ ය. කෙසේ නමුත්, සිලෝන් තේ අපනයන මගින් රුපියල් ඉපැයීම 2023 වර්ෂයේ දී රුපියල් බිලියන 428 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ එය රුපියල් බිලියන 433 ක් විය. සාමාන්‍යයෙන් සමස්ත තේ අපනයන ප්‍රමාණයෙන් කළු තේ අපනයන ප්‍රතිශතය ආසන්න වශයෙන් සෑම වසරක ම 97% ක් වන අතර හරිත තේ ප්‍රතිශතය 2% ක් පමණ හා ක්ෂණික තේ අපනයනය 1% ක් වශයෙන් පවතී.

ප්‍රති අපනයනයන් ද සහිතව කිලෝ ග්‍රෑම් මිලියන 4 ක ප්‍රමාණාත්මක වෙනසක් සහිතව සමස්ත තේ අපනයනය 2% ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. අපනයන සහ ප්‍රති අපනයන වෙන් වෙන් වශයෙන් ප්‍රමාණයෙන් පිළිවෙලින් 0.4% ක හා 47% ක ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. තවද, අපනයන රුපියල් ඉපයීම් 1% කින් පහත බසින ලද අතර, ප්‍රතිඅපනයන අගය 37% කින් වර්ධනය විය. කෙසේ වෙතත්, 2024 වසරේ දී සමුච්චිත අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 1,435.8 ක් වූ අතර, 2023 වසරේ දී එය ඇමරිකානු ඩොලර් මිලියන 1,309.8 ක් විය. එනම්, 10% ක වර්ධනය කි.

ප්‍රස්තාරය 3.4.1: මාසික තේ අපනයන 2024 - ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) හා ඒකක වටිනාකම (රුපියල්/ කිලෝග්‍රෑම්)




මූලාශ්‍රය: රේගු දත්ත

## 3.4.2. වාර්ෂික තේ අපනයනය -2024

වර්ගය අනුව සමාලෝචිත වර්ෂයේ තේ අපනයනය ප්‍රමාණය, අගය හා FOB මිල අනුව විස්තරාත්මකව පහතින් දක්වා ඇත.

වගුව 3.4.1: වාර්ෂික තේ අපනයනය – 2024

| වර්ගය | ප්‍රමාණය (කි.ග්‍රෑම්) | වටිනාකම (රු.) | වටිනාකම (ඇ.ඩො) | FOB රු/ කි.ග්‍රෑම් | FOB ඇ.ඩො/ කි.ග්‍රෑම් |
|---|---|---|---|---|---|
| අපනයනය | | | | | |
| කළු තේ | | | | | |
| මළු | 19,065,972 | 56,673,515,346 | 187,850,164 | 2,972.50 | 9.85 |
| ඇසුරුම් (ග්‍රෑම් 4 - කි.ග්‍රෑම් 1) | 71,275,095 | 123,618,239,908 | 410,032,445 | 1,734.38 | 5.75 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 1 -කි.ග්‍රෑම් 3) | 2,218,335 | 4,070,528,779 | 13,500,496 | 1,834.95 | 6.09 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 3 -කි.ග්‍රෑම් 5) | 8,516,676 | 14,305,437,811 | 47,375,020 | 1,679.70 | 5.56 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 5 - කි.ග්‍රෑම් 10) | 17,735,957 | 23,867,986,294 | 78,726,556 | 1,345.74 | 4.44 |
| තොග | 108,660,243 | 164,545,011,922 | 544,431,521 | 1,514.31 | 5.01 |
| **සමස්ථ කළු තේ** | **227,472,278** | **387,080,720,060** | **1,281,916,202** | **1,701.66** | **5.64** |
| හරිත තේ | | | | | |
| මළු | 849,615 | 4,553,038,719 | 15,086,025 | 5,358.94 | 17.76 |
| ඇසුරුම් (ග්‍රෑම් 4 - කි.ග්‍රෑම් 1) | 751,195 | 2,308,813,705 | 7,650,716 | 3,073.52 | 10.18 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 1 - කි.ග්‍රෑම් 3) | 7,250 | 19,486,147 | 64,383 | 2,687.85 | 8.88 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 3 - කි.ග්‍රෑම් 5) | 3,976 | 15,139,187 | 50,153 | 3,807.85 | 12.61 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 5 - කි.ග්‍රෑම් 10) | 13,910 | 44,784,831 | 148,924 | 3,219.61 | 10.71 |
| තොග | 412,514 | 684,711,805 | 2,265,162 | 1,659.85 | 5.49 |
| **සමස්ථ හරිත තේ** | **2,038,460** | **7,625,974,394** | **25,265,363** | **3,741.05** | **12.39** |
| ක්ෂණික තේ | | | | | |
| මළු | 675 | 5,022,363 | 16,834 | 7,440.54 | 24.94 |
| ඇසුරුම් (ග්‍රෑම් 4 - කි.ග්‍රෑම් 1) | 75 | 564,215 | 1,874 | 7,522.87 | 24.98 |
| ඇසුරුම් ( කි.ග්‍රෑම්>3) | 910,219 | 2,623,076,519 | 8,533,816 | 2,881.81 | 9.38 |
| **සමස්ථ ක්ෂණික තේ** | **910,969** | **2,628,663,097** | **8,552,524** | **2,885.57** | **9.39** |
| **සමස්ත අපනයන** | **230,421,707** | **397,335,357,551** | **1,315,734,089** | **1,724.38** | **5.71** |
| ප්‍රති අපනයන | | | | | |
| කළු තේ | | | | | |
| මළු | 6,518,452 | 13,730,787,686 | 45,545,579 | 2,106.45 | 6.99 |
| ඇසුරුම් (ග්‍රෑම් 4 - කි.ග්‍රෑම් 1) | 1,936,759 | 3,066,231,919 | 10,252,810 | 1,583.18 | 5.29 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 1 -කි.ග්‍රෑම් 3) | 55,028 | 84,965,431 | 280,772 | 1,544.05 | 5.10 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 3 -කි.ග්‍රෑම් 5) | 494 | 4,467,406 | 15,134 | 9,036.02 | 30.61 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 5 -කි.ග්‍රෑම් 10) | 79,810 | 132,347,489 | 441,782 | 1,658.28 | 5.54 |
| තොග | 2,414,351 | 2,907,248,230 | 9,706,801 | 1,204.15 | 4.02 |
| **සමස්ථ කළු තේ** | **11,004,894** | **19,926,048,161** | **66,242,878** | **1,810.65** | **6.02** |
| හරිත තේ | | | | | |
| මළු | 1,372,134 | 8,037,325,621 | 26,660,261 | 5,857.54 | 19.43 |
| ඇසුරුම් (ග්‍රෑම් 4 -කි.ග්‍රෑම් 1) | 680,906 | 1,614,209,009 | 5,367,879 | 2,370.68 | 7.88 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 1 -කි.ග්‍රෑම් 3) | 20,326 | 23,199,083 | 78,461 | 1,141.36 | 3.86 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 3 - කි.ග්‍රෑම් 5) | 255,574 | 559,966,871 | 1,858,775 | 2,191.01 | 7.27 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 5 - කි.ග්‍රෑම් 10) | 50,630 | 90,596,690 | 303,626 | 1,789.38 | 6.00 |
| තොග | 269,110 | 322,184,647 | 1,063,007 | 1,197.23 | 3.95 |
| **සමස්ථ හරිත තේ** | **2,648,680** | **10,647,481,921** | **35,332,009** | **4,019.92** | **13.34** |
| ක්ෂණික තේ | | | | | |
| ඇසුරුම් (ග්‍රෑම් 4- කි.ග්‍රෑම් 1) | 636 | 1,604,076 | 5,322 | 2,522.13 | 8.37 |
| ඇසුරුම් (කි.ග්‍රෑම් 1 - කි.ග්‍රෑම් 3) | 1,110 | 3,302,125 | 11,243 | 2,974.89 | 10.13 |
| ඇසුරුම් (කි.ග්‍රෑම්>3) | 1,710,850 | 5,559,554,242 | 18,538,425 | 3,249.59 | 10.84 |
| **සමස්ථ ක්ෂණික තේ** | **1,712,596** | **5,564,460,443** | **18,554,990** | **3,249.14** | **10.83** |
| **ප්‍රති අපනයන එකතුව** | **15,366,170** | **36,137,990,525** | **120,129,877** | **2,351.79** | **7.82** |
| **මුළු එකතුව** | **245,787,877** | **433,473,348,076** | **1,435,863,966** | **1,763.61** | **5.84** |

මූලාශ්‍රය: රේගු දත්ත

## 3.4.3. අගය එකතු කළ තේ අපනයන

තේ සඳහා ගෝලීය වශයෙන් පවතින රුචිකත්වය අගය එකතු කළ තේ කෙරෙහි සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. කිලෝ ග්‍රෑම් 3 ට අඩු තේ පැකට්, තේ බෑග් හා ක්ෂණික තේ අපනයන, අගය එකතු කළ තේ වශයෙන් සළකනු ලැබේ. 2024 වසරේ අගය එකතු කළ තේ අපනයනය සමස්ත තේ අපනයනයෙන් 44% ක් වූ අතර එමගින් උපයා ගත් ආදායම රුපියල් බිලියන 226 ක් වූ අතර එය සමස්ත අපනයන ආදායමෙන් 52% ක් විය.

වගුව 3.4.2: අගය එකතු කළ තේ වාර්ෂික අපනයනය – 2024

| අපනයන වර්ගය | | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම (රු.) | FOB (රු/ කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|
| අපනයනය | කළු | 92,559,402 | 184,362,284,033 | 1,991.83 |
| | හරිත | 1,608,060 | 6,881,338,571 | 4,279.28 |
| | ක්ෂණික | 910,969 | 2,628,663,097 | 2,885.57 |
| | **උප එකතුව** | **95,078,431** | **193,872,285,701** | **2,039.08** |
| ප්‍රති අපනයනය | කළු | 8,510,238 | 16,881,985,036 | 1,983.73 |
| | හරිත | 2,073,366 | 9,674,733,713 | 4,666.20 |
| | ක්ෂණික | 1,712,596 | 5,564,460,443 | 3,249.14 |
| | **උප එකතුව** | **12,296,200** | **32,121,179,192** | **2,612.28** |
| **එකතුව** | | **107,374,631** | **225,993,464,893** | **2,104.72** |

අගය එකතු කළ තේ සඳහා FOB මිල, තොග තේ මිලට වඩා වැඩි ය. එබැවින් තොග තේ වලට වඩා අගය එකතු කළ තේ අපනයනය සම්බන්ධයෙන් කරනු ලබන ප්‍රවර්ධන කටයුතුවලින් අපනයන ආදායමට වැඩි දායකත්වයක් ලබා දේ.

ප්‍රස්ථාරය 3.4.2: අගය එකතු කළ තේ අපනයන හා තේ තොග අපනයන සඳහා FOB මිල (2015-2024)




මූලාශ්‍රය: රේගු දත්ත

### 3.4.4. ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල්

2024 වසරේ දී ශ්‍රී ලංකාවේ තේ අපනයනය 2% කින් (කිලෝ ග්‍රෑම් මිලියන 5) වර්ධනය විය. එනම්, 2023 වසරේ කිලෝ ග්‍රෑම් මිලියන 241 ක් වූ තේ අපනයනය 2024 වර්ෂයේ කිලෝ ග්‍රෑම් මිලියන 246 ක් විය. 2024 වර්ෂයේ දී ලොව පුරා රටවල් 147 කට තේ අපනයනය කරන ලදී. එක් එක් රටවලට අපනයනය කරනු ලබන ප්‍රමාණය මත පදනම් ව ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් 10 පහත වගුවෙන් දක්වා ඇත.

වගුව 3.4.3: ශ්‍රී ලංකාව තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් 2024

| රට | 2024 | | | | 2023 | | | | ප්‍රමාණයේ වර්ධනය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රේණිය | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | FOB රු/කි.ග්‍රෑම් | අපනයන කොටස (%) | ශ්‍රේණිය | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | FOB රු/කි.ග්‍රෑම් | අපනයන කොටස (%) | |
| ඉරාකය | 1 | 34,260,353 | 1,332.98 | 13.94 | 1 | 32,751,246 | 1,203.06 | 13.54 | 4.6 |
| රුසියාව | 2 | 24,987,458 | 1,679.73 | 10.17 | 3 | 22,617,599 | 1,754.35 | 9.35 | 10.5 |
| එ.අ.එ.රාජ්‍ය | 3 | 21,132,763 | 1,756.73 | 8.60 | 4 | 18,460,239 | 1,715.30 | 7.63 | 14.5 |
| තුර්කිය | 4 | 17,734,353 | 1,619.27 | 7.22 | 2 | 30,411,858 | 1,676.23 | 12.57 | (41.7) |
| චීනය | 5 | 11,564,609 | 1,444.30 | 4.71 | 5 | 12,319,524 | 1,471.02 | 5.09 | (6.1) |
| අසර්බයි | 6 | 10,435,696 | 1,749.20 | 4.25 | 7 | 9,176,629 | 1,700.75 | 3.79 | 13.7 |
| ඉරානය | 7 | 10,432,333 | 1,821.37 | 4.24 | 11 | 6,501,833 | 1,878.31 | 2.69 | 60.5 |
| ලිබියාව | 8 | 10,291,914 | 1,197.62 | 4.19 | 6 | 11,127,949 | 1,226.41 | 4.60 | (7.5) |
| සෞදි අරාබිය | 9 | 9,138,453 | 2,364.78 | 3.72 | 10 | 7,012,587 | 2,476.85 | 2.90 | 30.3 |
| චිලි | 10 | 8,638,014 | 1,328.02 | 3.51 | 8 | 7,887,268 | 1,323.77 | 3.26 | 9.5 |
| **ප්‍රධාන රටවල් 10 හි එකතුව** | | **158,615,946** | **1,594.09** | **64.53** | | **158,266,732** | **1,574.07** | **65.42** | **0.2** |
| **මුළු එකතුව** | | **245,787,876** | **1,763.61** | **100.00** | | **241,912,705** | **1,770.44** | **100.00** | **1.6** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ කිලෝ ග්‍රෑම් මිලියන 34 ක් අපනයනය කරමින් ඉරාකය ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන ම රට බවට පත් වූ අතර තේ කිලෝ ග්‍රෑම් මිලියන 20 කට අධික ප්‍රමාණයක් අපනයනය කරමින් රුසියාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය දෙවන හා තෙවන ප්‍රධාන රටවල් බවට පත් විය. ශ්‍රී ලංකාව තේ අපනයනය කරනු ලබන අනෙකුත් ප්‍රධාන රටවල් 10 තුළ වූ සෑම රටක් ම අපනයනය කරනු ලැබුවේ කිලෝ ග්‍රෑම් මිලියන 20 කට අඩු ප්‍රමාණය කි. 2024 වර්ෂයේ දී ඉරාකය, රුසියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය 2023 වසරට සාපේක්ෂව තම තේ අපනයන ප්‍රමාණයන් ඉහළ නංවා ගන්නා ලදී. රුසියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවල් දෙක ම පිළිවෙලින් 11% ක් හා 15% ක් වශයෙන් තම වෙළඳපොළ කොටස සැලකිය යුතු අන්දමින් වර්ධනය කර ගත් අතර ඉරාකය 5% ක වර්ධනයක් වාර්තා කළේ ය .

පළමු ව ගත් භාණ්ඩය පළමු ව නිකුත් කිරීමේ පදනම යටතේ කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරීත්වයක් සහිත අයිතම සඳහා නියමිත ගැළපීම් කිරීමෙන් පසු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ තොග හඳුනා ගනී.

### 3.11. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වනුයේ අතැති සහ බැංකුවේ ඇති මුදල් මෙන් ම අනෙකුත් කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජනවලිනි.

## 4). ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා පිරිවැය ක්‍රමවේදයේ ක්‍රියාකාරීත්වය මණ්ඩලයේ කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණ ලෙස නියෝජනය වන පරිදි යොදා ගනු ලැබේ.

**රජයේ ප්‍රදාන**

**පුනරාවර්තන වැය ශීර්ෂය යටතේ පවත්නා රජයේ ප්‍රධාන සේවකයන්ගේ වැටුප් ගෙවීම සඳහා භාවිත කෙරේ.**

### 4.1. ආදායම් හඳුනා ගැනීම

ගෙවීම් සිදු කරන කාලය නොසලකා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන ප්‍රමාණයට සහ ආදායම විශ්වසනීය ලෙස ගණනය කළ හැකි ප්‍රමාණයට ආදායම හඳුනා ගනී. ගිවිසුම් ගත නිශ්චිත ගෙවීම් පිළිබඳ නියමයන් සැලකිල්ලට ගෙන ලැබුණු හෝ ලැබිය යුතු මුදල්වල සාධාරණ අගයට ආදායම ගණනය කරනු ලැබේ.

ආදායම් හඳුනා ගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත නිර්ණායක ද සපුරාලිය යුතුය.

**භාණ්ඩ විකිණීම**

කාර්ය සාධන බැඳීම් සම්පූර්ණ වීම මත අදායම හඳුනා ගනී. සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදා හැරීමේ දී, භාණ්ඩයේ හිමිකාරත්වය පාරිභෝගිකයාට පැවරෙන අවස්ථාවේදී ම ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එකී අදායම අපේක්ෂා කරනු ලබයි.

**සේවා සැපයීම**

සේවය සපයන හෝ ඉටු කරනු ලැබූ කාලපරිච්ඡේදයේ දී සේවා සැපයීමෙන් ලබන ආදායම හඳුනා ගනු ලැබේ. අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

**පොළී ආදායම්**
ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන සියලු ම මූල්‍ය උපකරණ සහ විකිණීම සඳහා තබා ඇති ලෙසට වර්ගීකරණය කළ පොළී දරණ මූල්‍ය වත්කම් සඳහා පොළී ආදායම හෝ වියදම මූල්‍ය වත්කමේ අපේක්ෂිත ආයු කාලය හෝ ඊට අඩු කාලපරිච්ඡේදයක් තුළ ඇස්තමේන්තු ගත අනාගත මූල්‍ය ගෙවීම් හෝ ලැබීම් උචිත පරිදි මූල්‍ය වත්කමේ හෝ ශුද්ධ ධාරණ අගයට වට්ටම් කරනු ලබන සැබෑ අනුපාතය වන සඵල පොළී අනුපාතය භාවිත කරමින් වාර්තා කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුළ පොළී ආදායම ඇතුළ් කර ඇත.

## 4.2. වියදම්
ව්‍යාපාරය පවත්වා ගෙන යාමේ දී දරණ ලද සියලු ම වියදම් වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේ දී ආදායමට එකතු කර ඇත. අලුත්වැඩියා සහ අලුත් කිරීම් එම වියදම දරණ ලද වර්ෂය තුළ දී ආදායමට හා වියදමට ගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් විදේශ කාර්යාල දෙකක් පවත්වා ගෙන යනු ලැබේ. එම ඒකකවලට අනුයුක්ත නිලධාරීන් දෙදෙනාගේ වැටුප්වලට අමතරව අනෙකුත් සියලු වියදම් සෑම ඒකකයක ම (මොස්කව් සහ චීනය) ප්‍රවර්ධන හා අලෙවි බදු යටතේ නඩත්තු වියදම් ලෙස පවත්වා ගෙන යනු ලැබේ.

## 5). බැඳීම් හා ප්‍රතිපාදන
### 5.1. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්
#### 5.1.1. නිර්ණීත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය බැඳී සිටී. සේවකයෙකු පාරිතෝෂික ලබා ගැනීම සඳහා හිමිකම් ලබන්නේ එකී සේවකයා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අඛණ්ඩ ව වසර පහක සේවා කාලයක් සපුරන්නේ නම් පමණි. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මකට වඩා පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චය කර ඇති ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන් හි හඳුනා ගෙන ඇති වගකීම වාර්තා කරන දිනයේ දී නිශ්චිතව දක්වා ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම වේ. ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කරමින් නිශ්චය කරන ලද ප්‍රතිලාභ වගකීම වාර්ෂිකව ගණනය කෙරේ. නිශ්චය කර ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් වර්ගයට අයත් පොළී අනුපාත භාවිත කර ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙනි. ගැලපීම් සහ ක්‍රියාකාරී උපකල්පනවල වෙනස්වීම් හේතුවෙන් ඇති වන ලාභ සහ අලාභ වෙනත් විස්තීර්ණ ආදායමක් හරහා රඳවා ගත් ඉපැයීම් ලෙස හඳුනා ගැනේ. පෙර සපයන ලද සේවා පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී සෘජුව ම හඳුනා ගැනේ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19, සේවක ප්‍රතිලාභවලට අනුකූලව සියලුම සේවකයින් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ සේවකයකු සම්බන්ධයෙන් වගකීමට බැඳෙනුයේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් තීරණය කිරීමේ දී භාවිත කරනු ලබන ප්‍රධාන උපකල්පන සටහන P මගින් දැක්වේ.

ගණනයේ දී භාවිත කරනු ලබන ප්‍රධාන උපකල්පන පහත පරිදි වේ.

අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප - 1.01% සිට 1.03% දක්වා වර්ධක අනුපාතය

| | |
|---|---|
| පොළී අනුපාතය /වට්ටම් අනුපාතය | - 8.96% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම | - 7.76% |

ඒ අනුව උපකල්පන හා පැහැදිලි කරන ලද ක්‍රමවේදය මත පදනම් ව සේවයේ නියුතු සේවකයින් සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දිනට නියමිත නිර්ණිත ප්‍රතිලාභ වගකීමේ (PVD BO) වර්තමාන වටිනාකම රුපියල් 61,083,177.88 ක් ලෙස දැක්වේ.

#### 5.1.2. නිර්ණිතදායක සැලසුම් - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල
අදාළ නීති රීති මගින් ආවරණය වන සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දායකත්වය ලබා දේ. සේවකයන් සඳහා මෙම සැලසුම වෙත කරනු ලබන දායකත්වය වියදමක් ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

**සේවක අර්ථ සාධක අරමුදල**
අර්ථසාධක අරමුදල සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සේවකයාගේ දළ වැටුපෙන් 15% ක ප්‍රමාණයක් ද අදාළ සේවකයා විසින් තම දළ වැටුපෙන් 10% ක ප්‍රමාණයක් ද දායක කරනු ලැබේ.

**සේවක භාරකාර අරමුදල**
මේ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සේවකයාගේ දළ වැටුපෙන් 3% ක ප්‍රමාණයක් දායක කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

6). 2024 දෙසැම්බර් 31 දිනට පවතින නඩු විභාග

| | නඩු අංකය | අධිකරණය | පාර්ශව | ක්‍රියා මාර්ගය | වත්මන් තත්වය |
|---|---|---|---|---|---|
| 1. | CA (Writ) 199/2020 | අභියාච නාධිරණය | ගැටගහවෙල (පුද්ගලික) වැවිලි සමාගම | ගැටගහවෙල (පුද්ගලික) වැවිලි සමාගම<br>- ගැටගහවෙල (පුද්ගලික) වැවිලි සමාගම ලියාපදිංචිය අත්හිටු වීම/ අවලංගු කිරීම<br>- P2 සහ P3 ක්‍රියාත්මක වීම අත්හිටු වීම<br>- තේ නැරැවිකරුවන් විසින් පෙත්සම්කරුගෙන් සැදු තේ මිල දී ගැනිම වැළැක් වීම<br>ගැටගහවෙල (පුද්ගලික) වැවිලි සමාගම ලියාපදිංචිය අත්හිටු වීම/ අවලංගු කිරීමේ කටයුත්ත නතර කරමින් හා P2 සහ P3 ලේඛන අහෝසි නොකරන ලෙසට සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම<br>ගැටගහවෙල (පුද්ගලික) වැවිලි සමාගම වෙතින් සෑදු තේ මිල දී ගැනිම, පිරිවැය දීමනා සම්බන්ධව වගඋත්තරකරුවන් විසින් බලපත්‍රලාභි තේ නැරැවිකරුවන් හට සීමා පැන වීම තහනම් කරමින් තහනම් රිට් ආඥාවක් ලබා දීම, නඩු ගාස්තු. | විසඳීමට තිබේ |
| 2. | CA (Writ) 200/2020 | අභියාච නාධිරණය | එච්.එම්. රුමේෂ් රංගන පෙත්සම්කරු<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ තේ කොමසාරිස්<br>-වගඋත්තරකරුවන් | පහත දෑ අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම<br>- නිව් ෆර්න්ලන්ඩ් තේ කර්මාන්ත ශාලාව ලියාපදිංචිය අත්හිටු වීම/ අවලංගු කිරීම<br>- P2 සහ P3 ක්‍රියාත්මක වීම අත්හිටු වීම<br>- තේ නැරැවිකරුවන් විසින් පෙත්සම්කරුගෙන් සෑදු තේ මිල දී ගැනිම වැළැක් වීම<br>නිව් ෆර්න්ලන්ඩ් තේ කර්මාන්ත ශාලාව ලියාපදිංචිය අත්හිටු වීම/ අවලංගු කිරීමේ කටයුත්ත නතර කරමින් හා P2 සහ P3 ලේඛන අහෝසි නොකරන ලෙසට සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම.<br>නිව් ෆර්න්ලන්ඩ් තේ කර්මාන්ත ශාලාව වෙතින් සෑදු තේ මිල දී ගැනිම සම්බන්ධව වගඋත්තරකරුවන් විසින් බලපත්‍රලාභි තේ නැරැවිකරුවන් හට සීමා පැන වීම තහනම් කරමින් තහනම් රිට් ආඥාවක් ලබා දීම, නඩු ගාස්තු | විසඳීමට තිබේ |
| 3. | CA (Writ) 415/21 | අභියාච නාධිරණය | තේ කම්හල් හිමියන්ගේ සං-ගමය - පෙත්සම්කරු<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ තේ කොමසාරිස් - වගඋත්තරකරුවන් | (2021.06.29 දින නිකුත් කරන ලද චක්‍රලේඛය අනුව තේ කර්මාන්ත ශාලාවක් විසින් මිල දී ගන්නා හරිත තේ දළු සඳහා සාධාරණ මිලක් ගෙවීම)<br>P2 සහ P3 ලේඛන අවලංගු කරමින් Certiorari ආඥාවක් නිකුත් කිරීම<br>P3 ලෙස සලකුණු කර ඇති ලේඛනය මත ක්‍රියා මාර්ග ගැනිම තහනම් කරමින් රිට් තහනමක් නිකුත් කිරීම<br>P3 පිරිවැය අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම | විසඳීමට තිබේ |
| 4. | CA (Writ) 272/23 | අභියාච නාධිරණය | බී.වී. ජයවර්ධන – පෙත්සම්ක-රු.<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් හත් දෙනෙකු<br>-වගඋත්තරකරුවන්. | P29 ලෙස ලකුණු කර ඇති ලියවිල්ල අවලංගු කිරීමේ සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම (6, 7 සහ 8 වැනි වගඋත්තරකරුවන් වෙත රුපියල් 80,580,427.77 නිකුත් කිරීමේ ලිපිය)<br>අන්තරායාවන නඩුවක් ගොනු කිරීමට හා සිවිල් නඩු විධාන සංග්‍රහයේ XLIII පරිච්ඡේදය ප්‍රකාරව රු. 80,580,427.77ක් රත්නපුර දිසා අධිකරණයට ගෙවීමට තේ කොමසාරිස් වෙතට මැන්ඩාමුස් ආඥාවක් නිකුත් කිරීම | විසඳීමට තිබේ |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | අවසාන තීන්දුව ගන්නා තෙක් රු.80,580,427.77ක් පොළී ගිණුමේ තැන්පත් කිරීමට නියෝග කරන අතුරු නියෝගයක් නිකුත් කිරීම.<br>P29 තුළ සඳහන් තීරණය සම්බන්ධයෙන් 1-4 වගඋත්තරකරුවන් විසින් පවත්වා ගෙන යනු ලබන ලිපි ගොනු ගෙන්වා ගැනීමේ අතුරු නියෝගය. පිරිවැය | |
| | CA (Writ) 679/23 | අභියාචන අධිකරණය | කොත්මලේ එන්ටප්‍රයිසස් සහ කේ.බී. මානවන් – පෙත්සම්කරුවන්.<br><br>ඊ.ජ්.ජේ.කේ.එදිරිසිංහ සහ තවත් හය දෙනෙකු - වගඋත්තරකරුවන්. | පහත දෑ සඳහා අතුරු නියෝගයක් නිකුත් කිරීම<br>- P14 (කුඹල් ඔලුව තේ කම්හලේ ලියාපදිංචිය අත්හිටුවීම) සහ P19 (කුඹල් ඔලුව තේ කම්හලේ අයිතිය සනාථ කිරීම සඳහා ලිපි කැඳවීම) යන තීරණය අත්හිටු වීම<br><br>P14 හි සඳහන් පරිදි කුඹල් ඔලුව තේ කම්හලේ ලියාපදිංචිය අත් හිටු වීම අවලංගු කරමින් සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම<br>P12 ලෙස සඳහන් ලේඛනය අවලංගු කිරීම (කුඹල් ඔලුව තේ කම්හලේ අයිතිය සනාථ කිරීම සඳහා ලිපි කැඳවීමේ ලේඛන)<br>P19 ලෙස සඳහන් ලේඛනය අවලංගු කිරීමේ සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම | විසඳීමට තිබේ |
| 6. | CA (Writ) 149/24 | අභියාචන අධිකරණය | නාවලකන්ද තේ කර්මාන්තශාලා (පුද්ගලික) සමාගම බී.ආර්. අනුර පීරිස් -පෙත්සම්කරු<br><br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් තිදෙනෙක් -වගඋත්තරකරුවන් | වාර්තාව කැඳවා පරීක්ෂා කිරීමට අතුරු නියෝගය<br>- P15 අත්හිටු වීම (නාවලකන්ද තේ කම්හලේ මෙහෙයුම් අත්හිටු වීම පිළිබඳ ලිපිය)<br>- තේ කම්හලේ ලියාපදිංචිය හා මෙහෙයුම් අත්හිටු වීම<br>- කිසියම් තේ විකුණුම් මාර්ගයක් ඉවත් කර ගැනීම සඳහා නිෂ්පාදන තැරැව්කරුවන්ට නියෝග කිරීම වැළැක් වීම<br>P15 වශයෙන් සඳහන් ලේඛනය හෝ එහි තීරණය අහෝසි කරමින් සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම<br>2023.08.04 දිනැති TC/CIR/(204)-07(01)-2023 චක්‍රලේඛය අවලංගු කරමින් සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම (P4)<br>නාවලකන්ද තේ කම්හලෙන් තේ මිල දී ගනු ලබන තැරැව්කරුවන්ට සීමාවන් පැන වීම වැළැක්වීමේ තහනම් නියෝගය, පිරිවැය | විසඳීමට තිබේ |
| 7. | CA (Writ) 437/24 | අභියාචන අධිකරණය | තේ අපනයනකරුවන්ගේ සංගමය -පෙත්සම්කරු<br><br>පී.ආර්. රණවක මිය, අධ්‍යක්ෂ ජනරාල්, NIPO<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් හතර දෙනෙක්-වගඋත්තරකරුවන් | NICE වර්ගීකරණයේ 35 වන පන්තියේ තේ අපනයනකරුවන් ස්ථාන ගත කිරීමට 1 වන වගඋත්තරකරුගේ තීරණය අවලංගු කිරීමේ සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කිරීම<br>35 වන පන්තිය යටතේ තේ අපනයනකරුවන් ලියාපදිංචි කිරීම තහනම් කරමින් 1 වන වගඋත්තරකරුට රිට් ආඥාවක් නිකුත් කිරීම<br>O'Dura Ceylon', Do FIL TEA, CHRIASH සහ SURJIHAN වශයෙන් සඳහන් ලියාපදිංචි කිරීම/ ඉල්ලුම් පත්‍ර වැළැක්වීමේ තහනම් ආඥාව, පිරිවැය(ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් කිසිදු සහනයක් ඉල්ලා නොමැත) | විසඳීමට තිබේ |
| 8. | CA (Writ) 648/24 | අභියාචන අධිකරණය | Etna Trade Link (pvt) Ltd -පෙත්සම්කරු<br>රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් අට දෙනෙක් - වගඋත්තරකරුවන් | පහත කරුණු සඳහා අතුරු තහනම් නියෝගයක් නිකුත් කිරීම<br>- P9 අත්හිටු වීම (තේ වල ගුණාත්මකබව පිළිබඳ දැනුම් දෙන ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් රේගුවට ලබා දුන් ලිපිය, පෙත්සම්කරුට නඩු පැවරීමට සහ තේවල ස්වභාවික ගුණය වෙනස් කිරීමට අවසර දීම)<br>- රේගු විමර්ශනය දිගට ම කර ගෙන යාම නැවැත් වීම<br>- දඩ හෝ තහනම් පැන වීමට රේගුව විසින් ගනු ලබන ඕනෑම තීරණයක් අත්හිටු වීම | විසඳීමට තිබේ |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | P9 ලෙස සඳහන් ලේඛනය අවලංගු කිරීමේ සර්ටියෝරාරි ආඥාවක් කිකුත් කිරීම<br>රේගු පරීක්ෂණයක් ආරම්භ කිරීමට / දඩුවම් සහ තහනම් පැනවීමට / තේ ප්‍රමිතිය පිළිබඳව විමර්ශනය කිරීමට ගත් තිරණය අවලංගු කිරීමේ සර්ටියෝරාරි ආඥාවක් කිකුත් කිරීම<br>රේගු විමර්ශනය අඛණ්ඩව සිදු කිරීම / දඩ සහ තහනම් පැනවීම / තේ ප්‍රමිතිය පිළිබඳ විමර්ශනය කිරීම නවත්වමින් තහනම් ආඥාවක් නිකුත් කිරීම<br>පෙත්සම්කරු/ පෙත්සම්කරුගේ භාණ්ඩ නිදහස් කිරීමට රේගුවට නියෝග කරන මැන්ඩමස්ගේ ආඥාවක් නිකුත් කිරීම | |
| 9. | SC FR 333/18 | Supreme Court | කේ.බී.පී.එස්. ලක්ෂ්මන්<br>- පෙත්සම්කරු<br><br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>- වගඋත්තරකරු | 21 වන වගඋත්තරකරුගේ සිට 24 වන වගඋත්තරකරු දක්වා පත්වීම් අවලංගු කිරීම<br>පෙත්සම්කරු සහකාර තේ කොමසාරිස් (ATC) තනතුරට උසස් කිරීම<br>රු. මිලියන 1.5 ක වන්දික් හා නඩු පිරිවැය ගෙවීම | විසඳීමට තිබේ |
| 10. | SC (SPL) LA 292/22 | Supreme Court | ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් 3 දෙනෙක්<br>-පෙත්සම්කාර වගඋත්තරකරු<br><br>කුරුගම තේ කර්මාන්ත ශාලාව (පුද්ගලික) සමාගම<br>- වගඋත්තරකාර පෙත්සම්කරු | අභියාචනා කිරීමට අවසර ලබා දීම<br>කුරුගම තේ කර්මාන්ත ශාලාවේ ලියාපදිංචිය අවලංගු කිරීමේ P2 ලිපිය අත්හිටු වීමට තිරණය කරමින් 2022.09.26 දිනැති අභියාචනාධිකරණ නඩු අංක CA (writ) 195/2020 දරණ තින්දුව පසෙක තැබීම හා P3 බලය ඉක්මවා යාමකි<br>පිරිවැය | විසඳීමට තිබේ |
| 11. | SC/SPL/ LA/170/ 2024 | Supreme Court | ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් 3 දෙනෙක්<br>- වගඋත්තරකාර පෙත්සම්කරු<br><br>එන්.එම්.එම්. බදුර්ස් (පුද්) සමාගම<br>(දෙහිවත්ත තේ කර්මාන්ත ශාලාව)<br>පෙත්සම්කාර වගඋත්තරකරු | - 2024.05.03 දිනැති අංක CA (writ) 196/2020 දරණ අභියාචනාධිකරණ තින්දුවට එරෙහි ව අභියාචනා කිරීමට විශේෂ අවසරයක් ලබා දීම<br>- 2024.05.03 දිනැති තින්දුව අත්හිටුවන ලෙස අත්හිටුවීමේ නියෝගයක් ලබා දීම<br>- අංක CA (writ) 196/2020 දරණ අභියාචනාධිකරණ වාර්තාව කැඳවීම හා 2024.05.03 දිනැති එම තින්දුව පසෙක තැබීම<br>- අංක CA (Writ) 196/2020 පෙත්සම නිෂ්ප්‍රභ කිරීම, පිරිවැය | විසඳීමට තිබේ |
| 12. | SC/SPL/ LA/176/ 2024 | Supreme Court | ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තවත් 3 දෙනෙක්<br>- වගඋත්තරකාර පෙත්සම්කරුවන්<br><br>පී. සවරිමුත්තු රෙට් සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගම<br>(උඩරට තේ කර්මාන්ත ශාලාව)<br>- පෙත්සම්කාර වගඋත්තරකරු | 2024.05.10 දිනැති CA (writ) 198/2020 දරණ අභියාචනාධිකරණ තින්දුවට එරෙහි ව අභියාචනා කිරීමට විශේෂ අවසරයක් ලබා දීම<br>- 2024.05.10 දිනැති තින්දුව ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමේ නියෝගයක් ලබා දීම<br>- 198/2020 CA (writ) දරණ අභියාචනාධිකරණ වාර්තාව කැඳවීම<br>- 2024.05.10 දිනැති එම තින්දුව පසෙක තැබීම. පෙත්සම්කරුගේ අභියාචනය ප්‍රතික්ෂේප කිරීම<br>- CA (writ) 198/2020 හි වගඋත්තරකරු, පිරිවැය | විසඳීමට තිබේ |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

## 7). අදාළ පාර්ශව ගනුදෙනු

### රජයේ හා රජයෙන් පාලනය වන ආයතන සමග වූ ගනුදෙනු

සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාකාරිත්වය තුළ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය අදාළ පාර්ශවයන් සමග ගනුදෙනු සිදු කරයි. අදාළ පාර්ශවයන් ලෙස ශ්‍රී ලංකා රජය (ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අවසාන හිමිකරු රජය වේ) රජයේ විවිධ දෙපාර්තමේන්තු සහ රජයෙන් පාලනය වන ආයතන ඇතුළත් වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රජයේ හා රජය මගින් පාලනය වන ආයතන සමග ඇති කර ගත් තනි තනි වශයෙන් වැදගත් සහ තනි තනි ව වැදගත් නොවන නමුත් සාමුහිකව වැදගත් ගනුදෙනු සහ විධිවිධාන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

### 7.1. තේ මන්දිරය (තේ මොහොත) සඳහා මිල දී ගත් ස්ථාවර වත්කම් ආපසු ලබා දීමේ පදනම මත තාවකාලිකව ශ්‍රී ලංකා කප්ශු සංස්ථාවට පවරා දෙන ලදී.

### 7.2. ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය

වැව්ලි කළමනාකරණ ආයතනයට අයත් පරිශ්‍රයේ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයට පොලී රහිත ණයක් ලබා දෙන ලදී.

| | |
|---|---|
| ණය මුදල | - රුපියල් මිලියන 35 |
| ණය කාල සීමාව | - 2023 ඔක්තෝබර් 18 සිට 2029 ඔක්තෝබර් 17 දක්වා |
| සහන කාල සීමාව | - 2023 ඔක්තෝබර් 18 සිට 2024 නොවැම්බර් 17 දක්වා |

### 7.2. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**සෘජු තේ වගා ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුම**

සෘජු තේ වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (TSHDA) සමග අවබෝධතා ගිවිසුමකට එළඹුණු අතර, එහි මුළු ව්‍යාපෘති වටිනාකම රුපියල් මිලියන 750 කි. ප්‍රවර්ධන සහ අලෙවි බද්ද මගින් මෙම ව්‍යාපෘතියට අරමුදල් සපයනු ලැබේ.

ගිවිසුමට අනුව, 2023 වසරේ දී රුපියල් මිලියන 150 ක් ලබා දුන් අතර 2024 වසරේ දී රු. මිලියන 291.8 ක් ලබා දෙන ලදී.

වසර තුළ ව්‍යාපෘතිය යටතේ ලබා දුන් අත්තිකාරමෙන් රුපියල් මිලියන 291.5 ක මුදලක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් පියවා ඇත. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය අඛණ්ඩව නියාමනය කරන අතර, පසුව සිදු කරන ලද පියවීම් ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලැබේ.

### 7.4. කුඩා තේ වතු හිමියන්ට පොහොර සඳහා මූල්‍ය සහාය

කිලෝ ග්‍රෑම් 50 ක පොහොර බෑගයක් සඳහා ගෙවිය යුතු මිල පහත හෙලීමෙන් කුඩා තේ වතු හිමියන්ට සහාය වීම සඳහා සීමා සහිත රාජ්‍ය පොහොර සමාගම, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (TSHDA) අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අත්සන් කරන ලදී.

ප්‍රවර්ධන සහ අලෙවි බද්ද මගින් මෙම ව්‍යාපෘතියට අරමුදල් සපයනු ලබන අතර, වර්ෂය තුළ ව්‍යාපෘතිය යටතේ සමස්ත මූල්‍යාධාරය ලබා දෙන ලදී. මෙම රුපියල් මිලියන 914.2 ක මුදලින් රුපියල් මිලියන 830.5 ක් සංවර්ධන වියදම්වලට (සටහන B) ඇතුළත් වන අතර රුපියල් මිලියන 83.7 ක ඉතිරි මුදල මූල්‍ය ප්‍රකාශ සටහනේ දක්වා ඇත.

මූල්‍ය හා මෙහෙයුම් ප්‍රගතිය අදාළ පරිදි නියාමනය කරනු ලැබේ. අදාළ පරිදි ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් සිදු කළ යුතු ගෙවීම් අනාවරණය කෙරේ.

### 7.5. කුඩා තේ වතු හිමියන්ට පොහොර සඳහා මූල්‍ය සහාය

**7.5.1 මහා භාණ්ඩාගාරය සඳහා ණය - ඒකා බද්ධ අරමුදල**

ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් අනුමත කළ පරිදි, රුපියල් මිලියන 1000 ක අතිරික්තය ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අවශ්‍ය වූ විටක දී ඉල්ලීම් කර ලබා ගැනීමට හැකි වන පරිදි ඒකාබද්ධ අරමුදලට පැවරීමට 1971 අංක 38 දරණ මුදල් පනතේ වගන්ති අංක 11 ප්‍රකාරව 2019 දී අනුමැතිය ලබා දෙන ලදී.

**7.5.2 ඒකාබද්ධ අරමුදලට දායකත්වය**

2023 වර්ෂය තුළ ප්‍රවර්ධන හා අලෙවි බදු ආයෝජන තුළින් ඉපැයූ පොළී ආදායමෙන් රුපියල් මිලියන 100 ක දායකත්වයක් ඒකාබද්ධ අරමුදලට (මහා භාණ්ඩාගාරයට) ලබා දෙන ලදී.

### 7.6. තේ කර්මාන්තශාලා නැවත බල ගැන්වීම සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය - රු. මිලියන 500

කාරක ප්‍රාග්ධන දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින තේ කර්මාන්තශාලා සඳහා මහ බැංකුව හරහා ණය ලබා දීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය තීරණය කර ඇත. 2023 දෙසැම්බර් 31 වන දිනට රුපියල් මිලියන 0.75 ක හිඟ මුදලක් පියවන ලදී.

### 7.7. ප්‍රමිති ගත තේ පැල තවාන් පිහිටුවීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

ප්‍රමාණයෙන් අක්කර 10 කට වැඩි පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ වතු සඳහා විසිරි ජල බිඳු තාක්ෂණය ඔස්සේ තේ තවාන් ප්‍රමිතිකරණය කිරීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමය හඳුන්වා දීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය තීරණය කර ඇත. ප්‍රවර්ධන හා අලෙවි බද්ද මගින් අරමුදල් වෙන් කිරීම් සිදු කරන ලදී.

2022 - රුපියල් 750,000/-
2023 - රුපියල් 5,400,000/-
2024 - රුපියල් 49,428,000/-

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

### 7.8. ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ලබා දුන් තාවකාලික ණය.

රුපියල් මිලියන 34 ක තාවකාලික ණයක් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන දුෂ්කරතා මග හරවා ගැනීම සඳහා ලබා දෙන ලදී. මෙසේ ලබා දෙන ලද ණය 2024 වර්ෂය තුළ පොලිය සමග අය කර ගැනීමට තීරණය විය.

### 7.9. සූර්ය බලශක්ති සහනාධාරය/ යෝජනා ක්‍රමය

කර්මාන්ත ශාලා සඳහා විදුලිය නිපදවීමට "රූෆ් ටොප් සෝලා පවර්"පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා කර්මාන්තශාලා හිමියන් ලබා ගෙන ඇති ණය වෙනුවෙන් පොළී සහනාධාර ලබා දීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

2024 වර්ෂය තුළ කර්මාන්තශාලා 35 ක් සඳහා සූර්ය බලශක්ති සහනාධාර යෝජනා ක්‍රමය සඳහා රුපියල් 12.3 ක් ගෙවා ඇත.

### 8). ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් වේ.

### 9). ප්‍රවර්ධන සහ අලෙවි බද්ද

අංක 167714 හා 2010 ඔක්තෝබර් 27 දිනැති ගැසට් නිවේදනය අනුව රේගු භාණ්ඩ ප්‍රකාශය (CUSDEC) සඳහා අනුමැතිය ලබා දෙන අවස්ථාවේ දී සෑම ලියාපදිංචි තේ අපනයනකරුවෙකු ම සෑම තේ කිලෝ ග්‍රෑම් එකකට රු. 3.50 ක් බැගින් ගෙවිය යුතු වූ අතර පසුව 2021 දෙසැම්බර් 14 දිනැති අංක 2258/15 දරණ ගැසට් නිවේදනය අනුව එම මුදල රුපියල් 3 දක්වා අඩු කර ඇති අතර 2023 අගෝස්තු 05 දක්වා එය ක්‍රියාත්මක විය.

### 10). බලපත්‍ර ගාස්තු

2023 අගෝස්තු 05 දිනැති ඇති විශේෂ ගැසට් පත්‍ර අංක 2343/63 ට අනුව 2023 අගෝස්තු 05 දින සිට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තේ අපනයනය සඳහා අවසර ලබා දෙමින් රේගු භාණ්ඩ ප්‍රකාශය (CUSDEC) සඳහා අනුමැතිය ලබා දෙන අවස්ථාවේ දී සෑම ලියාපදිංචි තේ අපනයනකරුවෙකු ම සෑම තේ කිලෝ ග්‍රෑම් එකකට රු. 3.00ක් බැගින් ගෙවනු ලබන අතර වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු රුපියල් 758,905,630.00 ක මුදලක් එකතු කරන ලද අතර රුපියල් 379,452,815.00 ක මුදලක් ප්‍රවර්ධන වියදම් සඳහා ලබා දෙන ලදී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

## 11) අමතර හෙළිදරව් කිරීම්

වාණිජ හා අනෙකුත් මෙහෙයුම් කටයුතු වෙනුවෙන් පරිශ්‍රයන් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය බදු කුලී ගිවිසුම්වලට එළඹ ඇත.

| බදු පරිශ්‍රය | ප්‍රදේශය | ගොඩනැගිලි අයිතිකරු / ගෙවන්නා | ගිවිසුම් දිනය | මාසික කුලිය |
|---|---|---|---|---|
| මතුගම | | එස්. නානායක්කාර | 2023.03.01 - 2025.02.28 | Rs.15,000.00 |
| ඉංගිරිය | බදුරලිය | බී.ජ්. සීතා | 2024.01.01 - 2025.12.31 | Rs.15,000.00 |
| ඇල්පිටිය | | එම්.එච්. නන්දාවතී | 2023.04.01 - 2025.03.31 | Rs.15,000.00 |
| හාලි ඇල | | වී.එම්.එන්.ආර්. කුමාරදාස | 2022.05.01 - 2024.04.30 | Rs.15,000.00 |
| පස්සර | බණ්ඩාරවෙල | එච්.එම්. වි ෙසූරිය | 2024.08.01 - 2026.07.31 | Rs.15,000.00 |
| වැලිමඩ | | ඩබ්ලිව්.එම්. මිරාන් අනුරාධ | 2025.01.22 - 2027.01.21 | Rs.15,000.00 |
| ගම්පොළ | | එච්.එම්.ටී.එම්. හේරත් | 2024.08.01 - 2026.07.31 | Rs.15,000.00 |
| උඩුනුවර | ගම්පොළ | කේ.ඩී.එස්.කේ. සේනාධීර | 2024.08.08 - 2026.08.07 | Rs.15,000.00 |
| මාතලේ | | ආර්. පී. කරුණාසේකර | 2024.04.23 - 2026.04.22 | Rs.15,000.00 |
| යක්කලමුල්ල | | එන්.පී. ජයතිලක | 2024.01.01 -2025.12.31 | Rs.15,000.00 |
| ගාල්ල | | අයි.එස්. වීදාගම ආරච්චි | 2024.06.20 - 2026.06.19 | Rs.15,000.00 |
| හිනිදුම | ගාල්ල | ඩබ්ලිව්. කේ. දිමුතු සචිත් | 2024.01.01 - 2025.12.31 | Rs.15,000.00 |
| නාගොඩ | | ඩබ්ලිව් ලාල් ජයන්ත | 2025.01.03 - 2027.01.02 | Rs.15,000.00 |
| බද්දේගම | | යූ.එල්. කාන්ති ශ්‍රියා | 2024.08.01 - 2025.07.31 | Rs.15,000.00 |
| දෙණියාය | | එන්.පී.එස්. පුෂ්පකුමාර | 2024.03.01 - 2026.02.28 | Rs.15,000.00 |
| මොරවක | | බී.එල්. නදීෂ ලක්මාල් | 2024.11.01 - 2026.10.31 | Rs.15,000.00 |
| අකුරැස්ස | මාතර | පී.නාලනී ප්‍රියංකා | 2024.11.01 - 2026.10.31 | Rs.15,000.00 |
| කොටපොල | | බී.පී. සංඛ මධුරසාත් | 2023.07.01 - 2025.06.30 | Rs.15,000.00 |
| ඌරුබොක්ක | | ඩබ්ලිව්.එස්. මල්කාන්ති | 2024.03.01 - 2026.02.28 | Rs.15,000.00 |
| තලවකැලේ | | ඩබ්.වී. ධනපාල | 2024.08.13 - 2026.08.12 | Rs.15,000.00 |
| කොත්මලේ | නුවර එළිය | ඩී.එම්.පී.පී.පී.ජ්.කේ. දසනායක | 2023.05.01 - 2025.04.30 | Rs.15,000.00 |
| නෝර්වුඩ් | | එල්.එම්. පද්මනාදන් | 2023.08.01 - 2025.07.31 | Rs.15,000.00 |
| වලපනේ | | ජේ.එම්. දීපා ප්‍රියංගනී | 2024.01.01 - 2025.12.31 | Rs.15,000.00 |
| ගිණිගත්හේන | | එච්.ආර්. සුසන්ත සෝමවීර | 2024.03.01 - 2026.02.28 | Rs.15,000.00 |
| පැල්මඩුල්ල | | පී.ඩබ්ලිව්. දයාවංශ | 2025.01.01 - 2025.12.31 | Rs.15,000.00 |
| රක්වාන | | එච්.එම්.පී. කුමුදු කුමාරි | 2023.05.16 - 2025.05.15 | Rs.15,000.00 |
| බලන්ගොඩ | රත්නපුර | එච්.කේ.එච්. ශ්‍රී ප්‍රියාල් | 2023.06.01 - 2025.05.31 | Rs. 7,500.00 |
| රත්නපුර | | වයි.සුමනා කාන්ති | 2023.04.01 - 2025.03.31 | Rs.15,000.00 |
| කරවනැල්ල | | කේ.ඩී. අජිත් කුමාර | 2024.03.01 - 2024.02.28 | Rs.15,000.00 |

| | | |
|---|---|---|
| සීමාසහිත ට්‍රයිකෝ ලොජිස්ටික් පුද්ගලික සමාගම | 2023.11.26 – 2025.11.25 | Rs. 66,275.00 |
| පී.ජේ.අමරතුංග මහතා - මාතර ප්‍රාදේශීය කාර්යාලය | 2025.01.01 – 2024.12.31 | Rs.140,000.00 |
| කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,<br>වලහන්දුව වත්ත, වලහන්දුව, ගාල්ල. | 2023.03.01 – 2026.02.28 | Rs.110,000.00 |
| එච්.කේ. ලීලාරත්න මයා<br>ATC නිල නිවාසය, (ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය)<br>අංක 20, සේනානායක මාවත,වැල්හන්දුව, ගාල්ල. | 2024.06.12 – 2025.06.11 | Rs. 25,000.00 |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

## 12. තෙල් සඳහා තේ ගිවිසුම

ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ ඉරානයේ කර්මාන්ත, පතල් හා වෙළෙඳ අමාත්‍යාංශය ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාවෙන් ඉරාන රජයට ගෙවීමට තිබෙන ඇමරිකානු ඩොලර් 250,925,169 ක මුදලක් පියවීමට හා එම මුදල භාවිත කරමින් සිලෝන් තේ ඉරානයට අපනයනය කිරීම පහසු කිරීම සඳහා 2020 දෙසැම්බර් 21 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමත පරිදි යෝජනා ක්‍රමයක් සකස් කරන ලදී.

ඒ අනුව ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය උක්ත කරුණු සඳහා යෝජනා ක්‍රමයක් සැකසීම සඳහා ගිවිසුමකට එළඹෙන ලදී.

මෙම යෝජනා ක්‍රමය 2023 අගෝස්තු 01 දින සිට බලාත්මක වූ අතර එතෙක් ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව ඇමරිකානු ඩොලර් 20,000,000 ට සමාන අරමුදල් ගනුදෙනු කරන දිනයේ පැවති විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ලබා දෙන ලදී. ලියාපදිංචි තේ අපනයනකරුවන් සඳහා ගෙවීමට ලැබුණු මුළු මුදල 2023 දී රු. 6,402,111,500/- ක් වූ අතර 2024 රු. 27,232,059,500,00 ක් විය.

තේ අපනයනකරුවන්ට ගෙවීම් සිදු කිරීමට පෙර සියලු ම ගනු දෙනු M/S.Ernest & Young Consulting Services (Pvt)& Ltd විසින් විගණනය කළ යුතුය.

මෙම යෝජනා ක්‍රමය යටතේ තේ අපනයනකරුවන් සඳහා ගෙවීම් කිරීමට ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාවේ අරමුදල් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ලබා දීමේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තත්කාලීන අනුපාතය භාවිත කරන ලදී.

| | රු. (මිල) |
|---|---|
| ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාවෙන් ලැබුණු මුදල් | 27,232,059,500.00 |
| 2024.12.31 දක්වා අපනයනකරුවන්ට නිකුත් කළ අරමුදල් | 24,165,417,816.26 |
| අර්නස්ට් ඇන්ඩ්යන්ග් උපදේශන සේවා පුද්ගලික සමාගම වෙත විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 2,314,157.61 |
| 2024.12.31 දිනට අපනයනකරුවන් වෙතට නිදහස් කිරීමට තිබෙන මුදල | 3,066,641,683.74 |
| **පරිපාලන ආදායම** | **2,100,000.00** |

## 13) ප්‍රාග්ධන අවශ්‍යතාවය හා හදිසි අවස්ථා

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රාග්ධන බැඳීම් සහ ඇති වීමට හැකි වගකීම් මූල්‍ය ප්‍රකාශන සඳහා අදාළ සටහන් මගින් අනාවරණය කර ඇත.

### 13.1. 2022/2023 වසර සඳහා තේ අපනයනකරුවන් සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය

ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 1,725 ක අයවැය ප්‍රතිපාදනයක් වෙන් කර ඇත. ව්‍යාපෘතිය සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති අතර භාණ්ඩාගාර අනුමැතිය තවමත් ලබා ගෙන නොමැත. 2024 දෙසැම්බර් 31 වන දින වන විට, මෙම යෝජනා ක්‍රමය යටතේ කිසිදු මුදලක් වියදම් කොට නොමැත. ප්‍රවර්ධන සහ අලෙවිකරණ බද්ද හරහා ව්‍යාපෘතියට අරමුදල් ලබා දෙන අතර අවශ්‍ය අනුමැතිය ලැබීමෙන් පාඩු ගෙවීම් ආරම්භ කෙරේ. අරමුදල් භාවිතය සහ ව්‍යාපෘති ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන තොරතුරු ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළින් දක්වනු ලැබේ.

## 14) ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශන දිනයෙන් පසු සියලු ම ප්‍රමාණාත්මක සිදුවීම් සුදුසු අවස්ථාවල දී සැලකිල්ලට ගෙන ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් සිදු කිරීම හෝ ප්‍රමාණවත් ලෙස අනාවරණය කිරීම සිදු කර ඇත.

මුල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|---|
| **A. ආදායම** | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන- පුනරාවර්තන | | - | 180,000,000 |
| බලපත්‍ර ගාස්තු | සටහන 1 | 379,452,815 | 154,483,798 |
| සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් ප්‍රවර්ධන සහ අලෙවි බද්ද | | 1,123,577,432 | 212,786,346 |
| රසායනාගාර ආදායම | සටහන 2 | 52,431,050 | 31,589,500 |
| ප්‍රවර්ධන සහ අලෙවි බද්දෙන් ලබා දුන් පොළිය | | 268,198,323 | 150,000,000 |
| ලියාපදිංචි සහ අලුත් කිරීමේ ආදායම | සටහන 3 | 289,877,295 | 256,474,785 |
| වාණිජ කටයුතු වලින් ලද ශුද්ධ ලාභය | සටහන 4 | 24,421,608 | 21,812,366 |
| නුවරඑළිය අලෙවි කවුන්ටරය හා සංචාරක නිකේතනය | සටහන 5 | 2,183,410 | 1,867,305 |
| වෙනත් ආදායම් | සටහන 6 | 12,965,647 | 11,927,460 |
| | | **2,153,107,580** | **1,020,941,560** |
| **B. තේ ක්ෂේත්‍ර සංවර්ධන වියදම්** | | | |
| තේ කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය | | 5,321,406 | 16,984,932 |
| තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය | | 24,988,950 | 52,473,750 |
| උසට වැඩෙන ගස් සඳහා සහනාධාර යෝජනා ක්‍රමය | | 11,000 | 286,500 |
| යහපත් නිෂ්පාදන පිළිවෙත් - HACCP සහතිකය | | 3,723,190 | 926,900 |
| තේ තවාන් සංවර්ධනය | | 9,100,000 | - |
| ආදර්ශ තේ වතු වියදම් | | 100,000 | 7,115,000 |
| GMP-තෙතමන මීටර සහනාධාර යෝජනා ක්‍රමය | | 1,067,763 | 3,076,875 |
| බී-දළු 60 වැඩසටහන | | 6,483,820 | 8,393,978 |
| යාන්ත්‍රිකරණය සමග නව වගාව සඳහා සහනාධාර ක්‍රමය | | 32,173,350 | 13,112,100 |
| ජෛව පොහොර ව්‍යාපෘතිය සඳහා සහනාධාර ක්‍රමය | | 5,300,000 | 1,900,000 |
| සූර්ය බලශක්ති පද්ධතිය ස්ථාපනය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය | | 15,782,168 | 14,076,271 |
| අපනයනකරුවන්ගේ යන්ත්‍රෝපකරණ සඳහා සහනාධාර යෝජනා ක්‍රමය | | 26,082,728 | 39,369,528 |
| තවාන් සංවර්ධනය සඳහා සහනාධාරය | | 5,150,000 | 14,650,000 |
| විසිරි ජල බිඳු පද්ධතිය සහිත සම්මත තේ තවානක් පිහිටු වීම- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | | 49,428,000 | 7,576,891 |
| මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වගාකරුවන් සඳහා විසිරි ජල බිඳු පද්ධතිය - ISSS | | - | 5,198,800 |
| ඵලදායිතාවය වර්ධනය කිරීමේ වැඩසටහන | | 2,145,000 | 282,950 |
| අලෙවි නියෝජිත තැන්පතු මුදල් ආපසු ගැනීම | | - | 20,000 |
| සෘජු තේ වගා වැඩසටහන - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | | 293,057,432 | 150,000,000 |
| කුඩා තේ වතු හිමියන් සඳහා පොහොර | | | |
| බැගයක මිල අඩු කිරීම | | 830,520,000 | - |
| ඇග්‍රෝ මීටර් සවි කිරීම | | 2,400,000 | - |
| තේ පාළු සිටුවීමේ වැඩසටහන | | 29,987,775 | - |
| ශ්‍රම ඵලදායිතාවය ඉහළ නැංවීම | | 11,722,500 | - |
| සෘජු තේ වගා වැඩසටහන | | 74,311,508 | - |
| ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන - ප්ලාස්ටික් පෙට්ටි | | 29,869,509 | - |
| | | **1,458,726,099** | **335,444,475** |

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|---|
| **C. පරිපාලන වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | සටහන 7.1 | 239,473,892 | 219,356,534 |
| අනෙකුත් පරිපාලන වියදම් | සටහන7.2 | 92,744,956 | 92,900,469 |
| ගමන් වියදම් | සටහන 8 | 38,417,403 | 26,617,391 |
| සැපයුම් සහ ආවශ්‍යතා | සටහන 9 | 26,370,219 | 21,664,531 |
| අලුත්වැඩියා සහ නඩත්තු | සටහන 10 | 50,475,993 | 46,582,637 |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂය වීම් | සටහන F | 47,359,189 | 42,901,487 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | සටහන H | 2,360,348 | 2,385,811 |
| කල් බදු දේපල ක්‍රමක්ෂය | සටහන G | 76,386 | 76,385 |
| උපයෝගිතා සහ වෙනත් වියදම් | සටහන 11 | 133,284,793 | 112,309,559 |
| | | **630,563,179** | **564,794,804** |
| **D. මූල්‍ය ආදායම්** | | | |
| ආයෝජනයෙන් ලද පොළිය | | 91,425,441 | 112,610,616 |
| ZAB ගිණුමෙන් ලද පොළිය | | 20,487,812 | - |
| | | **111,913,253** | **112,610,616** |
| **E. මූල්‍ය වියදම්** | | | |
| බැංකු ගාස්තු | | 305,557 | 247,508 |
| | | **305,557** | **247,508** |

### F. දේපල, පිරියත හා උපකරන

#### F.1 ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල

| | 2024.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව | එකතුකිරීම් / පැවරීම් | පැවරීම් | බැහැර කිරීම් | ප්‍රත්‍යාගණනය: ප්‍රත්‍යාගණන ගැළපීම් | 2023.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 1,051,560,000 | - | - | - | - | 1,051,560,000 |
| ගොඩනැගිලි | 402,878,999 | - | - | - | - | 402,878,999 |
| මෝටර් සහ වෙනත් වාහන | 38,938,612 | - | - | - | - | 38,938,612 |
| පිරියත හා යන්ත්‍ර | 71,766,148 | 3,241,922 | - | 1,499,042 | - | 73,509,028 |
| කාර්යාලීය උපකරණ | 28,917,174 | 1,967,089 | - | 160,276 | - | 30,723,987 |
| ජල විදුලිය හා දුරකථන | 1,802,445 | - | - | 33,940 | - | 1,768,505 |
| සැරසිලි හා ප්‍රදර්ශන භාණ්ඩ | 1,026,607 | - | - | - | - | 1,026,607 |
| ලී බඩු සහ සවිකුරු | 41,925,819 | 11,349,394 | - | 2,162,210 | - | 51,113,003 |
| පුස්තකාල පොත | 452,889 | - | - | - | - | 452,889 |
| පරිගණක දෘඩාංග | 49,511,109 | 13,656,612 | - | 4,698,403 | - | 58,469,318 |
| රසායනාගාර උපකරණ | 139,924,858 | 29,825,927 | - | 7,340,741 | 118,477 | 162,291,567 |
| | **1,828,704,660** | **60,040,944** | **-** | **15,894,612** | **118,477** | **1,872,732,515** |
| **කරමින් පවතින වැඩ** | | | | | | |
| ගොඩනැගිලි හා වෙනත් | 7,173,679 | 22,549,774 | - | - | 2,809,863 | 26,913,591 |
| | **1,835,878,338** | **82,590,718** | **-** | **15,894,611** | **2,928,340** | **1,899,646,105** |

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
### 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | 2024.01.01 දිනට සමුච්චිත ක්ෂය වීම් | වර්ෂය සඳහා අය කිරීම | ප්‍රත්‍යාගණනය ගැළපුම් | අපහරණ | ගැළපුම් | 2024.12.31 දිනට සමුච්චිත ක්ෂය වීම් |
|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 18,381,925 | 8,060,755 | - | - | - | 26,442,680 |
| මෝටර් සහ වෙනත් වාහන | 7,368,591 | 7,359,002 | - | - | - | 14,727,593 |
| පිරියත හා යන්ත්‍ර | 38,703,226 | 5,727,050 | - | 1,499,042 | - | 42,931,234 |
| ජල විදුලිය හා දුරකථන | 1,495,478 | 22,559 | - | 33,940 | - | 1,484,097 |
| කාර්යාලීය උපකරණ | 24,013,164 | 1,926,837 | - | 160,276 | - | 25,779,725 |
| සැරසිලි හා ප්‍රදර්ශන භාණ්ඩ | 1,024,274 | 500 | - | - | - | 1,024,774 |
| ලී බඩු සහ සවිකුරු | 31,253,898 | 2,738,691 | - | 1,446,643 | 5,391,124 | 37,937,070 |
| පුස්තකාල පොත් | 452,096 | 660 | - | - | - | 452,755 |
| පරිගණක උපාංග | 39,542,407 | 4,705,821 | - | 4,521,566 | - | 39,726,662 |
| රසායනාගාර උපකරණ | 71,861,147 | 16,784,904 | - | 7,340,741 | - | 81,305,310 |
| | **234,096,206** | **47,326,779** | **-** | **15,002,208** | **5,391,124** | **271,811,900** |
| **ශුද්ධ පොත් අගය** | **1,601,782,133** | | | | | **1,627,834,204** |

**F.2 විදේශ කාර්යයාල**

| | 2024 .01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව | එකතු කිරීම් / පැවරීම් | ප්‍රත්‍යාගණනය | අපහරණ/ පැවරීම් | ප්‍රත්‍යාගණන ගැළපුම් | 2024.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව |
|---|---|---|---|---|---|---|
| මෝටර් සහ වෙනත් වාහන | 11,875,583 | - | - | - | - | 11,875,583 |
| කාර්යාලීය උපකරණ | 1,874,090 | - | - | - | - | 1,874,090 |
| ලී බඩු සහ සවිකුරු | 822,786 | - | - | - | - | 822,786 |
| පරිගණක උපාංග | 336,457 | - | - | | - | 336,457 |
| | **14,908,916** | **-** | **-** | **-** | **-** | **14,908,916** |

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
### 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන | 2024.01.01 දිනට සමුච්චිත ක්ෂය වීම් | වර්ෂය සඳහා අය කිරීම | ප්‍රත්‍යාගණනය ගැළපුම් | අපහරණ | ගැළපුම් | 2024.12.31 දිනට සමුච්චිත ක්ෂය වීම් |
|---|---|---|---|---|---|---|
| මෝටර් සහ වෙනත් වාහන | 6,459,387 | 1,    7,558 | - | - | - | 7,646,945 |
| කාර්යාලීය උපකරණ | 1,821,418 | 12,726 | - | - | - | 1,834,144 |
| ලී බඩු සහ සවිකුරු | 681,284 | 25,462 | - | - | - | 706,745 |
| පරිගණක දෘඪාංග | 308,419 | 28,037 | - | | - | 336,456 |
| | **9,270,508** | **1,253,783** | **-** | **-** | **-** | **10,524,290** |
| ශුද්ධ පොත් අගය | **5,638,408** | | | | | **4,384,625** |

## G. කල්බදු දේපල

| | 2024.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව | එකතු කිරීම් | ප්‍රත්‍යාගණනය | කපා හැරීම් | ගැළපුම් | 2024.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව |
|---|---|---|---|---|---|---|
| කල්බදු දේපල - ප්‍රධාන කාර්යාලය | 3,819,280 | - | | - | - | 3,819,280 |
| | **3,819,280** | **-** | **-** | **-** | **-** | **3,819,280** |

| ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන | 2024.01.01 දිනට සමුච්චිත ක්ෂය වීම් | වර්ෂය සඳහා අය කිරීම | ප්‍රත්‍යා ගණනය ගැළපුම් | කපා හැරීම් | ගැළපුම් | 2024.12.31 දිනට සමුච්චිත ක්ෂය වීම් |
|---|---|---|---|---|---|---|
| කල්බදු දේපල - ප්‍රධාන කාර්යාලය | 1,468,328 | 76,385 | - | - | - | 1,544,713 |
| | **1,468,328** | **76,385** | **-** | **-** | **-** | **1,544,713** |
| ශුද්ධ පොත් අගය | **2,350,952** | | | | | **2,274,567** |

## H. අස්පෘශ්‍ය වත්කම්

| | 2024.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව | එකතු කිරීම් | ප්‍රත්‍යා ගණනය | අපහරණ/ පැවරීම් | ගැළපුම් | 2024.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව |
|---|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග- ප්‍රධාන කාර්යාලය | 31,927,213 | - | - | - | - | 31,927,213 |
| පරිගණක මෘදුකාංග වැඩ | 18,169,899 | - | - | | - | 18,169,899 |
| | **50,097,112** | **-** | **-** | **-** | **-** | **50,097,112** |

| ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන | 2024.01.01 දිනට සමුච්චිත ක්ෂය වීම් | වර්ෂය සඳහා අය කිරීම | ප්‍රත්‍යා ගණනය | අපහරණ | ගැළපුම් | දිනට සමුච්චිත ක්ෂය වීම් 2024.01.01 |
|---|---|---|---|---|---|---|
| පරිගණක දෘඪාංග - ප්‍රධාන කාර්යාලය | 21,469,311 | 2,360,348 | - | - | - | 23,829,659 |
| | **21,469,311** | **2,360,348** | **-** | **-** | **-** | **23,829,659** |
| ශුද්ධ පොත් අගය | **28,627,801** | | | | | **26,267,453** |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|---|
| **I .භාණ්ඩ තොග** | | | |
| රසායනාගාර පාරිභෝගික භාණ්ඩ | සටහන 12.1 | 14,292,908 | 15,938,448 |
| ප්‍රචාරණ ද්‍රව්‍ය සහ වෙනත් | සටහන 12.2 | 11,591,589 | 20,499,745 |
| තේ සහ වෙනත් තොග | සටහන 12.3 | 17,312,243 | 27,011,150 |
| වෙනත් | සටහන 12.4 | 26,937,686 | 1,110,594 |
| | | **70,134,426** | **64,559,937** |
| **J. වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ** | | | |
| ලැබිය යුතු දෑ | සටහන 13 | 126,604,097 | 58,085,783 |
| තානාපති කාර්යාල ගිණුම් | සටහන 13.1 | 132,574 | 8,832,138 |
| තේ ප්‍රවර්ධන ඒකකය - ජංගම ගිණුම් | සටහන 13.2 | 10,297,260 | 34,242,858 |
| කාර්යමණ්ඩල ලැබිය යුතු දෑ සහ වෙනත් අත්තිකාරම් | සටහන 14 | 190,987,825 | 139,994,022 |
| | | **328,021,756** | **241,154,800** |
| **K. තැන්පතු සහ පෙර ගෙවුම්** | | | |
| තැන්පතු සහ පෙර ගෙවුම් | සටහන 15 | 34,086,735 | 54,352,528 |
| | | **34,086,735** | **54,352,528** |
| **L. අනෙකුත් මූල්‍ය වත්කම්** | | | |
| ආයෝජන | සටහන 16 | 10,843,100,426 | 13,640,954,803 |
| | | **10,843,100,426** | **13,640,954,803** |
| **M. ලැබිය යුතු ණය මුදල්** | | | |
| මහා භාණ්ඩාගාරය | | 1,000,000,000 | 1,000,000,000 |
| තේ තැරව්කරුවන්ට දුන් මූල්‍ය පහසුකම් | | 100,057,966 | 61,070,125 |
| ජාතික වැවිලි කළමනාකරණ ආයතනයට දුන් ණය | | 34,416,666 | 35,000,000 |
| මහ බැංකුවට දුන් ණය | | - | 750,000 |
| | | **1,134,474,632** | **1,096,820,125** |
| **N. අතැති සහ බැංකුවේ ඇති මුදල්** | | | |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | සටහන 17 | **1,818,366,416** | **213,989,748** |

**මුල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය**

| | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| **O.ප්‍රවර්ධන සහ අලෙවි බද්ද** | | |
| අපනයනකරුවන්ගෙන් රැස් කර ගත් මුදල (2024 ජනවාරි සිට 2024 අගෝස්තු දක්වා) | - | 212,786,346 |
| ප්‍රවර්ධන කටයුතු සඳහා ලබා දුන් බලපත්‍ර ගාස්තු | 379,452,815 | 154,483,683 |
| ආයෝජන මත පොළිය | 859,701,513 | 1,628,518,470 |
| පොහොර ණය මත පොළිය | - | 9,383,230 |
| ප්‍රවර්ධන අයිතම විකිණීම | 9,100 | 22,900 |
| | **1,239,163,428** | **2,005,194,629** |
| තිලිණ වශයෙන් ලබා දෙන තේ සහ තේ සාම්පල තිලිණ | 3,391,161 | 912,178 |
| සමාජ මාධ්‍යය | - | 54,287 |
| දේශීය ප්‍රවර්ධන වැඩසටහන | 21,033,005 | 9,797,812 |
| සන්නිවේදන ද්‍රව්‍ය සඳහා නිෂ්පාදන පිරිවැය (ATL/BTL) | 2,337,880 | 4,884,419 |
| ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ වෙළඳ සල්පිල් සඳහා සහභාගි වීම | 157,742,603 | 191,329,550 |
| විදේශ සංචාරක | 15,147,768 | 1,631,846 |
| විදේශ සංචාරක වෙළඳ ප්‍රදර්ශන | 3,114,685 | 6,038,562 |
| අවස්ථා | 30,500,026 | 13,144,208 |
| බුද්ධිමය දේපල කටයුතු | 5,061,430 | 8,879,831 |
| විදෙස් කාර්යාල පවත්වා ගැනීම | 34,781,674 | 40,465,758 |
| තේ වර්ග ප්‍රවර්ධනය | 7,246,250 | 7,905,811 |
| වෙළඳපොළ පර්යේෂණ හා වෙනත් වෙළඳපොළ සහායක සේවා | 2,739,901 | 9,020,222 |
| බැංකු ගාස්තු | 29,045 | 39,190 |
| තේ කෞතුකාගාරය සඳහා ප්‍රදාන | 564,999 | 3,000,000 |
| විනිමය වෙනස | 5,710,047 | 7,287,163 |
| ප්‍රවර්ධනමය විනෝදාස්වාදය (විදෙස් නියෝජිතයන් / අවස්ථාවන්) | 268,090 | 1,206,984 |
| විදේශීය දූත මණ්ඩල සඳහා තිලිණ තේ | 2,274,270 | 4,539,233 |
| කුඩා පරිමාණයේ එළිමහන් ප්‍රචාරණ කටයුතු | 15,000,913 | 7,161,978 |
| රට ඇතුළත ප්‍රවර්ධන වැඩසටහන් | 2,631,801 | 6,000,000 |
| විදේශ නියෝජිතයන්ගේ පැමිණීම් | 257,260 | 77,140 |
| තානාපති කාර්යාල සමග වැඩසටහන | 1,855,099 | 6,344,043 |
| මාධ්‍ය ප්‍රකාශනය හා ප්‍රවර්ධනය | 181,425 | - |
| අලෙවි කුටිය | 81,000 | - |
| අසම්භාව්‍යතා | - | 5,482,000 |
| වසරේ වාර්ෂික වතු තේ | 574,427 | 1,018,000 |
| මහජන සම්බන්ධතා වැඩසටහන් | - | 559,892 |
| භාණ්ඩාගාරයට ලබා දුන් මුදල් | - | 1,000,000,000 |
| පොහොර ණය මත පොළිය - බැංකු | - | 3,263,677 |
| සන්නාම ප්‍රවර්ධනය | 127,334,750 | - |
| ITPF | 8,776 | - |
| **මුළු වියදම** | **439,868,285** | **1,340,043,784** |
| පොළී ආදායම මත ගෙවූ බද්ද | 292,723,395 | 451,549,882 |
| සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් ප්‍රවර්ධන හා අලෙවි බදු මුදල් | 1,123,577,432 | |
| සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් මුදල් | 268,198,323 | - |
| | (885,204,005) | 213,600,964 |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| P. සේවක ප්‍රතිලාභ බැඳීම් | | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|---|
| 2024.01.01 ට PV-DBO | | 43,822,236 | 43,699,322 |
| වර්තමාන සේවා පිරිවැය | | 3,782,604 | 2,549,075 |
| පොළී පිරිවැය | | 3,926,472 | 4,662,925 |
| PV - DBO මත සැබෑ (ලැබීම්)/ පාඩු | | 21,504,923 | 10,674,728 |
| වර්ෂය තුළ ගෙවීම් | | (11,953,058) | (17,763,813) |
| 2024.12.31 ට PV-DBO | | 61,083,177 | 43,822,237 |

| Q.ගෙවිය යුතු ආදායම් බදු | SLTB (re.) | P&M LEVY (රු.) | CPC | එකතුව (රු.) |
|---|---|---|---|---|
| 2024.01.01 දිනය ශේෂය | 2,878,774 | 172,139,646 | - | 175,018,420 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | 28,011,247 | 290,246,310 | 75,228,409 | 393,485,965 |
| ඌන: ප්‍රතිපාදන ගෙවීම | (23,965,669) | (403,390,204) | (56,656,760) | (484,012,633) |
| 2024.12.31 දිනට ශේෂය | 6,924,352 | 58,995,752 | 18,571,649 | 84,491,752 |

| R.වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|---|
| වෙළෙඳ ගෙවීම් | සටහන 18.1 | 30,951,367 | 6,309,262 |
| අනෙකුත් ගෙවීම් | සටහන 18.2 | 365,484,563 | 370,153,512 |
| කල් ඇතිව ලැබීම | සටහන 18.3 | 180,167,455 | 153,844,428 |
| උපචිත වියදම් | සටහන 18.4 | 67,125,825 | 65,072,000 |
| වෙනත් ප්‍රතිපාදන | සටහන 18.5 | 241,375,010 | 153,433,734 |
| ඔයිල් සඳහා තේ වැඩසටහන - කල් ඇතිව ලැබීම | සටහන 19 | 3,163,762,989 | 3,732,026,204 |
| | | **4,048,867,209** | **4,480,839,140** |

| S. බැංකු ශේෂ - ලංකා බැංකුව | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| රැස් කිරීමේ ගිණුම - ගාල්ල | 20,100 | 199,675 |
| රත්නපුර | - | - |
| මාතර | - | 76,999 |
| රැස් කිරීමේ ගිණුම - බණ්ඩාරවෙල | - | - |
| රැස් කිරීමේ ගිණුම - නුවරඑළිය | - | - |
| තේ සහනාධාරය | 84,908,030 | - |
| ආයතනික (තේ කොමසාරිස් අංශය) | 69,304,610 | - |
| කොල්ලුපිටිය (දෙවන) | 38,966,434 | - |
| බම්බලපිටිය | 5,638,187 | - |
| ගම්පොළ | 316,789 | 643,355 |
| රැස් කිරීමේ ගිණුම - රත්නපුර | 237,764 | - |
| රැස් කිරීමේ ගිණුම - නුවරඑළිය | 91,231 | 343,430 |
| | **199,483,145** | **1,263,459** |

**දායක ප්‍රාග්ධනය**

2024.12.31 දිනට රුපියල් 672,012,201.85 ක් වූ රජයේ ප්‍රදානවලින් දායක ප්‍රාග්ධනය සකස් වී ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| **1.** බල පත්‍ර ගාස්තු | | |
| වර්ෂය තුළ එකතු කිරීම් | 758,905,630 | 154,483,798 |
| තේ ප්‍රවර්ධනය හා ක්‍රියාකාරකම් සඳහා ලබා දුන් මුදල | 379,452,815 | - |
| | **1,138,358,445** | **154,483,798** |
| **2.**රසායනාගාර ආදායම | | |
| ISO 3720 ප්‍රමිති පරීක්ෂණය | 3,312,850 | 3,107,750 |
| රසායනික විශ්ලේෂණ පරීක්ෂණය | 12,000 | - |
| භෞතික පරීක්ෂණය | 738,650 | 774,500 |
| ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ පරීක්ෂණය | 1,283,500 | 2,611,000 |
| වෙනත් තේ සාම්පල පරීක්ෂණය | - | 15,000 |
| පළිබෝධක අවශේෂ විශ්ලේෂණ පරීක්ෂණය | 37,084,000 | 23,166,000 |
| තත්ත්ව සහතිකය සහ වෙනත් සහතික නිකුත් කිරීම | 12,050 | 4,250 |
| සිංහ ලාංඡන පරීක්ෂණය (රසායනික හා ක්ෂු උජීව විද්‍යාත්මක) | 9,988,000 | 1,911,000 |
| | **52,431,050** | **31,589,500** |
| **3.** ලියාපදිංචි කිරීමේ සහ අලුත් කිරීමේ ආදායම | | |
| වෙළෙඳුන්ගේ බලපත්‍ර ගාස්තු | 8,678,400 | 9,108,350 |
| දඩ | 8,033,203 | 6,840,034 |
| නිෂ්පාදන තැරැව්කරුවන් සඳහා බලපත්‍ර ගාස්තු | 1,750,000 | 1,265,000 |
| ප්‍රතික්ෂේපිත තේ ලියාපදිංචි කිරීමේ ගාස්තු | 1,010,000 | 1,202,500 |
| තේ අපනයනකරුවන් ලියාපදිංචි කිරීම | 957,500 | 1,415,000 |
| තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම | 1,011,000 | 1,345,000 |
| තේ අපනයනකරුවන්ගේ අලුත් කිරීමේ ගාස්තුව | 42,260,000 | 44,097,500 |
| තේ ඇසුරුම්කරුවන් අලුත් කිරීමේ ගාස්තුව | 3,975,000 | 3,895,000 |
| පුද්ගලික විකුණුම් මණ්ඩල තක්සේරුව | 9,461,500 | 7,271,500 |
| සෘජු විකුණුම් සහතික කිරීමේ ගාස්තු | 271,500 | 320,000 |
| තේ ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 58,945,973 | 34,927,124 |
| ආනයන අයදුම්පත් විකිණීම | 22,460 | 14,240 |
| තේ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම | 767,500 | - |
| ගබඩා ලියාපදිංචි කිරීම හා අලුත් කිරීම | 3,335,000 | 2,530,000 |
| තේ නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම | 3,495,000 | 480,000 |
| ප්‍රතික්ෂේපිත තේ මිල දී ගැනීමේ අවසර පත්‍රය | 134,199,283 | 130,969,457 |
| තේ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම | 50,000 | 30,000 |
| බැංකු ඇපකරු නිදහස් කිරීමේ අවසර පත්‍රය | 640,000 | 514,000 |
| තේ සාම්පල රස බැලීමෙන් ලැබෙන ආදායම | 1,023,259 | 878,250 |
| තේ ඇසුරුම්/වෙනත් සම්භවයක් ඇති තේ ලියාපදිංචි කිරීම | 610,640 | 771,100 |
| තේ කර්මාන්තශාලා ලියාපදිංචිය අලුත් කිරීම | 5,790,300 | 4,460,000 |
| තේ ආනයනකරුවන් අලුත් කිරීම | 535,000 | 605,000 |
| දේශීය ඇසුරුම්කරුවන් ලියාපදිංචිය | 804,650 | 790,000 |
| දේශීය ඇසුරුම්කරුවන් අලුත් කිරීම | 908,650 | 731,325 |
| GMP සහතික කිරීමේ ගාස්තුව | 923,500 | 1,250,000 |
| තේ සාම්පල පරීක්ෂණ ගාස්තු | 297,978 | 578,405 |
| ප්‍රමාද සඳහා දඩ (ලියාපදිංචිය හා ක්‍රියාත්මක නොවීම) | 120,000 | 186,000 |
| | **289,877,296** | **256,474,785** |

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
